|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **පරිගනක** | 2,812,000 | | | | | | | 2,812,000.00 | 1,512,000.00 | 4,324,000.00 |
| | **ගම සමඟ පිළිසඳරක්** | | | | | | | | - | 476,675.51 | 476,675.51 |
| | **පළාත්සභා** | | | | | | | | - | 237,581.91 | 237,581.91 |
| | **යන්ත්‍ර** | 86,500 | | | | | | | 86,500.00 | - | 86,500.00 |
| | **ලී බඩු** | 2,604,420 | | | | | 4,088,479 | | 6,692,899.00 | - | 6,692,899.00 |
| | | 6,583,600 | - | 83,707 | 1,539,889.21 | - | 4,223,359 | - | 12,430,555.16 | 8,155,785.46 | 20,586,340.62 |
| | **වෙනත් ගෙවීම්** | | | | | | | | | | |
| | ගබඩා ණයහිමි | | | | | | | | 30,064,594.00 | 65,527,453.18 | 95,592,047.18 |
| | සේවක ණය | | | | | | | | 764,929.00 | 12,915,838.50 | 13,680,767.50 |
| | තැන්පත් ආපසු ගෙවීම් | | | | | | | | 1,242,857.70 | 7,787,105.43 | 9,029,963.13 |
| | ණයහිමි | | | | | | | | 2,296,754.63 | 118,615,612.17 | 120,912,366.80 |
| | අත්තිකාරම් | | | | | | | | 356,500.00 | 5,063,182.26 | 5,419,682.26 |
| | ආදායමින් ආපසු ගෙවීම් - මාර්ග | | | | | | | | 4,500.00 | 36,750.00 | 41,250.00 |
| | ආදායමින් ආපසු ගෙවීම් - ආදාහනාගාර | | | | | | | | 50.00 | 19,500.00 | 19,550.00 |
| | ආදායමින් ආපසු ගෙවීම් - ගලි ඉවත් කිරීම් | | | | | | | | 3,750.00 | 33,750.00 | 37,500.00 |
| | මුද්දර බදු | | | | | | | | | 179,070.60 | 179,070.60 |
| | සමුච්චිත අරමුදල | | | | | | | | 34,000.00 | 206,149.70 | 240,149.70 |
| | VAT | | | | | | | | - | 870,434.01 | 870,434.01 |
| | NBT | | | | | | | | - | 121,883.00 | 121,883.00 |
| උප එකතුව | | - | - | - | - | - | - | - | 34,767,935.33 | 210,384,411.84 | 246,144,664 |
| **මුළු වියදම** | | 16,360,866.93 | 1,800,695.80 | 10,376,117.65 | 27,926,833.55 | 16,198,301.30 | 8,554,724.76 | 7,456,513.58 | 123,441,988.90 | 442,104,697.93 | 566,539,003.84 |

**වෙනත් කරුණු**

**මුදල් කමිටු සමාලෝචනය හා න්‍යායපත්‍රය අතරතුරදී මන්ත්‍රීවරුන් සිදුකළ වෙනත් අදහස් :-**

**(එ) 01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජේ.ආර්.සුමනා ජයසූරිය මහත්මිය :-**

ගරු සභාපතිතුමියනි , පළමුවෙන්ම ඔබ අපේ මහර නුගේගොඩ බටහිර වසමේ රණවිරු මාවතේ ගොඩක් කැඩිලා යන්නම බැරි තත්ත්වයක තිබුණා. පසුගිය මාසේ ඒ කැඩිච්ච සියළුම දේවල් ප්‍රිමික්ස් කරලා හොඳට හදලා දුන්නා.ඒකට සම්බන්ධ වෙච්ච කාර්යමණ්ඩලයටත් , වැඩ අධිකාරි තුමා ඇතුළු සභාපතිතුමියටත් අපේ මහර නුගේගොඩ ගම වෙනුවෙන් ස්තූතිය පුදකර සිටිනවා.ඒ වගේම තමයි සභාපතිතුමියනි , මහර නුගේගොඩ ගනේමුල්ල පාරේ හරක් රැලක් ඉන්නවා නිදැල්ලේ යන. මං මේ ලඟදි බස් එකේ යද්දි බේරෙක් එකක් ගැහුවා ඒ හරක් රැල පාරේ. ගමනාගමනයටත් බාධාවක් . පාරකවත් යන්න බෑ.කාගේ ද කියලවත් දන්නේ නෑ. අයිතිකාරයෙක් නැත්නම් ගොවිපලකටවත් භාර දුන්නනම් හරි.මම ඉල්ලීමක් කරනවා. සභාපතිතුමියනී මහජනයා වෙනුවෙන් .ඒ වගේම සභාපතිතුමියනී මගේ 2022 දී ව්‍යාපෘතියක් කලා මහර නුගේගොඩ කනිෂ්ඨ විද්‍යාලය ඉදිරිපිට නිල්මිණී මහත්මියගේ නිවස ඉදිරිපිට කාණු පද්ධතියක් සම්බන්ධව .ඒ කාණු පද්ධතිය හදලා එක තැනකින් නවත්වලා තියෙනවා වෝට බෝඩ් එකේ වතුර ව්‍යාපෘතියක් තියෙනවා එක නිසා නවත්වලා තියෙනවා.හරි කරදරයි එතන වතුර පිරෙනවා.ඒ නවත්තපු ටික හදලා දුන්නොත් හොඳයි.ඒක අපේ තාක්ෂණික නිලධාරින් බලලා කරලා දෙන්න . කියලා ඉල්ලීමක් කරනවා.ඒ ව්‍යාපෘතියේම තියෙනවා තව පොඩි පාරක් තියෙනවා . වමට යන්න තියෙන්නේ ඒ පාර පහත තියෙන්නේ කාණුව තියෙන්නේ උඩ ඒ නිසා ඒ පාරේ වතුර පිරෙනවා.එකත් පොඩක් බලන්න කියලා ඉල්ලාමක් කරනවා. ස්තූති.

**(එ) 02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ඊ.එන්.අනුෂා දිල්රුක්ෂි මහත්මිය:-**

ගරු සභාපතිතුමිය පසුගිය දින කිහිපය තුල මගේ කොට්ඨාශයේ මාර්ග කිහිපයක්ම ප්‍රතිසංසකරණය තලා.ඒ සම්බන්ධව සභාපතිතුමියටත්, සියළුම නිලධාරින්ටත් සූරියපාළුව උතුර කොට්ඨාශ ජනතාව වෙනුවෙන් මම ස්තූතිය පුද කරනවා. යන්න අපහසුම මාර්ග කිහිපයක් පිළිසකර කර දුන්නේ. ඒ ගෙවල්වල ජනතාව සභාපතිතුමියටත් කතා කරලා ස්තුති කලා. ඒ වගේම සභාපතිතුමිය මැයි මස 09 වන දින සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියාවලදි මේ වෙනකොට මාස 09 ක් වෙනවා මේ 09 වෙනිදට, තාමත් අපි අන්ත අසරණ විදියට තමා අපි ජිවත් වෙන්නේ.අද වෙනකොට සභාපතිතුමියගෙත් මගෙත් දරුවන් උසස් පෙළ විභාගයට පෙනි සිටිනවා. අදත් ඒ අය ගියා. උදේටත් අඩාගෙන යනවා. හවසටත් අඩාගෙන තමයි එන්නේ අපේ දරුවන්.ඒ නිහිපදෙනෙක් කරපු ප්‍රචණ්ඩකාරි තත්ත්වය විශාල ලෙස මානසිකව බලපාලා තියෙන්නේ. ඉතින් අපි අන්ත අසරණ තත්ත්වයකට පත් වෙලා දැන් ඉන්නේ.මගේ ගෙදර සමාජිකයින් 07 දෙනෙක් ජීවත් වෙනවා.කිසිම දෙයක් කරකියා ගන්න බැරුව තමයි ඉන්නේ.අද මගේ දරුවාට උදේ කොණ්ඩය පීර ගන්න බෑ. "මට කණ්නාඩියක් ගෙනත් දෙන්නකෝ තාත්තේ " හැමදාම ඔළුව වැරදි පැත්තට බෙදාගෙන පිර ගෙන යන්නේ කිව්වාම මං අර කඩලා තියෙන අල්මාරියේ කණ්ණාඩි කෑල්ලක් ගෙනත් දීලා දරුවට කිව්වා මේක බලන් කොණ්ඩේ පීර ගන්න කියලා ඒ වගේ තත්ත්වයක තමයි අපි ජීවත් වෙන්නේ. ඉතින් මෙහෙම ඉන්න අවස්ථාවේ අපේ ගරු සුමනා මන්ත්‍රී තුමිය මැදිහත් වෙලා අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් විතාරණ මන්ත්‍රී තුමාත් , අපේ ගරු සභාපතිතුමිය ඇතුළු උපසභාපතිතුමිය මන්ත්‍රී මණ්ඩලය එකතු වෙලා අපේ ගරු ස්වාමින් වහන්සේලා දෙනමත් සහයෝගයෙන් මගේ ව්‍යාපාර ස්ථානය කඩය හදලා දෙනවා. මේ වෙනකොට සැහෙන බිත්ති උඩට බැඳලා තියෙනවා. මේ අවස්ථාවේ දී සුමන මන්ත්‍රී තුමාගේ කොට්ඨාශයේ ආනන්ද මහත්තයා කියලා කෙනෙක් ඉන්නවා ඒ මහත්මා සතපහක් ගන්නේ නැතුව මේක ඉවර වෙනකම්ම අපි කරලා දෙනවයි කියලා තව කට්ටියක් එකතු කරගෙන හැමදාම ඇවිල්ලා සැහෙන වැඩ කොටසක් කරලා තියෙනවා. ඉතිං මිහිපිට ඉන්න දෙවියෝ කියලා මමත් මගේ දරුවෝ හිතන්නේ අපි පුදුම විදියට පිං දෙනවා. ඒ ටික තමයි මට කියන්න තියෙන්නේ හැමෝටම ස්තූති.

**(එ) 03 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩී.ලාල් මහතා:-**

ගරු සභාපතිතුමිය පුංචි ස්තූති කිරිමක් තියෙනවා , පසුගිය වකවානුව තුල අපේ කොට්ඨාශයේ ගොනහේන කෙසෙල්වත්ත ප්‍රදේශයේ පළමුවන පටුමහ ප්‍රධාන මාර්ගය ගොඩක් අබලන් වෙලා යන්න බැරුව තිබුණා.පසුගිය සතියක ඔබතුමිය සහයෝගයෙන් සහ කාර්යභාර නිලධාරිතුමා ඇතුළු වැඩ අධිකාරිතුමා සහ එම කාර්යමණ්ඩලය එකතු වෙලා ඒ මාර්ගය ප්‍රිමික්ස් කරලා දුන්නා ඒකට මගේ ගෞරවපූරක ස්තුතිය පුදකර සිටිනවා අපේ ප්‍රදේශවාසීන් වෙනුවෙන් .ඒ එක්කම තමයි වෙන්දේසි වතුවල තියෙන අපවිත්‍ර ජලය කුඹුරු වලට බස්සන එක දිගින් දිගටම කිව්වා.අපේ කුඹුරකුත් තියෙනවා ඒ කුඹුරටත් අපවිත්‍ර ජලය එනවා මා දිගින් දිගටම කිව්වා හරියන් නෑ. එකට යම් කිසි නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්න කියලා කියනවා.ඒ එක්කම තමයි මට අයිති නැති වුනත් මගේ කොට්ඨාශය නොවුණාට සායනය

ගොංගිතොට සම්බන්ධීකරණ කමිටුවේදි වතුර බිල ප්‍රශ්නය ගැන. අපේ MOH වෛද්‍ය නිලධාරිතුමා ඩෙංගු මර්දනයට ආපු වේලාවේ ඒ වේලාවේදි සඳහන් කලා වතුර බිල ගෙවලා නෑ කියලා මට මතක් කරන්න කිව්වා.ස්තූති.

**(එ) 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි අනුලා නිර්මලානි විලේගොඩ මහත්මිය:-**

ගරු සභාපතිතුමිය අද අපි ලොකු වෙනසක් දැක්කා. අලුත් ලේකම්තුමියගේ වැඩක් වෙන්න ඕනේ.ෆයිල් එකක් තියලා තියෙනවා අපිට .බොහෝම ස්තූති ඒ වෙනසට, ගරු සභාපතිතුමිය 1 වෙනිදා අපේ TO මහත්තයා ඇවිල්ලා වසම් 03 නේම කල යුතු වැඩකොටසකට වැඩ කටයුතු කලා.ඒ ගැන මං ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම අපේ කාර්යභාර නිලධාරි උදයන්ත මහත්තයා අනු දැනුම ඇතිව ලයිට් දැම්මා. ඒත් තව කිහිපයක් තියෙනවා.ඒකටත් ස්තූතිවන්ත වෙනවා.ඒ ඉතුරු ටිටත් ඉක්මනටම මොකද දැම්ම කට්ටිය දැම්මා කිව්වාහම නොදැම්ම කට්ටිය ප්‍රශ්න ඇති කරගන්නවා.බොහෝම ස්තූති.

**(එ) 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී.ශ්‍රී ශාන්ත චන්ද්‍රලාල් වික්‍රමසිංහ මහතා:-**

ගරු සභාපතිතුමිය ඉල්ලීම් කිහිපයක් තියෙනවා.මොකද ප්‍රාදේශිය සභාවේ ඒහා පැත්තේ උදාර මාවත ඒහා පැත්තේ ඒකේ යන්නම බෑ.මට එක පුළුවන් විදිහටම ඉක්මනට කරලා දෙන්න සභාපතිතුමිය.මොකද බයිපාස් ඒකක් විදිහට පාවචාවි කරනවා මැදදි මොනවාහරි කරදරයක් වුණොත් ඒ පාර වැස්සට කඩන් ගිහිල්ලා ඔක්කොම ටික. මම ඉල්ලිමක් කලා මෝටර්ග්‍රේටරය සහ ඒක්කො බැකෝ ඒක දාලා පාර සුද්ධකර ගන්න.තෙල් නැහැයි කියනවා ෂෙඩ් ඒකේ.ඉල්ලීම් කලාහම පොඩ්ඩක් ඒක බලලා කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.ස්තූතියි.

<u>(එ) 06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ටී.නිමල්සිරි මහතා:-</u>

ගරු සභාපතිතුමිය ප්‍රශ්න වගයක් තියෙනවා කතා කරන්න මොකද දැන් අපි මොටර්ග්‍රේටර් ඒක ඉල්ලලා තිබුණා අවස්ථා කිහිපයක් එක අවස්ථාවක් ලබා දුන්නා.ඒ පිළිබඳව ස්තූතිය පුද කර සිටිනවා. එදාම වැස්ස පටන් ගත්තා ගෙන්නගෙන වැඩේ කර ගන්න අමාරුවුණා. ඒනිසා අපට තව අවස්ථාවක් ලබාදෙන්න පාරවල් දෙකක් තියෙනවා ග්‍රාමසේවා කාර්යාල පාරයි ,අහුගම්මන පන්සල ඉස්සරහා පාර ඒ දෙක කරගන්න ඕනේ .යන්නම බෑ.ඒ වගේම තමයි අහුගම්මන ප්‍රජා ශාලාව ඉදිරියෙදි මැතිවරණ කාලය ඒන්නේ විදුලිය නෑ ඒක මට කොහොම හරි ඉක්මනටම කෙරෙන්න ඕන ඉදිරියේදි වැඩ කිහිපයක් සමෘද්ධි කාර්යාලයත් තියෙන නිසා වැඩ කරන්න අපහසුයි.ඒකට මුදල් ටිකක් වෙන්කරලා කොහොම හරි කරලා දෙන්න. ඒ වගේම ඉත්තෑගල පාර ප්‍රිමික්ස්කරලා දෙන්න කොහොම හරි නැත්තම් ලොකු ප්‍රශ්නෙක ඉන්නේ.අපේ ර්වා මන්ත්‍රිතුමිය කියපු පාලම ඒතැන කැඩිලා තියෙන්නේ ගිලා බැහැලා ඒක හදන්නේ නැත්තම් පවුල් ඒකසිය ගානක් අනාත වෙනවා.අර එහා පැත්තේ පැති බැම්ම හැදුවා පාර කැඩේන හින්දා ඉතිං දැන් හැම තැනින්ම කොටු වෙනවා පාර.ඒ ටික ඇත්තටම කෙරේන්න ඔන වැඩ ටිකක් නැත්තම් විශාල ප්‍රශ්න ගොඩකට මුහුණ දෙන්න වෙනවා.සමුපකාර පාරේත් පොඩි පැච් වගයක් තියෙනවා ඒ ටිකත් කරලා දෙන්න කියලා ඉල්ලිමක් ඉල්ලනවා.ස්තූති

**(එ) 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එස්.එරන්දි උදයංගිකා දිසානායක මහත්මිය:-**

ගරු සභාපතිතුමිය,ගිය සිකුරදා දින ඔබතුමිය අමතලා මම හියුම් පයිප්ප 05ක් ඉල්ලීමක් කලා.මොකද සෙනසුරාදා ඉරිදා දින ශ්‍රමදානයක් මඟින් ඒ පාරේ ජනතාව ඒ කාර්යය ඉටුකර ගන්න බව මම ඒය ඉතා ඉක්මනින් මට එම කාර්යය කර ගන්න හියුම් පයිප්ප ලබා දිම පිළිබඳව මම ඔබතුමියටත් වැඩ අධිකාරිතුමාටත් නාරංවල ටීඕ මහත්තයාටත් විශේෂයෙන් අපේ කැලුම් මහත්තයාටත් කොට්ඨාශ බාර මහජන නියෝජිතවරිය වශයෙන් ගෞරව පුරක ස්තූතිය පිරිනමනවා.ඉක්මනින් ක්‍රියාකරලා මට ඒ දේ කරලා දුන්නු නිසා දැන් ඒ මාර්ගයේ ගමන් කරන ජනතාව ඉතා අලංකාර විදිහට දාගෙන මාර්ගය පාවිච්චි කරනවා.ඒ වෙනුවෙන් නැවත වතාවක් මගේ ස්තූතිය පුද කරනවා.

**(එ) 08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්.සිරිමල් ශාන්ත කුමාර මහතා:-**

ගරු සභාපතිතුමියනි,මා විශේෂ ස්තූතියක් කරනවා මේ අවස්ථාවේදි.මාගේ නැන්දම්මාගේ අවමංගල්‍යය වුණු මොහොතේදී ගරු සභාපතිතුමිය හා උප සභාපතිතුමාගේ මැදිහත් විම මත සභාවේ කැනපි, පුටු ,ලයිට්,ආදිය ලබා දීමේදී ඌරුවල් පේරුව උප කාර්යාලයේ කාර්යභාරතුමා ඇතුලු සියලුම දෙනාටම මාගේ ස්තූතිය පුද කර සිටිනවා.ඒත් ඒක්කම සභාපතිතුමනි අපේ ගෙවල් මාර්ගය මං ඉල්ලීමක් කලා එකත් පෙරමුසු යොදා ගිය සතියේ හදලා දුන්නා ඒකටත් ඔබතුමිය ඇතුලු කාර්යභාර නිලධාරිතුමාටත් ස්තූතිවන්ත වෙනවා.ඒ එක්කම සභාපතිතුමනි මතක් කරන්න ඔනේ ඔබතුමියගේ අත්සනින් යුතුව කිරිකිත්ත වලව්වත්ත මස් කඩේ එක ඔබතුමියගේ කොන්දේසි පනවලා ඒ කොන්දේසි වලට ක්‍රියාත්මක නොවි ඒ මස් වෙලදාම කරන් යනවා. ඔබතුමිය දන්නවා පෞද්ගලික පංතියක් පවත්වාගෙන යනවා ලමයි දහස් ගානක් යනවා ඒ මස් කඩේ වහන්න කියලා කියලා නෙමෙයි ඉල්ලිමක් කරන්නේ. ඉස්සරහ ටින්ටට් කරලා වහලා දෙන්න කියලා.බලපත්‍ර ලබා නොදුන්න නම් ඔබතුමියට බලය තියෙනවා පනත අනුව මස් කඩ වසා දැම්මටත්.සභාව හැල්ලුවට පත්වෙනවා ඔබතුමියගේ අණක් ක්‍රියාත්මක නොකරනව නම්.අපිට පොඩි සැකයක් තියෙනවා කවුද ඔබතුමියගේ අණ

පිලිපදින්නේ නැතුව ඒක්කො නිලධාරියෝ ක්‍රියාත්මක කරනවාද නැත්තම් ඒ මනුස්සයා බලහත්කාරකමින් කරගෙන යනවද ප්‍රශ්නයක් ඇතිවෙනවා. ඔබතුමිය ඒ පිලිබඳව අවධානය යොමු කරන්න.අනිත් එක අනතුරුදායික කොස් ගහ සම්බන්දව එක ඇවිල්ලා ඇටිකෙහෙල්ගල්ලේ ඒවා ක්‍රියාත්මක වෙන ප්‍රමුකතාවය අඩුයි. අර වරිපනම් එකතු කරන්න ගිය මොහොතෙත් ඒ අය දැනුවත් කරලා තිබ්බා අපේ නිලධාරින්ට ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන්න.ඔබතුමියගෙන් අත්සනින් යුතුව ලිපියක් යවනවා.තෙවන ලියුමත් ඇවිත් ක්‍රියාත්මක වෙන්නැ එතකොට හිතන්නේ අපි මේ බොරු වැඩක් කරනවයි කියලා.ශිරන්ත මන්ත්‍රිතුමාටත් දැනුවත් කරලා තියෙනවා.ඒ නිසා ඒ පිලිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරමින් මගේ කතාව අවසන් කරනවා.ස්තුති

(එ) 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.කීර්ති විජේසුන්දර මහතා:-

ගරු සභාපතිතුමිය පූර්ව සභාවාරෙක මතක් කල කාරණාවක් නැවත මතක් කර සිටිනවා.අර අපේ වසමේ මේ දින වල මාතෘ සායනය ඉදි වෙමින් පවතිනවා ඒ මාතෘ සායනයට අවහිර වෙන ආකාරයට තෙක්ක ගසක් තියෙනවා අපේ පුස්ප්කාල භූමියේ. ඒ ගස ඉවත් කරලා දෙන්න කියලා ඉදිකිරීම් කරන නිලධාරිතුමා මගෙන් ඉල්ලීමක් කලා.ඒ වගේම ඔබතුමියට සඳහන් කලා මතක ඇති.අර පුස්ප්කාල භූමිය තුල තියෙන කොට්ටන් ගස.ඒ කොට්ටන් ගස ඉවත් කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමිය තාම කිසිවක් වෙලා නෑ.ඒ ගස් දෙකම ආයතන දෙකටම බාධාවක් වෙලා තියෙනවා.ඉතිං මං නැවත ඉල්ලීමක් කරනවා.ඒ ගස් දෙක ඉවත් කරන්න ක්‍රම කටයුතු සම්පාදනය කරන්න කියලා ඒ වගේම සභාපතිතුමිය සිරිමල් මන්ත්‍රිතුමා කිව්වා වගේ අපි ඔබතුමියගේ අණකින් නිකුත් කරන ලිපි වලට යම් යම් ප්‍රතිචාර අපේ සභාවතුලින් දැක්වෙන්නේ නැති බව අපි කනගාටුවෙන් කියන්න ඒනේ. විශේෂයෙන්ම අධිකරණ නියෝග මත කඩා බිඳ දමන දේවල් අද වෙනතුරු කඩා බිඳ දමලා නෑ.ලියුම ඔබතුමියගේ අණින් නිකුත් වෙනවා ගස කපා ඉවත් කරගන්න කියලා නමුත් මේ නිලධාරින් ගස කපන්නේ නැතිව අතු කපනවා.ඒත කොට අවසානේ ලියුමත් යවලා කැපුම් කරු ගෙනල්ලා සියලු කටයුතු කලාට පස්සේත් ඒ සියලු දේවල් වෙනස් වෙනවා. අන්තිමට වෙන්නේ සභාවේ ඉන්න ඔබතුමියටත් ගමේ ඉන්න අපිටත් ලොකු ගැටලුවක් වෙනවා. .ඉතිං ඒ නිසා මං බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධයෙන් ඉතා තදින් හොයලා බලන්න ඒ සම්බන්ධව අවශ්‍යය නිසි පිළිතුරු ගන්න කියලා ඉල්ලීමක් කරනවා .ස්තුති

(එ) 10. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එම්.සයිෆුල් හාරිස් මහතා :-

ගරු සභාපතිතුමියනි,ඔබතුමියට පොඩි ස්තුතියක් කරන්න තියෙනවා.ජනවාරි මාසේ ඒඩෙරමුල්ල කතොලික දේවස්ථානයේ වාර්ෂික මංගල්‍ය වෙනුවෙන් අපේ මන්ත්‍රී මණ්ඩලය ශ්‍රමදානයක් කලා ඊලඟ ඉතුරු අදියරය සඳහා මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කලා බැකො යන්ත්‍රය සහ මොටර්ග්‍රේඩරය ලබාදෙන්න කියලා රථ ගාල සකස් කරගැනිම සඳහා. ඔබතුමිය ඒය ලබාදීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කර සිටිනවා.ඒ වගේම 2021ක වසරේ සිට මම අර ඉල්ලීමක් කලා අක්බාර්ටවුම සහ රෝස්විලා ගාර්ඩින් පල්ලිය පාර ඉතාමත් අබලන් තත්වේ තිබ්බේ.ඒම මාර්ග දෙක සකස් කර දිම පිළිබඳවත් ඔබතුමියටත් වැඩඅධිකාරිතුමාටත් ඒම වැඩේ සාර්තකව කරලා දුන්නට සභාවේ සේවක මහත්තුරුන්ටත් මගේ ස්තුතිය පිරිනමනවා මේඅවස්ථාවේ. මොකද වසර ගනනාවක් යන්න බැරිව අබලන් වෙලා තිබුණු මාර්ග දෙක ඒ හින්දා සකස් කිරිම ඉතා වටින කාර්යයක්.ඒ වගේම සභාපතිතුමියනි මම දිගින් දිගටම ඉල්ලීමක් කලා අපේ ඇල මාර්ගය සම්බන්ධයෙන් ඉල්ලීමක් කලා ඒ ඇල මාර්ගය ඉතාමත් කැලය වැවිලා තියෙන්නේ වසර ගනණාවක් තිස්සේ අපිට පිලිසකර කරගන්න වුනේ නෑ.ඒක වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා හරි දැනුවත් කරලා ඒක පොඩ්ඩක් සුද්ධ කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා .ඒ වගේම ඒකේ කිඹුලේකුත් සැරි සරනවා.ඒ වගේම සභාපතිතුමනි ගමෙන් ඉල්ලීමක් තියෙනවා. හැම සතියෙම ඒල්ලේ ක්‍රීඩා කරනවා අපි පස්දාලා වට කරපු ඒකේ අර වල් පැල වගයක් බිහිවෙලා දැන් බැකො දාලා කරා කරාට ඒ මුල් ගලව ගන්න බෑ.ඒ බැකො යන්ත්‍රය අමාරුයි කියපු ඒක තමයි කිව්වේ.මැෂින් දාලා හරි ක්‍රීඩා පිටිය පොඩ්ඩක් සකස්කරලා දෙන්න.මොකද ඒ ක්‍රිඩාව නවත්තනවයි කියන්නේ වෙන වෙන අනිසි මාර්ග වලට යනවා.අනිවාර්යෙන් ඒල්ලේ සෙල්ලම් කරනවාමයි කට්ටිය.දැන් දැන් ඒක නැති වුණු ඒකේ මත්ද්‍රවය වලට තරුණයෝ ඇබ්බැහි වීමේ සීග්‍රතාවක් තියෙනවා. ගමේනුත් ඉල්ලීම කලා ඉක්මනට කොහොම හරි ඉක්මනට සකස් කරලා සෙල්ලම් කරන්න අවශ්‍යය විදිහට සකස්කරලා දෙන්න කියලා මං ඔබතුමියගෙන් ඉල්ලා සිටින්නේ මේක කොහොමහරි කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා මේ ගැන අමිත් මන්ත්‍රිතුමාත් කිව්වා.ස්තුති

**(එ) 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.මහින්ද මහතා:-**

ගරු සභාපතිතුමියනි,මට පුංචි කාරනයක් සඳහන් කරන්න තියෙනවා.අපේ සුවතා මං තිරුව ඇල්දෙනිය.ගහලා තියෙනවා දැන්වීම් පුවරුවක් ගහලා තියෙනවා ඡයාරූප ගත කිරිම,රූපගත කිරිම, අලෙවි ප්‍රවර්ධන කටයුතු කිරිම හා වෙනත් රංඟකටයුතු.ඉඩම් සංවර්ධන ගොඩ කිරිම් ඒකේන් තමයි ගහලා තියෙන්නේ. මේක අපිට අයිති දේපලක් ද කියලා මට දැන ගන්නත් ඔනේ අනිත් ඒක මේකේ මුදල් අයකිරිමක් කරනවානම් සභාවට දැනුම් දිලා තියෙනවද කියලා දැන ගන්න ඔනේ.ඒ තැන ජීම් ඒකක් තියෙනවා ඒකේ ඇත්තටම ක්‍රිඩා උපකරණ කැඩිලා.දැන් ඒතැනත් ලොකු ප්‍රශ්නයක් ගොඩ නැගෙනවා සමහරු මුදල් කතු කරලා ප්‍රතිසංස්කරණය කරන්න කැමති.සමහරු

විරුද්ධයි දැන් ඔය දෙගොල්ලො අතර ගැටුමකුත් තියෙනවා . ඔය අතර මත ගැටුම් කිහිපයක් තියෙනවා පකෂ විපකෂව.ඉතිං මේක ඇත්තටම සභාව සතු දේපලක් නම් පවරා දිමක් තියෙනවානම් අපි මැදිහත් වෙලා ක්‍රීඩා උපකරණ ලබාදිය යුතුයි කියලා මම කියන්නේ.මොකද හේතුව නිරොගිමත් ජාතියක් ගොඩ නහන්න ක්‍රිඩාව අත්‍යාවශ්‍යයි.ඒකට යොමු වෙලා ඉන්න තරුණ තරුණියන්ට ඒ අවශය ප්‍රතිපාදන අරන් දීම අපේ වගකිමක්. අනිත් ඒක නිරොගිමත් ජාතියක් සඳහා ඒ වගේ ආයෝජනයක් කෙටිකාලිනව හා දිර්ඝකාලිනව හරි වටිනවා.ඒ ගැන පොඩ්ඩක් හොයා බලන්න කියලා ඉල්ලිමක් කරනවා.ඒ වගේම අපේ අලුත් ලේකම්තුමියක් පැමිණිලා ඉන්නවා ඒතුමියට අපේ සුභාෂිංශන පිරිනමනවා.අපේ ප්‍රදේශයේ සිටින මදුරප්පේරුම මන්ත්‍රිතුමා මේතෙක් කලක් අපි ඔන දෙයක් කිව්වාහම ලයිට් ඒකක් ගැන කිව්වත් අපිට ඒකට සහයෝගය දැක්කුවා.ඒතුමාටත් ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම පොඩි ප්‍රශ්නයක් තියෙනවා.මම අපේ නිලධාරිවරයාට කියලා ලයිට් වගයක් හැදුවා ඒ හැදුවාට ලයිට් තුන හතරක් හදල නෑ.මම ඒක අපේ නිලධාරි මහත්තයෙකුටත් දැනුම් දුන්නා.ඒ කිව්වට පස්සේ මන්ත්‍රිතුමාට දැනුම් දෙන්න කියලා.මම කණගාටු වෙනවා නිලධාරි මහත්තයා මන්ත්‍රිතුමාට කියන්න කිව්වාහම.ඒහෙම කියන ඒක හරි නෑ. මටත් ප්‍රශ්නයක් ආවා පොඩි. මෙතෙක් කලක් එහෙම දෙයක් වුනේත් නෑ.ඒ සමහරක් විට අතපසුවිමක් වෙන් ඇති.මේ ගැන සොයා බලන්න.මම නිහඬවෙනවා බොහොම ස්තුති.

**(එ) 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.එම්.ඩී.රොහාන් රොයිස් මහතා:-**

ගරු සභාපතිතුමිය, මම ඔබතුමියගේන් ඉල්ලීම් දෙකක් කලා මම හැමදාම අවුරුදු 05 ක් තිස්සේ කලා එක කෙරුන් නැති හින්දා ඔබතුමියගෙන් එක දෙයක් ඉල්ලනවා අඩුම ගානේ පෞද්ගලිකව හරි අර කාණුව හදන්න මට පුළුවන්.ඒහෙම කරන්න අඩුම අනුමැතිය දීලා ලියුමක් හරි අරන් දෙන්න. මොකද මට මේක R.D එකෙන් මට අරන් දෙන්න බලන්න.නෑ නෑ ඔබතුමියට කිව්වා ඔබතුමිය ලියුම් ඇරලත් තියෙනවා මට එකේ පිටපතකුත් එවලා තියෙනවා. එක තමයි. R.D එක ගෙන්නන්න තියෙන්නෙ මෙතැන්ට සභාපතිතුමිය, මොකද මහජනතාවගේ ඉල්ලීම ඉඩක් නෑ. පාරේ මනුස්සයන්ට අයින් වෙන්ඩ වෙන්නේ කාණුවට.ඒතන ඒක්කෙනෙක් මැරුණනේ. පල්ලියේ ෆාදර් විරුද්ධ වුණා එතැන භූමියෙන් කපලා පාරට දෙන්න ගියහම.මේකට මොකක් හෝ දෙයක් කර ගන්න ඕනේ. සිරිනිමල් මන්ත්‍රිතුමාත් ඉන්න තැන මං මේක කතා කලා. එතුමත් දන්නවා රේල් ගේට්ටුවේ මැෂින් 02 ක හයිකරලා තියෙනවා ඕකට දැන්නම් එකයි තියෙන්නේ එකක් ගලවගෙන ගිහිල්ලා. මේකේ මහමාර්ග නියෝජ්‍ය ඇමති කෙනෙකුත් ඉන්දැද්දි මේක කර ගන්න බැරිව ගියා. මේවැනි දෙයක් ගේට්ටුවේ හයි කරලා තියේද්දිද් මං හරි කරන්ට් එක දෙනවා. ලී කැලි දෙක හයිකරලා ගේට්ටුව ක්‍රියා කරවන්න තිබුණේ. සභාව කවදා ඉවර වෙයිද කියලා අපි දන්නේ නෑ. මැතිවරණයක් තියයිද තාම විසුරුවලත් නෑ. අපි ඉදිද තාම මොකක්වත් දන්නේ නෑ අපේ සමාජිකත්වය අහෝසි කරලා ඉතිං අපි දැන් එත් ඉන්නවා 09 වෙනිදා ඡන්දේ තිබ්බොත් හොඳයි අපි කැමති තියෙනවාට. අපේ එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා කැමති නැති එකයි තියෙන්නේ මෙතැන. පොදු ජන පෙරමුණේ අයත් කැමති අපි සමඟි ජන බලවේගයට නාම යෝජනා භාර දීලා තියෙන්නේ. අවලංගුකලත් තිබ්බත් ප්‍රශ්නයක් නෑ. තරහයක් තියෙනවා තරහයක් කරලා බලමු අපි ලැස්තියි. ඔන වේලාවක මැතිවරණයක් තියන්න. මේ කාල සිමාව තුල මට අවශ්‍යය දේ කරලා දෙන්න කියලයි මං ඉල්ලන්නේ. ගරු සභාපතිතුමියට මේ ගැන බලකිරිමක් කරන්න පුළුවන්. මම ඔබතුමියගෙන් පොඩි ඉල්ලිමක් කලා පල්ලියේ මංගල්‍යය තිබ්බා එකට ලයිට් ටික හදලා දෙන්න කියලා පල්ලිය වටේ තිබ්බ ලයිට් ටික හදලා තිබුණා ඔබතුමියටත් ඒ වගේම අමල් මහත්තයටත් ස්තුතිවන්ත වෙනවා. නමුත් තව අඩුපාඩු තියෙනවා මට තව දවස් දෙක තුනක් ඒ ටික කරගන්න එවන්න මොකද ඉදිරියේදි ඡන්දයක්වත් තිබ්බොත් එහෙම අවුරුදුපහක් තිස්සේ ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් සේවයේ සිටියට බල්බ් එකක්වත් දාලා නැත්තම් තේරුමක් නෑ.ඒක අපේ වරදක් නෙමේයි ඒක ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් වුණේ පහු ගිය කාලේ.හැබැයි මේ මම නම් සභාපතිතුමියට කිව්වා.මම ආරාධනා කලා ඔබතුමියටත් මේතුමියටත් හැබැයි ඒත් ආවේ නෑ.

**ගරු සභාපතිතුමිය ඒ.ඒ.සුදීමා චාන්දනි මහත්මිය:-**

අවුරුදු 05 ක් තිස්සේ මුකුත් කලේ නෑ ගාන්නේ.ගම්පෙරලිය කෝටි ගණන් වැඩකලා.ගම්පහ දිස්ත්‍රිකයේ හොඳම ප්‍රාදේශිය සභාව මහර.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.එම්.ඩී.රොහාන් රොයිස් මහතා:-**

දේශපාලනය කියන්නේ සදා මිතුරො හතුරො නෑ.රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති.මේ මන්ත්‍රිගොල්ලන් සමඟි ජන බලවේගයේ හිටියත් මොකේ හිටියත් හැමදාම ඉන්න මන්ත්‍රිවරු මාත් ඒක්ක හිටියා.මගේ සහෝදරයෝ වගේ මට උදව් කලා.ඒක හින්දා හැම දෙනාටම සුභ පතනවා මම.ඒ කරපු දේට මම ස්තුති වන්ත වෙනවා.මොකද අපි දන්නේ නෑ 09 වෙනිදා ඡන්දේ තියයිද කියලා.මැතිවරණයක් තියලා කවුරු බලයට පත්වුණත් අපි හැමොම සුහදව ඒදා වගේම හැමදාමත් ඒ විදිහට කටයුතු කරමු. ඉතිං මට ඇත්තටම ලොකු ඉල්ලිම් කරන්න නෑ.පොඩ්ඩක් ආණුඩුකාරතුමාට කියලා බලලා මගේ වැඩේ කරලා දෙන්න ඔබතුමිය.අවශයම දෙකක් තමයි ඔය කිව්වෙ.ඒ දෙකෙන් ඒකක් කරලා දෙන්නකො රේල් ගේට්ටුව ඒක මැෂින් එකක් තියෙනවා.කුඩුතාරයෝ නෙමේයි නේ...සිජීආර් ඒකම වෙන්න ඇති අනික ගලවන්න ඇත්තේ.ඔබතුමාත් දන්නවානේ.අපි හැමෝම ඔතනින් යනවා.අපේ ජිවත වුණත් අවදානම් අර බෙල් ඒක වැදෙන ඒක ඇහෙන්

නෑ.ඒතන අවධානම්.අපි කාපට් කලාට පස්සේ ඉතුරු ටික මේතුමා කාපට් කලා.ඉතිං ඔය මාර්ගයේ ගොඩාක් අය පහසුවට පාවාච්චි කරනවා.අනිත් එක හයිවේ ඒකට ඔතනින් තමයි ගොඩාක්ම වාහන යන්නේ.කානුවටනම් ඔබතුමිය ලියුමක් ගහලා මට එකේ පිටපතක් ලැබුණා.මම දන්නේ නෑ මේ රේල් ගේට්ටුව සම්බන්ධව දැම්මද කියලා මම දන්නේ නෑ ඔබතුමිය.මට ඒක කොහොම හරි ඉෂ්ඨ කරලා දෙන්න.හැම කෙනෙක්ම ජයක්ග්‍රහණය කරන්න තමයි කටයුතු කරන්නේ.ඔබතුමියත් මමත්.මට මේ පාර මගේ සභයත් ඒක්ක තමයි සටන් කරන්න වේලා තියෙන්නේ.කොහොම හරි මැතිවරණය තියන්න කියන්න.මම නිහඬ වෙනවා.

**<u>(එ) 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජයන්ති හෙට්ටිආරච්චි මහත්මිය:-</u>**

ගරු සභාපතිතුමිය,මට කතා කරන්න ඔනේ .මම උත්තර දෙන්නත් ඒපැයි මට කතා කරද්දි.එක්සත් ජාතික පකෂයේ නායනයා ගැන කතා කරනවා මේතුමා.ඉතිං ඒතුමාගේ නායකයත් රටේ ජනාධිපති තමයි.මොකද මේතුමා අත්සන් කලේත් ඒක්ස්ත් ජාතික පකෂයේ කියලානේ.ඒතකොට ඒක්සත් ජාතික පකෂයේ නායකයා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා තමයි.ඉතිං අපේ හැමොගේම නායකයත් රටේ නායකයත් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා.ඒතුමා එතකොට මැතිවරන කොමසාරිස්තුමාත් නෙමේයි. මැතිවරණ කොමිසමේ ඉන්න නිලධාරින් 05 දෙනා අතර එක්කෙනෙකුත් නෙමේයි.මැතිවරණ කොමසාරිස්තුමාටයි, ඒ කොමිසමේ ඉන්න නිලධාරින්ටයි තමයි බලය තියෙන්නේ ඡන්දේ තියෙනවාද නැද්ද කියලා තිරන ගන්න.රටේ තිබුණු තත්ත්වේ ඒක්ක,ෂෙඩ් වල පොලිම් වල දවස් ගනන් බත් මුල් බැඳගෙන මිනිස්සු.පොලිම් වල මිනිස්සු මැරෙද්දි.බඩු මිල ගනන් ගිය වේලාවේ ඒතුමා රට භාරගෙන පුලු පුලුවන් විදිහට බඩු මිල අඩු කරගෙනත් යනවා.ඒතුමා කෙලින්ම කිව්වා මම මේ රටේ ප්‍රාදේශිය සභා මැතිවරණයට මැදිහත් වෙනනේ නෑ කියලා.ඒක්සත් ජාති පකෂයේ කෘත්‍යාදි කාර්යමණ්ඩලයට කිව්වා ඔබතුමාලා මේක කරගෙන යන්න.මම මේ පලාත් පාලන ඡන්දේට කිසිම මැදිහත් විමක් පකෂයෙන් කරන්නේ නෑ කියලා.හැබැයි ඒතුමා කිව්වා මැතිවරනයකට ලැස්ති වෙන්න කියලා.ඔබතුමාට උදව් කරපු ගුරුතුමියක් හිටියා ස්වර්ණා කියලා අද අපේ ලැයිස්තුවේන් අත්සන් කරලා තියෙන්නේ.සමගි ජන බලවේගයේ ඒක මන්ත්‍රිතුමෙක් මේතැන නෑ.ඉන්නේ ඒක්ස්ත ජාතික පකෂයෙන් ආපු අය විතරයි.ඒපමනයි මට කතා කරන්න තියෙන්නේ.ස්තුති.

**<u>(එ) 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.සී.සමන්කුල මහතා:-</u>**

ගරු සභාපතිතුමිය,මම පලමුවෙන්ම අපේ ප්‍රාදේශිය සභාවේ අභිනවයෙන් පත් වේච්ච අපේ ලේකම්තුමියට සුභ ප්‍රාර්ථනා කරනවා.ඒතුමියට අපේ ගරු සභාපතිතුමියත් මන්ත්‍රිමණ්ඩලයත් සමඟින් ඒ වගේම නිලධාරි මණ්ඩලයත් සමඟින් මේ ප්‍රාදේශිය සභාවේ කටයුතු ඉදිරියට සාර්ථක ලෙස කරගෙන යැමට සුභ ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම මේ අවස්ථාවේදි මම කතා කරන්න ඔනේ අපේ සුසාන භූමිය පිලිබඳව මම අවුරුදු 10ක් 15ක් තිස්සේ කතා කරනවා.ඊයේ පෙරේදා අපේ ප්‍රදේශයේ සැහෙන මරන සංඛයාවක් ඇති වුණා.ඒ අවස්ථා හැම එහෙකදිම මම හිතන්නේ දවසට තුන හතර සිද්ධ වුණා ඒ ආදාහනාගාරයේ.ඒ තුන් හතර අවස්ථාවේදිම මම ඒ තැනට ගියා.ඒ අවස්ථාවේදි ඒකම වේලාවෙ මරණ දෙකක් ආවා.පුච්ච ගන්න විදිහක් නැති වුණා. මොකද කරන්ට් ඒක නැති නිසා.ඉතිං එක ඇත්තටම අපට වේදනා සහගත දෙයක් මොකද ගමේ මරණයක් ඒතැනට යන්නේ ඒ වේලාවේ ඒ කටයුතු කරලා ඒන්න සමහරක් වේලාවට විනාඩි 45ක් විතර ඉන්න වේනවා. මේ ගැන කලින් කතාකරලා ක්‍රියාමාර්ග ගත්තා ඒ ගත්තාට ඒවා අපිට කරගන්න හම්බුණේ නෑ. සභාවාර කිහිපයකම මේ ගැන කතා කලා මරණයක් සිදුවුණාම කොහොමත් මම යනවා. ඒක මන්ත්‍රීකම නිසාමත් නෙමෙයි ගමේ කමට යනවා. ඒත් අපිට ඒක ඒක හින්ට් පාස් වෙනවා ඒ තැන්වලට ගියාම අපේ වරදක් නෙමේයි . රටේ පවතින තත්ත්වය අපිට නවත්තන්න බෑ කරන්ට් ඒක කපනවා ජේනරේටරයක් අරන් ඒ කටයුතු ඉවරයක් කරන්න අපි තිරණය කලා අපි ඒහෙම යෝජනාවක් ගෙනවා නමුත් අපේ සභාවෙන් ඒ කටයුත්ත වුණේ නෑ. කිහිප දෙනෙක්ගේ අවශ්‍යයතාව මත ඒක සිදු වුණේ නෑ. සභාවක් වුණාහම ඒ ගත්තු හරි තිරණය යන්න ඔනේ දිගටම වරදින්න විදිහක් නෑ. වැරදි තින්දුවක් ගත්ත නම් ඒක වැරදි. මන්ත්‍රිගොල්ලො ඒකතු වෙලා ගන්නේ හරි තින්දුවක්නේ වැරදි තින්දුවක් ගත්තොත් ඒක අපි හැමෝටම විදවන්න වෙනවා ගරු සභා පතිතුමිය මේ ගත්ත තින්දුව ඇත්ත වශයෙන්ම අභය කලයුතු තින්දුවක් මේක·ඒත් මේක කර ගන්න හම්බවුනේ නෑ ඉතිං මං කියන්නේ මින් ඉදිරියට ලබන සභාවාරය ඒන්න කලින් අපිට ඒ කටයුත්ත කරලා දෙන්න කියලා· මොකද ඉදිරියට මේ තත්ත්වෙ◌ා තියාගෙන මිනි තියා ගෙන බලන් ඉන්න බෑ· හැකි ඉක්මනින් මේකට පිලියමක් යොදන්න මෙ◌ා්ක අත්‍යවශය දෙයක් ගරු සභාපතිතුමිය මේක කරලා දෙන්න කියලා මම ඉල්ලිමක් කරනවා· අනිත් ඒක තමයි ඒකේ දුම පිලිබඳව දුමත් හතරවටෙ කට්ටියගේ පැ තිවලට යනවා ඔබතුමියත් දැකලා ඇති· ඒ දුමත් යන්න නොදි මොනවා හරි පිලියමක් කරන්න ඉල්ලිමක් කරනවා · මම වැඩ අදිකාරිතුමාටත් කිව්වා· ඒතුමා මේ සභාවාරයේදි ඒ කටයුත්තට යන වියදම මේ දානවයි කියලා කිව්වා ඒතුමා සභාවේ නැ· මට කතා කරන්න විදිහක් නෑ මෙකත් හැකි ඉක්මනින් කරලා දෙන්න මගේඅම්මා තාත්තායි බැනුම් අහනවානවා· මොකද ජනතාවට සේවය කරලා ඒ තත්ත්වේ ඇති වුණාහම හිතට වේදනාවක් ඒනවා· මම විශේෂ ඉල්ලීමක් කරනවා ඒ කටයුත්ත කරලා දෙන්න ඒ වගේම සභාපතිතුමිය පහුගිය කාලේ අපේ ප්‍රදේශයේ යන්න ඒන්න බැරිව තිබුණු පාරක් තිබුනා ඒ පාර අපිට සංවර්ධනය කරලා දුන්නා මං ඒ ගැන ස්තුති වන්ත වේනවා ගරු සභාපතිතුමියටත් උපසභාපතිතුමාටත්

ලේකම්තුමිය ඇතුලු ඒ කාර්යභාර නිලධාරි තුමන්ලාටත් ඒ පිලිබඳව කටයුතු කරන සැම නිලධාරි කෙනෙකුටම මගේ ස්තුතිය මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා· ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඒ වගේම විදි ලාම්පු ගැන කතා කරන්න ඕනේ· මගේ ප්‍රදේශයේ සැහෙන්න පාර වල්ගොඩාක් තියෙනවා අද රටේ තත්ත්වය අනුව විදී ලාම්පු තියෙන්න ඕන විදිලාම්පු සමහරක් තැන්වල නෑ දැන් ප්‍ර මාණය මදි නිකුත් කරන ප්‍රමාණයත් අල්පයයි නගින කනු ප්‍රමාණයත් ඒ ගොල්ලන්ට පුළුවන් ප්‍රමාණය විතරයි නගින්නේ දවසට 25ක් 30ක් විතරයි නමුත් ඒ ප්‍රමාණය මදි තව විශාල ප්‍රමාණයක් තියෙනවා පසු ගිය දින වල අපි ඒ කටයුතු දිගින් දිගටම කරගෙන ගියා මිල අදික වු නිසා ඒ කටයුත්ත කෙරුනේ බෝහොම හිමින් ඒ නිසා තමයි මේ තත්ත්වේ ඇති වුණේ නැත්තම් ලාම්පුවක් නිවෙනකොට තව ලාම්පුවක් සවිකරන තත්වේකට තිබුනා පහුගිය දින වල සිදු වුණු ප්‍රමාදය නිසා මේ තත්ත්වය උදා වුණා ඉතිං සභාපති තුමිය මේ අය සෙනසුරාදා ඉරිදවත් යොදවලා මේ තද බදය ඉවර වෙනකන් මේ අවශ්‍යතාවය පෙන්නුම් කරලා මේ කටයුත්තත් කරලා දෙන්න කියලා· මේකේ තව පැත්තක් තියෙනවා කළුවර වුණාහම හොරකම් වැඩි කුඩුකාරයෝ ඒහෙම ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්නවා ප්‍රදේශවාසීන් අපිට ඇවිත් කියන්නේ අහවල්තැන කුඩු කාරයෝ ගැවසෙනවා මන්ත්‍රිතුමා අපිට මෙන්න මෙක කොහොම හරි කරලා දෙන්න කියලා· ඉතිං අපි සභාවට ඇවිත් කියනවා මීසක් වෙන කරන්න දෙයක් නෑ අපි මේ කටයුත්ත කොහොම හරි කරලාදෙන්න ඕනේ· ඒ වගේම මැතිවරණය ගැන කතා කලානේ කිහිපදෙනෙක්ම අපි කවුරුත් පෞද්ගලිකව තරහවෙන්න කිසි අවශ්‍යය තාවක් නෑ අපිඔක්කොම ඇවිත් ඉන්නේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න මම හැමදාමත් කියනවා වගේ අපි මන්ත්‍රිගොල්ලන් අපි වි නිතව කතා කරන්න ඕනේ අපි සභාවේ විදිහට කතා කරන්න ඕනේ අපි මන්ත්‍රීවරුන් වශයෙන් ඉගෙන ගත්ත දෙයක් ඒවා කවුරු හරි බලන් හිටය නම් වෙන්නේ සභාව හැල්ලුවට පත්වෙන ඒක පිටස්තර පුද්ගලයෝ නැති හින්දා හොඳයි නැත්තම් ඒහෙම කියන්නේ මේක කොලම් මඩුවක් උත්තරිතර සභාව තමයි ගමේ ප්‍රාදේශිය සභාව අපි සංවරව හැසිරෙන්න ඕනේ උත්තරත් සංවරව දෙමු කෙන්ති ගියත් සිනාමුසු මුහුණින් අපි කටයුතු කරමු අපි සාමය අගයන මිනිස්සු පුද්ගලිකවත් අපි කාටවත් වදහිංසා නින් දා අපහස කරන්නේ නෑ අපි බැඳිලා ඉන්නේ මහර ජනතාව වෙනුවෙන් වැඩ කරන්න අපි අවංකව සේවයක් කරමු පගා දූෂන නැතිව ඉදිරිකටයුතු කරමු· ඉදිරි මැතිවරණය වන තෙක් අපිට මේ සභාව සමඟියෙන් කරගෙන යාමට හැකියාව ලැබේවා කියා ප්‍රර්ථානා කරමින්· සියලුමදෙනාට සුභ ප්‍රාර්ථනා කරමින් මා නිහඩ වෙනවා·

**(එ) 15. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ඩබ්.ඉන්දික පුෂ්ප කුමාර මහතා:-**

ගරු සභාපතිතුමිය අද අපේ ඇත්තටම ප්‍රාදේහිය සභාවේ අවසන් සභා වාරය වෙන්නත් පුළුවන්·බොහෝ විට මේ තව වාරයක් තියෙනවා නමුත්වසර 5 ක ධුරකාලයක් ඔබතුමියට වාසනාව හිමිවුණා මේසභාව මෙහෙය වන්නට ·මොනමතවාද තිබුනත් අපි ඒකකාණ්ඩායමක් වශයෙන් අපි ආදර්ශමත් වෙතා තියෙනවා අනිත්පකෂ වලට අපේ 31දෙනාම මේ වෙනකන් අපේ කණ්ඩායමේ ඉඳගෙන සහයෝගයෙන් ප්‍රාදේශිය සභාව පවත්වාගෙන ගියා ·නමුත් අපි දැකලා තියෙනවා වෙන සභාවන් වල ගහගන්නවා මරාගන්නවා සෙරප්පුවලින් ගහගන්නවා අපේ සබාවේ කිසිම මන්ත්‍රිවරයෙක් වරියක් ඒළියකදිවත් අතපය උස්සගෙන අමනාප වුණේ නෑ ·ඒ ගැනත් අපි ආඩම්බර වෙනවා නමුත් හැමවෙලේම කියනවා බයියෝ මැතිවරනයට බයයි කියලා නෑ බයියෝ මැතිවරණයට බයයි නම් නාම යෝජනා අත්සන් කරන්නේ නෑ ·අපි නාම යෝජනා අත්සන් කලේ ඡන්දේ හෙට තිබ්බත් අපිඉදිරිපත් වෙන්න ගෙදෙට්ට වෙලා හැංගිලා ඉන්නේ නෑ·නමුත් අපිට මේ සැරේ මැතිවරණයේදි ටෝයියන්ගේ ගැටලුවක් නෑ·මං සාමාන්‍යයෙන් ටොයියා කියන්නේ අපේ ප්‍රසාද් මන්ත්‍රිතුමාට ඒතුමා ඇත්තටම හොඳයි. වුණානේ ගම් වල උන්ගෙන් තමයි බෙරන්නම බැරි ඒ හින්දා තමයි 88/89 යදි බයියො ටොයියො වුනේ.මේ පාරත් ඒ සිද්ධියම වෙනවා ඒ හින්දා අපි නිහඩවම බලන් ඉන්න හදන්නේ මැ මේ පාරත් ඒ සිද්ධියම වෙනවා.ඒ නිසා අපි නිහඩව බලන් ඉන්න හදන්නේ.මට බයනම් මැතිවරණයට පොදුජන බලවේගගෙන් අත්සන් කරන්නේ නෑ.අපි දේශපාලනය නවත්තන්නෙත් නෑ.ඒක අපි අභිමානයෙන් කියනවා.මැතිවරණ කොමසාරිස් අපේ අම්මාවත් තාත්තාවත් නෙමෙයිනේ.අපි අත්සන් කළේ ඉදිරිපත් වෙන්න.මැතිවරණය තියෙයිද නැද්ද කියන්න අපි දන්නේ නෑ.මේ හැම කෙනාම දිනලා ඉවරයි.අපි බලමු කවුද ජයග්‍රහණය කරන්නේ කියලා.මේ සභාව හැදුවේ ජනතා විමුක්ති පෙරමුණයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි.ජනතා මතයෙන් මන්ත්‍රීවරු 31ක් තේරී පත් වුණා.ඒ වගේ ඡන්දයට යමු. මම පුළුවන් නම් කියනවා මේ සභාව තනියෙන් පිහිටවන්න කියලා.මම හය නැතුව ඕකැම පක්ෂයකට අභියෝග කරනවා.ඒ නිසා මම වැඩිදුර කතා කරන්න යන්නේ නෑ.අපේ මන්ත්‍රීවරු 56 දෙනාම මේ ආසනය ඇතුළේ සුහදව දේශපාලනය කළා.වාලස් මන්ත්‍රීතුමා කෑ ගහලා මොන තරම් වාද විවාද කළත්, අපිත් එක්ක හොඳට කතා බහ කරනවා.ඒ නිසා හැම කෙනාටම නැවත ජයග්‍රහණය කරන්න ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**(එ) 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එස්.ඩබ්.ඒ.අතුල ඉන්දික විජේවික්‍රම මහතා:-**

ගරු සභාපතිතුමිය, අවුරුදු පහක් තිස්සේ මගේ කොට්ඨාශයේ ඉන්දික මන්ත්‍රීතුමා, අපේ හාමුදුරුවෝ අපි ඔක්කොම බොහොම සුහදව වැඩ රාජකාරි කළා.අපේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අලියා ලකුණින් ඡන්දේ ඉල්ලලා දිනලා තමයි අපි ආවේ.රොහාන්

රොයිස් මන්ත්‍රීතුමා මම මෙහෙම කිව්වට තරහා වෙන්න එපා.නාම යෝජනා නායකත්වයට මේ වෙලාවේ බනින්න හොඳ නෑ.මොකද අපි අත්සන් කලේ එක්සත් ජාතික පක්ෂය කියලා.මේ වෙලාවේ අපේ රටේ නායකයා, අපිව ගොඩගත්ත නායකයා රනිල් වික්‍රමසිංහ මැතිතුමා.ඒ නිසා එතුමාට මේ වෙලාවේ බනින්න එපා.මගේ කොට්ඨාශයේ අජන්ත මන්ත්‍රීතුමාත්, අපේ හාමුදුරුවොත්, ඉන්දික මන්ත්‍රීතුමත් කවදාවත් රණ්ඩු සරුවල් වෙලා නෑ.මොකක් හරි වැඩක් කරන්න අවශ්‍ය නම් ප්‍රමාද වුණත් ඒ වැඩේ කොහොම හරි කරලා දෙනවා.සභාපතිතුමියත් අපිට කවදාවත් මුකුත් කරලා දෙන්න එපා කියලා කියන්නේ නෑ.අපි පක්ෂ දෙකක ඉන්න පුළුවන්.පක්ෂ අතර මතිමතාන්තර තියෙන්න පුළුවන්.ඉදිරියේදීත් අපි හැමෝම සහයෝගයෙන් වැඩ කටයුතු කරමු කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා ස්තූතියි.

__(එ) 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ඒ.සිරිනිමල් එදිරිසිංහ මහතා:-__

ගරු සභාපතිතුමියනි, මට හිතුනේ අපි මේ සම්බන්ධ වෙන්නේ අවසන් මහා සභා රැස්වීමට කියලා.මට අවුරුදු 20 කට වැඩි කාලයක් මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කරන්න අවස්ථාව ලැබුණා.අපේ ගමේ අපි නියෝජනය කරපු, අපේ තාත්තලා නියෝජනය කරපු අපේ පක්ෂවල නායකයන්ගේ වැරදි අඩුපාඩු පමණක් දැකලා ඒවා විවේචනය කරලා තරුණයන් අතර යම්කිසි ජනප්‍රියතාවයක් ලැබීම හේතුවෙන් තමයි අතුල නිමලසිරි ජයසිංහ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා අවස්ථා ගනණාවක් ආරාධනා කරලා අවසාන මොහොතේ අපේක්ෂකයෙකු වශයෙන් 2002 වර්ෂයේදී ඉදිරිපත් වුණේ.ඒ අවස්ථාවේදී මුළු ලංකාව භේදිලා එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළා.අපේ සුසන්ත වන්නිආරච්චි සභාපතිතුමා පත් වුණ විගසම මට රු.ලක්ෂයක ප්‍රතිපාදන මුදල් ලබා දුන්නා.ඒ මුදල්වලින් මගේ නිවස ඉදිරිපිට ක්‍රීඩා පිටියේ ක්‍රීඩා මණ්ඩපය හැදුවා.ඒ එක්කම ප්‍රසන්න රණතුංග ගරු අමාත්‍යතුමා පළාත් සභාවේ අමාත්‍යවරයෙක් වශයෙන් ඉන්න කොට රු.අසූ දහක මුදලක් මෙතුමා සභාපති තනතුර දරන කාලේ වීථි ලාම්පු අසූ හයක් ඒ වෙනුවෙන් වෙන් වුණා.එතුමත් අවසාන මොහොතේ බාධා කළා. එතුමා සභාපතිවරයෙක් වශයෙන් සහයෝගය දුන්නා එදා අපේ ප්‍රදේශයේ පොදු දේපළ මංකොල්ලකන්න ලැස්ති වුණ එක්සත් ජාතික පක්ෂයේ අයට විරුද්ධව පවා රවීන්ද්‍ර රන්දෙණිය මන්ත්‍රීතුමා සමඟ එකතු වෙලා ඒවා අපිට පොදු ජනතාව වෙනුවෙන් බේරලා දුන්නා.ඊට පසුව ලසන්ත අලගියවන්න අමාත්‍යතුමා බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යවරයෙක් වශයෙන් එතුමාගේ දක්ෂතාවයන් උපයෝගී කරගෙන කෝටි ගානක ප්‍රතිපාදන මුදල් මහර ආසනයට ගෙනාපු අවස්ථාවේදී අත්‍යවශ්‍යම සංවර්ධන කටයුතු කිහිපයකට මහර ප්‍රාදේශීය සභාව පාලනය කරපු මෙතුමාගේ නායකත්වය අපිට අවසර දුන්නේ නෑ. ඒ නිසා අපිට ඒ අවස්ථාවේ ඒ මුදල් යොදලා විශාල සංවර්ධන කටයුතු රාශියක් මඟ හැරුණා.එසේ වුවත් ඒ කාලය තුළ දරුවන් වේගයෙන් නොමඟට යන කාල වකවානුවේ අද ගොංගිතොට ගෝල්ඩර්කැරෝස් ක්‍රීඩා පිටියට ඒ කාලේ ලක්ෂ විස්සක් යොදලා ලසන්ත අලගියවන්න අමාත්‍යතුමා ප්‍රතිපාදන තුළින් සකස් කරගන්න පුළුවන් වුණා.ඒක දිවා රාත්‍රි ක්‍රීඩා පිටියක් වශයෙන් අපිට වැඩ කරන්න පුළුවන් වුණා.සභාපතිතුමියට විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙන්න ඕන එතුමිය කිසිදු අවස්ථාවකදී කිසිදු පැකිලීමකින් තොරව බාධාවකින් තොරව ඒ කටයුත්ත කරලා දුන්නා.ඒ වගේම අපේ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු රාශියක් කරගන්න පුළුවන්කම ලැබුණේ 2005 වර්ෂයේදී අතිගරු ජනාධිපතිවරයා වශයෙන් මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් වුණාට පසුව ගම වෙනුවෙන් ප්‍රතිපාදන මුදල් වෙන් කරන්න ගෙනාපු සංකල්ප නිසා තමයි මට මන්ත්‍රීවරයෙකු වශයෙන් අභිමානයෙන් අපේ ගම් කිහිපයම සංවර්ධන කරන්න අවස්ථාව ලැබුණේ.එවකට මට ග්‍රාමසේවා වසම් 8ක් පැවරිලා තිබුණා.අක්බාර් ටවුන්, එඬේරමුල්ල නැගෙනහිර, එඬේරමුල්ල බටහිර, පින්නමැද, පින්නමැද බටහිර, අප්පුගෙවත්ත, ගොංගිතොට බටහිර, ගොංගිතොට දකුණ.මැතිවරණවලදී අපිට ඡන්ද කොච්චර අඩුවෙන් ලැබුණත් අක්බාර්ටවුන් ප්‍රදේශයේ මුස්ලිම් කනත්ත ඇතුළේ ලයිට් ටික පවා මම දැම්මේ. අපි කිසිදු භේදයකින් තොරව ඒ කාලය සංවර්ධන කටයුතු කළා.ඒකට ස්තූතිවන්ත වෙන්න ඕන.අතිගරු ජනාධිපතිතුමා අපේක්ෂකයා වශයෙන් පත් වුණ වෙලාවේ අපේ පක්ෂයේ අයම කකුලෙන් ඇද්දා. ඒ අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණ අපිත් සමඟ එකතු වෙලා වැඩ කරන්න කැමති වුණේ නැති වුණාට ඒ ගොල්ලෝ කරපු වැඩපිළිවෙල තුළ තමයි බොහොම සුළු වැඩි ඡන්ද ප්‍රමාණයකින් අපේ ජනාධිපතිතුමා පත් වෙලා ආවේ.ඒකේ ස්තූතිය මෙතුමන්ලාටත් යන්න ඕන.එකතු වෙලා රට හදන්න ආවේ නැති වුණාට අපි ඒකට ස්තූතිවන්ත වෙන්න ඕන.මගේ ගම්මානයට පිවිසෙන්න තිබුණ මාර්ගය අපිට අයිති නැති වුණත්, ඇමතිවරු හතර දෙනෙක් මාබෝලේ හංදියට පයින් එක්කන් ගිහිල්ලා මගේ උත්සාහයෙන් තමයි ඒ වැඩ කරගත්තේ.අපි හයිවේ එකෙන් පාලමක් හදාගත්තා අපේ ප්‍රදේශයට ඇතුළු වෙන්න.ඒක අවුරුදු සිය ගානක් පවතී.ඊට පස්සේ එඬේරමුල්ල ප්‍රදේශයෙන් අපේ ගම්වලට එන මාර්ගය ලසන්ත අලගියවන්න අමාත්‍යතුමා අවස්ථා දෙකකදි සකස් කරලා දුන්නා.මෙතුමා කිව්වා කාණුවේ අවදානම් තත්ත්වය අපි පෙන්නලා දුන්නා. ඇත්තටම මන්ත්‍රීවරයෙක් වශයෙන් මට ලැජ්ජයි දෙවරක් බස්නාහිර පළාත් සභාවෙන් ප්‍රතිපාදන වෙන් කරලත් කිරිදිවල කාර්යාලයේ නිලධාරීන් උනන්දු වුණේ නෑ.දැන් ඉන්න නිලධාරීන් අපිත් සමඟ සුහදයි.මෑතකදි හිටපු සභාපතිවරු දෙන්නෙකුගේ ලියුම් අරගෙන බණ්ඩාරණාක මහත්තයා පෞද්ගලිකව කතා කරලා කිව්වා. ඒත් සිද්ද වුණේ නෑ.ඒ වගේම තමයි එඬේරමුල්ල දුම්රිය හරස් මාර්ගය ළඟ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති ඒ දුම්රිය මාර්ගයේ ආරක්ෂක කටයුතුවලට අදාළ දේවල් කර ගන්න බැරි වුණා

කියලා මිනිස්සුන්ගෙන් මට චෝදනා තියෙනවා මේච්චර කල් මන්ත්‍රීවරයා වශයෙන් ඉඳලා කරගන්න බැරි වුණා කියලා.ලසන්ත අලගියවන්න අමාත්‍යතුමා මිලියන හාරසීයක් වෙන් කරලා අපේ දුම්රිය නැවතුම්පළ හදන කොටම ඒක හදන්න සියලු දේ කරලා ගෙනල්ලත් තිබුණා.ඒවා කෙරුණේ නෑ.මොනා වුණත් ඒ සියල්ලේ වැරැද්ද ප්‍රදේශයේ මන්ත්‍රීවරයා වශයෙන් මම භාර ගත යුතුයි.ඒ වගේම ලසන්ත අලගියවන්න අමාත්‍යතුමාට උවමනාව තිබුණා අපේ ගමට ලොකු ගොඩනැගිල්ලකුත් එක්ක පහසුකම් රාශියක් ඇති කරන්න. මාතෘ සායනය තනියෙන් හදපු නිසා ඒකට එවෙලේ අවස්ථාව ලැබුණේ නෑ.පරණ වතුර ටැංකිය තිබුණ ගොඩනැගිල්ල තුළ ගමේ සියලු පොදු සංවිධානයක් එකතු වෙලා හදපු සැලැස්මකට එතුමා ගොඩනැගිල්ලක් සකස් කළා.සමහර තැන්වල එතුමාගේ තිබුණ කුහකකම් නිසා එතුමා ඒක යූ.ඩී.එක හරහා කළා.ඒ නිසා අපිට සංවර්ධන කටයුතු කිහිපයක්, එඬේරමුල්ල අක්කර විසිනමය නම් ගැටලුවක් නෑ.ප්‍රාදේශීය සභාවට කරන්න බැරි ව්‍යාපෘති කිහිපයක් එකතු කරපු නිසා එතුමා ඒක යූ.ඩී.එකට පවරපු එක සාධාරණයි.අපේ ගමේ අද වෙනකනුත් වටිනා ගොඩනැගිල්ලක් ඉදි කරලා නිකන් තියෙනවා. ඒකට මන්ත්‍රීවරයා වශයෙන් මට අවුරුදු සිය ගානක් දොස් කියයි.ඒක මම පිළිගන්නවා. ඒක මගේ දෝසයක් වෙන්න ඕන.අද වෙනකනුත් ඒ ගොඩනැගිල්ල නිකන් තියෙනවා.ඒ වගේ හොඳ සහ නරක අපිට තියෙනවා.අද ගමේ සමහර මිනිස්සු සිරිනිමල් මොකද කළේ කියලා අහනවා.මේ සමාජේ හැටි.ලසන්ත අලගියවන්න මැතිතුමාගේ කාලේ ප්‍රාදේශීය සභාවෙන් අපිට ප්‍රතිපාදන වෙන් කරලා මාර්ග රාශියක් සකස් කරන්න බඩු ලබා දුන්නා.අපි ඒ කාලෙත් ජනතාවගේ සහභාගිත්වයෙන් සංවර්ධන කටයුතු රාශියක් කළා.මේ වටපිටාව තුළ කවුද ජයග්‍රහණය කරන්නෙ කියන එක ගැන ස්ථාවරයක් නෑ.මේ කල් දැම්මොත් ජනතාවගේ සැබෑ තත්ත්වය අපිට දැකගන්න පුළුවන් වෙයි.මේ අවස්ථාව රට පවතින්නේ මැතිවරණයක් තිබිය යුතු තත්ත්වයක නෙමෙයි.රාජ්‍ය ආයතනවල සංවර්ධන කටයුතු අඩාල වෙලා තියෙනවා.ඒ අයට පඩි ගෙවන්නේ බොහොම අමාරුවෙන්.අපේ පක්ෂයේ මිනිස්සුන්ගේ යම් යම් සෙලවීම් තිබුණත් අපේ පක්ෂයේ මිනිස්සු වෙනස් වෙලා නෑ කියන එක කියන්න ඕන.පොහොට්ටුව කෙටි කාලයකින් විශාල ජයග්‍රහණ රාශියක් ලබලා ස්වභාවිකව අපිට අත්වුණ ව්‍යසනයන් නිසා සහ අපේ නායකයන්ගේ පරිපාලන අඩුපාඩු නිසා අපිව ඒ තත්ත්වයට පත් වුණා.පියනන්ද මාවත ජනතා ශ්‍රමයෙන් අපි කොන්ක්‍රීට් කරලා සංවර්ධනය කරන කොට අපේ ගමේ මන්ත්‍රීවරයෙක් මේ සභාවේ අහනවා ඒ ඉඩම් සභාවට දීලා නැතුව කොහොමද එහෙම කරන්නේ කියලා.ඒ වගේම කුහක මිනිස්සුන්ට හරි බලයක් ලැබෙයි කියලා මම හිතන්නේ නෑ.ඒ වගේම අප්පුගෙවත්ත ප්‍රධාන මාර්ගය හදන වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ රනිල් පින්තු මන්ත්‍රීතුමා විශාල වශයෙන් ධනය වියදම් කරලා සංග්‍රහ කරලා අපිට සහයෝගය දුන්නා.ඒ පක්ෂයේ කෙනෙක් ගිහින් කියනවා ඇයි ඔයා මේ පාර හැදුවේ අපිට ඡන්ද ටිකක් හදාගන්න තිබුණා මේ පාර වතුරට යට වුණා නම් කියලා.කුහකකම් කරන මිනිස්සු ඉන්නවා.විදේශ ආධාරවලින් අද රට ලෝකයට බංකොලොත් නොවෙන තත්ත්වයට ගෙනල්ලා තියෙනවා.අපේ වත්මන් ජනාධිපතිතුමාගේ දැනීම සහ ජාත්‍යන්තර සබඳතා ඕනම කෙනෙක් දන්නවා.රාජ්‍ය ඇමතිකම් වැඩි කළා කියලා එතුමා ඒ ප්‍රතිපාදන නොදී යම් කිසි පාලනයකට ගෙනල්ලා කරගෙන යන නිසා අද රට හොඳ තත්ත්වයක තියෙනවා.මේ වෙලාවේ සුළු පක්ෂවල අය සංචාරක ව්‍යාපාරය කඩා කප්පල් කරන්න තමයි හදන්නේ.ගම්වලට ප්‍රතිපාදන වෙන් කළේ ගමේ මන්ත්‍රීවරයා බබළවන්න.ඒ තුළ තමයි අද අදටත් අභිමානයෙන් ජීවත් වෙන්නේ.අපිට අත්ම තෘප්තියක් ලබන්න පුළුවන් විදියට අපේ ගම් අපි සංවර්ධනය කරලා තියෙනවා.ඉදීයේදිත් අපි ජයග්‍රහණය කරලා අපිට අවස්ථාවක් ලැබුණොත් ඉදිරියේදීත් අපි ජනතාව වෙනුවෙන් සේවය කරන්න අපේක්ෂා කරනවා.අපි ගැටුම් ඇතිකරගෙන නෑ.ඡන්දය ඉල්ලන වැඩි කෙනෙකුට ජයග්‍රහණය කරන්න ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා ස්තූතියි.

**(එ) 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.පී.බී.මදුරප්පෙරුම මහතා:-**

ගරු සභාපතිතුමියනි, අවුරුදු විසි හතක විතර කාල පරිච්ඡේදයක් තමයි මම මේ සභාවේ කරගෙන යන්නේ.සභාපතිවරු හය දෙනෙක් විතර වගේ මේ සභාව නියෝජනය කළා. ඒ අතරතුරදී අතුල නිමලසිරි ජයසිංහ මැතිතුමා, ලසන්ත අලගියවන්න මැතිතුමා, සහන් ප්‍රදීප් විතාන මැතිතුමා යටතේ මහර ආසනයෙන් සූරිපාළුව දකුණ කියන කොට්ඨාශය නියෝජනය කරලා 2864ක් ඡන්ද අරගෙන දෙවෙනි ස්ථානය ලබා ගත්තේ මහජනතාව නියෝජනය කරන්න තමයි මම පත් වෙලා ආවේ.ඇත්තෙන්ම සභාපතිතුමියගේ කාල සීමාවේදී මගේ ප්‍රදේශයට, ගමට විශාල සේවයක් කරන්න පුළුවන්කම ලැබුණා. ඒ කියන්නේ අපේ පොදුජන පෙරමුණ නායකත්වය අරගත්ත නිසා තමයි මේ කටයුතු අපිට කරන්න පුළුවන්කම ලැබුණේ.ගරු සභාපතිතුමියනි, ඉදිරියේදී මැතිවරණ කාලසීමාවක් එළඹෙනවා. ඒ මැතිවරණ කාලසීමාවේදී මම හිතන විදියට මගේ ප්‍රදේශයට පානීය ජලය ලබා දීලා කාපට් ලබා දීලා කොන්ක්‍රීට් ලබා දීලා 98% ක්ම සංවර්ධනය කරලා තියෙනවා.මහර ආසනය අනිත් ප්‍රදේශ එක්ක සසඳලා බලන කොට මම ලොකු ජයග්‍රහණයක් කරලා තියෙනවා කියන එක තමයි මට කියන්න තියෙන්නේ.ඉතින් ගරු සභාපතිතුමියනි, එළඹෙන මැතිවරණයෙනුත් මේ සභාවේ පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉඳගන්නවා කියලා කියමින් මම නිහඬ වෙනවා.

**(එ) 19. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ආර්.කුලතුංග ආරච්චි මහතා:-**

ගරු සභාපතිතුමිය, මම මේ අවස්ථාවේදී මගේ කතාව පටන් ගන්න කලින් කීර්ති මන්ත්‍රීතුමා කරපු කතාව පිළිබඳ විශේෂයෙන්ම අවධානය යොමු කරන්න කැමතියි. ඒ කතාව ඇත්ත. ඒ මිනිස්සු අපටත් යම් යම් චෝදනා කරනවා.සභාපතිතුමිය ගහ කපන්න තුන්වෙනි නිවේදනයත් යවනවා.107 II වගන්තිය යටතේ වෙන කාටවත් ගහක් කපන්න බලයක් නෑ.ඒ බලය තියෙන්නේ අදාළ ප්‍රාදේශීය සභාව සභාපතිට පමණයි.ගස් පිළිබඳව පැමිණිල්ලක් යොමු කරන්න පුළුවන් වෙන ආයතනයකුත් රටේ නෑ.මේ කීර්ති මන්ත්‍රීතුමා කියන කොස් ගහට ගහ කපන්න කියලා තුන්වෙනි නිවේදනය ගියා.නමුත් කැපුම්කරු කැඳවලා ඔහුට අතු කපන්න කියනවා.එහා පැත්තේ තියෙන ගහත් ඇදලා තියෙන්නේ මේ කොස් ගහට.බැරි වෙලාවත් වැටුණොත් මේ ගස් දෙකම අර මනුස්සයාගේ ගෙදරට වැටෙනවා.ඒ පුද්ගලයා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය කොමසාරිස් කෙනෙක්.ඔහු මගෙත් කීර්ති මන්ත්‍රීතුමාගෙත් හිතවතෙක්.සභාපතිතුමිය ගහ කපන්න කියලා නියෝගය නිකුත් කළාට පස්සේ මේක අතු කපන්න කියලා වෙනස් වෙන්නේ කොහොමද කියලා අහනවා. මේ විදියේ නියෝග නිකුත් කරලා එක සභාවක මට මතකයි අපේ සුනිල් සුමතිපාල මන්ත්‍රී  මා එක පාරට හිනාවට භාජනය කළා.රංජිත් කොඩිකාර කියලා අපේ පරණ මන්ත්‍රීවරයෙක් හිටියා.එතුමා තමයි ඔය පස් කපන්න කට්ටිය අරගෙන යන්නේ.පොලිසියත් ඔක්කොම අරගෙන ගිහිල්ලා තර්ජනය කළහම, කපන්න තියෙන ගහ ඇදලා බැඳලා එනවා.සුමතිපාල මන්ත්‍රීතුමා කිව්වා ගස් කපන්න යන කමිටුවේ ඉන්න සභාපතිතුමා ශොක් කපන්න තියෙන ගහ ඇදලා බැඳලා එනවා කියලා.ඒ වගේ කතාවක් තමයි මේ වෙන්නේ.මෙතනදි කාර්මික නිලධාරීන් ගහ කපන්න කියලා නිර්දේශ කරනවා.නමුත් එතනට ගියාට පස්සේ කැපුම්කරුට නියෝගය දෙන්නේ අතු කපන්න කියලා.මේක සම්පූර්ණයෙන්ම වැරදියි.මෙහෙම වෙනකොට ඔබතුමියගේ ප්‍රතිරූපයටත් සභාවේ ප්‍රතිරූපයටත් එකෙන් බලවත් කැළලක් ඇති වෙනවා. ඒ නිසා මින් මතුවට මෙහෙම දේවල් නොවෙන විදියට කටයුතු කරන්න කියලා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

අනිත් එක තමයි ගරු සභාපතිතුමිය, අපි සභාවෙන් කොච්චර වැඩ කළත්, බොරුව සමාජගත වෙනවා වැඩියි.කරන හරි දේට වැඩිය බොරුවයි සමාජගත වෙන්නේ.අවුරුදු පහක් සභාපතිට කිව්වා සත පහක වැඩක් නෑ වැඩේ කෙරුණේ නෑ කියලා.නමුත් R.D.A. එක ගැන කතා වෙන්නේ පොඩියට.එතකොට හෙඩ් ලයින් එකේ ලොකු අකුරින් මේ ගැන ගිහින් ඉවරයි. මේක මගේ එක්ක නෙමෙයි R.D.A. එකේ වැඩක් කියලා පොඩියට යටින් දානවා.ඇස් පේන්නේ නැති මිනිස්සු බලන්නේ ලොකු අකුරුනේ.එහෙම ප්‍රශ්නයක් තියෙනවා.මේ මැතිවරණ කාලේ නොයෙකුත් විදියේ බොරු සමාජ ගත වෙනවා.මාත් එක්ක කවුරුත් අමනාප වෙන්න එපා.එක්තරා දේශපාලන පක්ෂයක් කියනවා මේ බලය අපි දෙන්න අපි පඩි නැතුව වැඩ කරන්නම් කියලා.දැන් පඩි ගන්නේ නෑ කියන බොරුව සමාජගත වෙලා. සමහර ජනතාව හිතාගෙන ඉන්නවා අහවල් පක්ෂයේ අය ආවොත් ඇත්තටම ඒ ගොල්ලෝ පඩි ගන්නේ නෑ කියලා.මෙතන ඉන්න සියලු දෙනාම  මේ ගත වුණ මාස හැටට මේනේ ඉන්න එක් කෙනෙක් ලක්ෂ 12 ගානේ පඩි අරගෙන තියෙනවා.දීමනාවයි දුරකථන දීමනාවයි දෙක විතරයි මම එකතු කළේ.කමිටු දීමනා එකතු කරන්නේ නැතුවයි මේ කියන්නේ.මේ මන්ත්‍රී ධූර කාලය තුළ එක් කෙනෙක් ලක්ෂ 12ක් අරගෙන තියෙනවා.අරගෙන කියනවා අපි අහවල් පක්ෂයේ අපි පඩිය ගන්නේ නෑ කියලා.අපිනම් කියනවා අපි ගන්නවා කියලා.ගන්නේ නැතුව අපිට යන්න එන්නත් බෑ.සමහ නොගන්න මන්ත්‍රීවරු කොටසක් ඉන්නවා ඒ අය කියනවා මෙහෙමයි කියලා.ඒ සංඛ්‍යාව පහෙන් වැඩි කරලා බලපුවහම ඒ කියන පක්ෂය මහර ප්‍රාදේශීය සභාවෙන් මේ ධූර කාලය තුළ ලක්ෂ 60ක් දීමනා සඳහා අරගෙන තියෙනවා.මම කියන්නේ ගන්න එක වරදක් නෙමෙයි. මොකද ඒ දීමනාව අපිට හිමියි.චක්‍රලේඛනය අනුව ඒ දීමනාව ගන්න පුළුවන්.සමහර අය අරගෙන ගත්තේ නෑ කියනවා.ඕකට හොඳට උදාහරණය තමයි මේ ළඟ ඔය කතා ඇදිලා එන කොට මැතිවරණ කොමසාරිස්තුමා කියනවා නාම යෝජනා දීපු අයගෙන් 15දෙනෙක් හරි 20 දෙනෙක් හරි විතරක් ලියුමක් දීලා තියෙනවා කිව්වා  තමන් පත් වුණාට පස්සේ තමන්ට වැටුප් දීමනා මුකුත් එපා කියලා.ඒ නිසා මම සෑම පක්ෂයකම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා ඒ බොරු සමාජගත වෙන්න දෙන්න එපා කියලා.කවුරුත් මෙතනට ඇවිල්ලා පඩි නැතුව වැඩ කරන්නේ නෑ.කවුරුත් දීමනාව ගන්නේ නැතුව වැඩ කරන්නේ නෑ.මේකේ දුකරථන දීමනාව ගන්නේ නැති කෙනෙක් නෑ.ගන්නේ නැති අයට ටෙලිෆෝන් එකේ මොකක් හරි ප්‍රශ්නයක් ඇති.තව එක්ක තියෙනවා. ටෙලිෆොන් එක තියෙන්නේ වෙන කෙනෙකුගේ නමට.එතකොට මන්ත්‍රීවරයාගේ නමින් බිල් ආවට ගෙවන්න බෑ.තව හාඩ්වෙයාර්වල බිලුත් අරගෙන ඇවිල්ලා තිබුණා.ඒවට ගෙවන්නෙත් නෑ.අපේ එක මන්ත්‍රීතුමෙක්ගේ ටෙලිෆෝන් බිලක් ඉල්ලලා තිබුණා ඒ බිල ගෙවලා තිබුණේ හාඩ්වෙයාර් එකක් වෙන යම් කිසි ආයතනයකට. හාඩ්වෙයාර් එකේ නමින් තමයි ඒ කොමිනිකේෂන් එක තියෙන්නේ.අපේ නිලධාරීන් ඕක බෑ කිව්වහම මෙතන ප්‍රශ්න අති වෙනවා. අපි ගිහින් බලපුවහම ටෙලිකොම් බිලක් නෙමෙයි තියෙන්නේ හාඩ්වෙයාර් බිලක්.මේ වගේ සිද්ධි තියෙනවා.බැහැ කිව්වහම නිලධාරියත් එක්ක තරහා වෙනවා.ඒ නිසා සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා ඒ ජනතාව වෙනුවෙන් අපි එළියට බැහැලා යම් කිසි කෙනෙක් බොරුව සමාජගත කරන්න හදනවා නම් ඒ බොරුවට විරුද්ධව මේක සම්පූර්ණ බොරුවක් අසත්‍යයක් කියන එක ජනතාව අතරට ගෙනියන්න කියන ඉල්ලීම හැම දෙනාගෙන්ම කරමින් මගේ කතාව අවසන් කරනවා ස්තූතියි.

**(එ) 20. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ජී.ප්‍රසාද් නිරොෂන් අබේරත්න මහතා:-**

ගරු සභාපතිතුමිය, කෙලින් කියපු දෙයක් නෙමෙයි ව්‍යාංග ප්‍රහාරයක් තියෙන්නේ.බරපතල චෝදනාවකුත් නෙමෙයි.අපි තොප්පිය බලෙන් දාගෙන කියලා කියමුකෝ.එහෙම තමයි මම කතා කරන්නේ.ඔබතුමිය දන්නවා අදත් අත්සන් කළා අපේ ඒ දීමනාවට.මහජන බැංකුවේ නිට්ටඹුව ශාඛාවේ පළාත් පාලන මන්ත්‍රී අරමුදලට යන්නේ.ඒක ප්‍රධාන එකට යන්නේ නෑ.අපේ ගම්පහ දිස්ත්‍රික්කයේම මන්ත්‍රීවරු ඉන්නේ 58යි.ඔය කියන කාල වකවානුවේදී අපිට ලැබුණේ ඡන්ද දහදහස් හත්සියු පනස් ගානක් වගේ.අපිට මන්ත්‍රී ධූර පහයි හම්බුණේ. ගරු සභාපතිතුමිය මගේ ළඟ තියෙනවා කැනපි දෙකක්.අවුරුදු තුනක් හතරක් වෙනවා. ඒක නැවත ප්‍රතිසංස්කරණයට දාලා තියෙනවා.රු.10,500කට විතර තිබුණ රෙද්දක් ඒකත් අපි පක්ෂයට හිතවත් සහෝදරයෙකුට කියලා ලංකාවේ යන රේට් එක රුපියල් 100 නම්,අපිට මේකෙනුත් යම් කිසි වැඩක් කරගන්න පුළුවන් කියන අදහසින් මම කියන්නේ.අපි දළ වශයෙන් හිතමු තිහාරියේ රුපියල් 100ට මීටරේ තියෙනවා කියමුකෝ.කෙනෙකුට කතා කරලා 120ට ගන්න පුළුවන් නම් ඒ විදියට කරලා දාපු පාරක් තියෙනවා නම්, පළාත් සභාවේ හිටියේ දෙන්නයි. ඒ දෙන්නගෙන් පාර්ලිමේන්තුවේ ගම්පහ දිස්ත්‍රික්කයට ඉන්නේ එක් කෙනයි.අපි කරපු ප්‍රමාණය අඩු ඇති.හැබැයි අපි පුළුවන් විදියට කළා.කොරෝනා වසංගතය වෙලාවේදී අපි පුළුවන් විදියට මාක්ස් ටිකක් මහලා ඒවා තමයි පාවිච්චි කළේ.ලංකාවේ හමුදා ආයතනවලට පොලිසිවලට අපි යමක් කළා.මීගමුවේ I.C.U.එක හැදුවේ ඒ මුදල් වලින්.ඒ මාස තුනේම කෑම බීම වැඩේ මට පැවරිලා තිබුණේ.වර්ග අඩි 1800ක 2000 විතර සම්පූර්ණයෙන්ම හදලා දුන්න ඒ අරමුදලින්. මහරින් එළියටත් අපිට ඒ වෙලාවේ කරන්න වුණා.දේශපාන විවේඡනයක් හැටියට අපි ඒක භාර ගන්නවා.වැටුප් ගන්න ඒවා ඕන විදියකට ජනගත කරන්න.ඒ සම්බන්ධව අපිට ප්‍රශ්නයක් නෑ.කඩවත මහජන බැංකුව ගිහිල්ලා එක මාසයයි අපි ගත්තේ.විජේගුණේ අයියා ආවනම් ඒක වෙන්නෙත් නෑ.ඕන කෙනෙකුට පර්යේෂණය කරන්න පුළුවන් මුදල් ටික කොහේටද ගියේ කියලා.වෙබ් සයිට් එකෙනුත් බලන්න පුළුවන් ඕන කෙනෙකුට විවෘත කරලා තියෙන්නේ.කිසි දෙයක් හංගලා නෑ.මම ඇත්තටම අද නැගිටින්නත් නෙමෙයි සභාපතිතුමිය හිටියේ.ටොයිලට් හදන්න මේ ඊයේ පෙරේදා එක්කෝටි පනස් දෙලක්ෂයක් වියදම් කරලා තියෙනවා.සාධාරණයිනේ.මොකද දැන් මළපහ යන කාලේනේ.දැන් ටිකක් තදින් යන නිසා තමයි කෝටි ගානක් වියදම් කරලා ජාතික උත්සවයට ටොයිලට් හදලා තියෙන්නේ.අපේ 3% කියන එක 1%ට බැස්සුවත් අපි මේකේ දේශපාලනය කරනවා.ඉහළින් තිබ්බත් දේශපාලනය කරනවා.සභාපතිතුමියට මතක ඇති ඇති පිනට ආපු අය කියලා තමයි අපිව මෙතන පාච්චල් කළේ.ඕගොල්ලෝ වගේම අපිත් මේ භූමියේ දේශපාලනය කරනවා.අපේ පක්ෂයේ අද මන්ත්‍රීවරු පහක් ඉන්නවා ඊළඟ එකේදි දෙන්නෙක් වුණා කියලා අපි මොනා කරන්නද ඉතින්.පාරාජිත අදහස හොඳටම හුරු වෙලා තියෙන්නේ අපිට.සීයක් දාන කොට එකයි දෙකයි වැටෙන්නේ.අපිට ඒක හුරුයි.පරාජය කියන එක ඊළඟ සැරේ ආවත් අපි දෝතින් බදාගෙන හිනාවෙනවා.අපිට නැවතත් කියන්න තියෙන්නේ තමුන්ගේ පෞද්ගලික පාවිච්චියට රුපියලක්වත් අරගෙන නෑ කියලා.ඒක අපිට ලොකුවට පේන්නේ නෑ මම කිව්ව පනස් අට දෙනා නිසා.පුටු ටිකක් ගත්තත් අපි මුළු දිස්ත්‍රික්කයටම එක වර තමයි පුටු ගන්නේ.ඒකෙන් තමයි ආසනයට බෙදිලා එන්නේ.අපි හිතමුකෝ අපිට පුටු 10000ක් ඕනේ කියලා අපි දිස්ත්‍රික්කයටම 10000ක් ගන්නවා.ඕගොල්ලෝ කරන්න මහර ආසනයට විතරක් පුටු 500ක් හරි 1000ක් හරි ගන්නවා.මගේ ළඟ පුටු 100යි කැනපි දෙකයි තියෙනවා.ගරු සභාපතිතුමිය, ඔබතුමියට එවපු ලිපියක කොපියක් මට ඇවිල්ලා තිබුණා.විළිඹුල පැත්තට වෙන්න තියෙන තැනක්. මම ඒ තැන හරියට දන්නේ නෑ.පාරක දෙයක්.මේක බලන්න ආවේ නෑ කියලා කෝල් එකක් ආවා.ප්‍රශ්නය තමයි පාරක වතුර ටිකක් ඇවිත් කාණුවකට පිරිලා. පොලිස් නිලධාරියෙකුට සම්බන්ධ තැනක්.මේ නිසා පාර හරහා මඩ පිරෙනවා කියලා තමයි ඒ ලිපියේ ලියලා තියෙන්නේ.මම හිතන්නේ ඒ ලියුමේ තියෙන විදියට ඒක එච්චර ප්‍රශ්න කරන්න ඕන දෙයක් නෙමෙයි.සරලව විසඳන්න පුළුවන් එකක්.ඒක පොඩ්ඩක් බලන්න.අපි අවුරුදු 4ක් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු විදියට හිටියා.පිනට අවුරුද්දක් හම්බුණා කට්ටියටම.දැන් මාස දෙකක් විතර වැඩිවෙලා තියෙනවා. දැන් අපි ඔක්කොම පිං.ඊළඟ සභා වාරයටත් එන්න වෙයි. මම කියන්නේ සභාපතිතුමිය එතනින එහාට මේ රට වෙනස්වීම් වලට යනවා නම් ඒක මේ රටේ මිනිස්සුනේ තීරණය කරන්නේ.එතකොට ඔය හොරකම්, පඩි ගන්න ඒවා මිනිස්සු තෝරයි.කොළඹ ඉඳලා කතරගමට යන බස් එකේ සියලු දෙනාම කතරගමට යන්නෙත් නෑ. මග බහිනවා.අපිට කියන්න බෑ මේක කොහෙන් කෙළවර වෙයිද කියලා.අපි හිතනවා අපිට සුභවාදී කියලා.ඔබ හිතනවා ඔබට සුභවාදී කියලා.මොකද පරාජිත මුහුණකින් අපිට දේශපාලනය කරන්න බෑ.ඡන්ද එකක් තිබ්බත්,ඡන්ද නැතත් මේකේ දේශපාලනය කරන්න ඕන.ඒකට ගරහන කොට අපි චෝදනාකරනවා ඕගොල්ලෝ හොරකම් කරනවා කියලා.ඒවා ස්වභාවික සිද්ධි.සත්‍යයේ රාමුවකට කොටු වෙච්ච එකක් තියෙනවා නම් ඒ ගොල්ලන්ගෙත් ඇති අපෙත් ඇති.අපේ ඉඳලා ගිය ගොඩක් කට්ටිය ඕගොල්ලන් ළඟ ඉන්නවා.අහන්න රුපියලකටවත් වංචාවක් වෙලාද කියලා.එහෙම වුණ දවසක අපිත් මෙතන නැති වෙයි.බොහොම ස්තූතියි.

**(එ) 21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.වාල්ස් රණසිංහ වීරසේකර මහතා:-**

ගරු සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපි අද කතා කරන මොහොත වෙනකොට මමත් දේශපාලනයේ අවුරුදු 32ක් මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරලා තියෙනවා.මමයි නීල් මන්ත්‍රීතුමයි, ධම්මික මන්ත්‍රීතුමයි එක වයසේ.අපි මහජනතාවට විශාල සේවයක් කරලා තියෙනවා.ඒ නිසාම තමයි ජනතාව හැම ඡන්දයකදීම අපිව යම් තැනක තියන්නේ.අපි ඒ පිළිබඳව සතුටු වෙනවා.අද සභාපතිතුමිය මේ පුටුවේ ඉන්නවා.එතුමිය ඉතාම අවංක කෙනෙක්.සත්‍යට වැඩ කරපු කෙනෙක්.ඒ නිසාම තමයි එතුමියට ඒ පුටුව හිමි වුණේ.මම සභාපතිවරයෙක් හැටියට ඉන්න කොට ප්‍රාදේශීය සභාවට චෝදනා ගණනාවක් ආවා. මම ඒවට නිර්භයව මුහුණ දුන්නා. පළාත් සභාවේ පොදුජන පෙරමුණේ මහ ඇමතිවරයෙක් හිටියේ.අපේ රෙජිනෝල් කුරේ. මට චෝදනා 22ක් තිබුණා.එකක් ක්‍රීඩා පිටියක ගැටලුවක්.මෙතුමියගේ දරුවා ලැබිලා දවස් ගානයි.දරුවාව අතින් වඩාගෙන ඒ පරීක්ෂණවලට කොළඹ ගියා.මහ ඇමති කාර්යාලයට ගියා.යන්න පුළුවන් හැම තැනම ගියා.මම එතුමියට දෙන්න පුළුවන් ශක්තිය ධෛර්ය දුන්නා මොකද සත්‍ය වෙනුවෙන් වැඩ කරපු නිසා.සියලු චෝදනාවලට සාක්ෂි දෙන්න මේ විසි තුන්දෙනාම ගියා.ඊට පස්සේ නිදොස් කොට නිදහස් කලා.එක්සත් ජාතික පක්ෂයේ ප්‍රාදේශීය සභාව.හැබැයි අපිව පාලනය කරන්නේ පළාත් සභාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. ඇමතිවරයෙක් හිටියේ.හිටපු නීතිපති මොහාන් පීරිස්. එතුමා තමයි අනිත් පැත්තෙන් කතා කළේ.සාක්ෂි දීලා නිදොස් කොට නිදහස් කරලා ආවා.මේ ප්‍රාදේශීය සභාවේ තියෙන්නේ මිනිස්සු දාඩිය කඳුලෙන් හොයන සල්ලි.නමුත් මේ සල්ලිවලින් අපි පවුල් හදන්න ගියේ නෑ.දරුවෝ හදන්න ගියේ නෑ.අපි වැරදි වැඩ වලට යොමු කළේ නෑ.මේ මුදල් අපිට අනවශ්‍ය විදියට පාලනය කරන්න බෑ.අද රට පක්ෂ දෙකකට තුනකට කැඩිලා. රට ගෙනිච්ච ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය. හැබැයි හැම පක්ෂයකටම චෝදනා ආවා.ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පාලනය කරන කොට එක්සත් ජාතික පක්ෂය ෆයිල් මිටියක් අරගෙන යනවා C.I.D. එකට.නැත්තම් පොලිස් මධ්‍යස්ථානවලට යනවා මේ ගොල්ලෝ හොරකම් කරලා තියෙනවා පරීක්ෂණ කරන්න කියලා.U.N.P. එක පාලනය කරන කොට පොදුජන පෙරමුණේ අය අරන් යනවා.හැබැයි මේ වෙනකන් මේ පක්ෂ දෙකෙන් එක කොටසකටවත් දඬුවම් දීලා නෑ.ඒකත් පිළිගන්න ඕන.රටක් එහෙම වෙන්න බෑ.ඒ නිසා තමයි අපි ඔක්කොටම දේශපාලන එපා වෙලා තියෙන්නේ.අද තමුන්නාන්සේලා දාඩිය කඳුළු හෙලලා ගංවල හැම මිනිහා වෙනුවෙන්ම පෙනී ඉඳලා මළගෙදරට නිදි මරලා හැම දෙයක්ම කරලා තමුන්නාන්සේලාව මිනිස්සු මෙතනට එව්වේ නිකන් නෙමෙයි. ඒ සමාජ සේවය කරපු නිසා.හැබැයි පොඩි මිනිහට තැන නැති කළේ අපේ පක්ෂවල නායකයෝ.ඒක පිළිගන්න. මේ පක්ෂයේ පාලනයට කවුරු ආවත් මේ දේශපාලන හොරකම් කිරීම නතර කරන්න ඕන.මහජන මුදල් ගසාකන එක නතර කරන්න ඕන.ඒක තමයි පක්ෂ දෙකට තියෙන ලොකුම චෝදනාව.ඒ නිසා එන නායකයෝ මේ ගැන අවබෝධයෙන් කටයුතු නොකළොත් මේ රටේ ප්‍රශ්න තව උග්‍ර වෙනවා.සජිත් ප්‍රේමදාස අපේ සම්මේලනයට කැඳවලා මහත්තයා කියලා තියෙනවා අපි සරත් ෆොන්සේලා මැතිතුමාව දාලා ඉදිරියෙදී ඒ කටයුතු කරනවා කියලා.ඒ ගැන ලොකු විශ්වාසයක් තියලා තියෙනවා.කොයි පක්ෂයෙන් හරි කමක් නෑ ඒක කරන්න ඕන.දේශපාලනය එපා වෙලා තියෙන්නේ අන්න එතන.එක්සත් ජාතික පක්ෂයේ අය කියනවා ඒ ගොල්ලෝ 65දි කිව්වා කියලා.71 දි තරුණයන් දාස් ගානක් ජීවිත නැති කළා.88 දි මේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලත් ගිනි තිබ්බා.මේ රටට මේ තරම් දේවල් කළේ කවුද?බස් රථ විතරක් 553ක් ගිනි තිබ්බා.රජයේ වාහන විතරක් 113ක් ගිනි තිබ්බා.තේ කර්මාන්ත ශාලා 73යි.තැපැල් කාර්යාල 18යි.ට්‍රාන්ස්ෆෝමර් 84යි.තමුන්නාන්සේලා මේ ඉන්න ප්‍රාදේශීය සභාවත් ගිනි තිබ්බා.මේ රටට කරපු විනාශය මදිද?හමුදා නිලධාරීන් 209ක් මැරුවා.රාජ්‍ය සේවකයෝ විතරක් 487 දෙනෙක් මැරුවා.ග්‍රාම නිලධාරීන් 98 දෙනෙක් මැරුවා.නීතිඥවරු 10 දෙනෙක් මැරුවා.මාධ්‍යවේදීන් 4යි.එක්සත් ජාතික පාක්ෂිකයෝ විතරක් 1785ක් මැරුවා.තමුන්නාන්සේලා එනවා රට හදන්න.තමුන්නාන්සේලා රට කාලා තියෙන්නේ.ඒවායේ ප්‍රතිඵල තමයි දැන් ඇවිල්ලා තියෙන්නේ.ජනතා විමුක්ති පෙරමුණ රට හදන්න එනවා.මාලිමාව දාපුවහම අලුත් දෙයක්නේ.J.V.P.කිව්වහම ඔක්කොම මතක් වෙනවා.මේ රටට කරපු විනාශය.මේ ගොල්ලන්ට බලය එන්න තව අවුරුදු ගානක් යයි.තමුන්නාන්සේලා ඔක්කොම ප්‍රතිපත්ති වෙනස් කරලා සෙනඟ එකත් කරගෙන.තමුන්නාන්සේලා කියනවා පඩි ගන්නේ නැලු. දැනුත් අත්සන් කළා. තමුන්නාන්සේලා පඩි එපානම් අපේ මුදල් රජයට ගන්න කියලා ලියුමක් දෙන්න.මේ වසර පහට තමුන්නාන්සේලා කියක් අරන් තියෙනවද?හයකෝටි අනූ හය ලක්ෂයක් අරන් තියෙනවා.පක්ෂෙයේ අරමුදලින් සල්ලි අරගෙන මෙතන ඇවිල්ලා කියනවා අපි සල්ලි ගන්නේ නෑ කියලා.තමුන්නාන්සේලාගේ බයිලා මේ රටේ මිනිස්සු දන්නවා.

ඝෝෂා

සභාපතිතුමිය මන්ත්‍රීවරයෙකුට හෙන්වයියා කියලා කියනවා. ඒක ඉල්ලා අස් කරගන්න කියන්න.මගේ අදහස් දැක්වීම මට ඕනේ.ඊට පස්සේ මේ ගොල්ලන්ට කතා කරන්න කියන්න සභාපතිතුමිය.මේකේ මන්ත්‍රීවරයෙක් කතා කරන කොට උත්තර දෙනවා නම් ඊළඟ මන්ත්‍රී තමන්ගේ අවස්ථාවේදී ඒකට උත්තර දෙන්න ඕන.නැතුව මම කතා කරන කොට බාධා කරන්න බෑ. මේ ගොල්ලෝ කිසි දෙයක් ගන්නේ නෑ කියලා මේකේ තියෙන ටෙලිෆෝන් පහක් ගත්තා.රුපියල් 50,000 ගානේ.එහෙනම් ලියුමක් ලියලා දෙන්න තිබුණානේ අපිට

රජයේ සල්ලිවලින් දෙන දේවල් එපා කියලා. මේ ගොල්ලෝ කොලේ අත්සන් කරලා පඩි අරගෙන පත්තරේටයි හැම තැනටම කියනවා අපි පඩි ගන්නේ නෑ කියලා.මොන බයිලද මේ ගහන්නේ.මේ රට කාලා විනාශ කරලා, මේ රටේ තියෙන දේපළ විනාශ කරලා මේ ප්‍රාදේශීය සභාවත් ගිනි තියපු මිනිස්සු මේ.අපේ මුදුන් මල්කඩ ලෙස සලකන්නේ නුවර දළදා මාළිගාව.මේකටත් බෝම්බ ගහපු උන්නේ මේ කතා කරන්නේ.දළදා මාළිගාව, බෞද්ධයා බොහොම ගරුත්වයෙන් සලකන ස්ථානයටත් බෝම්බ ගැහුවානේ.L.T.T.එකේ ගැහුවේ ඊට පස්සේ.සභාපතිතුමිය මම සන්තෝස වෙනවා 1991 ඉඳලා මේ වෙනකන් අපෙන් ලොකු සේවාවක් වුණා.මම ඒවා මතක් කරනවා.1991 කඩවත නගරයේ කිසිම තැනක ජලය තිබුණේ නෑ.ප්‍රේමදාස මහත්තයා කඩවතට එන වෙලාවේ කෝටි 2800ක් වෙන් කරලා මහා ව්‍යාපෘතියක් ගෙනල්ලා මේ පළාතට වතුර ගෙන්න මට පුළුවන්කම ලැබුණා.රෙජිනෝල් පෙරේරා ඉන්න කාලේ ඒක කළා.ඒ ගැන මම සන්තෝස වෙනවා.ගමට ක්‍රීඩා පිටියක් හැදුවා.අපි යහපත් කටයුතු කළා.අපිට වැරදුණ තැන් තිබුණා.අපි හරි දේ කතා කළා. ඒ නිසා ඔබතුමිය අද සභාපතිතුමිය හැටියට ඉන්නවා.ඔබතුමිය මගෙත් එක්ක හිටපු කාන්තාවක්.හොඳ දක්ෂ විදියට නීතිගරුක විදියට කටයුතු කරපු කෙනෙක්.එන සභාවේ ඉඳලා අපි නොහිටින්න පුළුවන්. පිට ඉඳගෙන හරි අපිට ඔබතුමියට දෙන්න පුළුවන් දේ අපි දෙනවා. අපි 1991 ඉඳලා ආඩිය කඳුළු හෙලුවේ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන්.අපි මුළු ලංකාවේම හැම දිස්ත්‍රික්කයේම පක්ෂයේ සංවර්ධන කටයුතු කළා.අපි කඳු නැග්ගා.පල්ලම් බැස්සා.නමුත් අපේ නායකයින්ගේ තිබුණ එකමුතුකම නැති නිසා අපිට ඇඟිල්ල දික් කරන්න එපා.මොකද අපි එක්සත් ජාතික පක්ෂයේ තමයි.අදටත් අපි එක්සත් ජාතික පක්ෂයේ තමයි ඉන්නේ.අපිට ලියුම් එවලා තියෙනවා අයින් කරනවා කියලා. අපිව අයින් කරන්න සුදුසු මිනිස්සුද කියලා නැවත බලන්න.අපි පක්ෂ මාරු කරපු අය නෙමෙයි.අපි පක්ෂය වෙනුවෙන් දරදිය ඇද්ද මිනිස්සු.නායකයෝ විවේචනය කරපු අය නෙමෙයි.අපි නායකයින්ට ගරහපු මිනිස්සු නෙමෙයි.අපි නායකයෝ එක්ක වැඩ කරපු අය.රෙජිනෝල්ඩ් පෙරේරා, කමල් ජයකොඩි හැම කෙනෙක් එක්කම මම වැඩ කළා. ඔබතුමියගෙන් මළ ගේකට හට් එකක් පුටුවක් ඉල්ලුවා නම් මට කියනවා කියලා ගෙන්නගන්න කියලා.ඔබතුමියට බොහොම ස්තූතියි.අපි කියපු හැමදේම ඔබතුමියට කරන්න බැරි වුණා.නමුත් අපි ඉල්ලපු විශාල කොටසක් ඔබතුමිය කළා.ඔබතුමියගේ පාලන කටයුතු හොඳින් කෙරුණා.අපිත් සහයෝගය දුන්නා.අපි එතන තමයි ඉන්න ඕන. අපේ වම්ලිට, රොහාන් රොයිස්ට ඊළඟ සභාවට එන්න පුළුවන් වෙයිද දන්නේ නෑ. මාස ප්‍රාදේශීය සභා ඡන්දය මාස හයක් විතර කල් යයි කියලා මට හිතෙනවා. ජාතික මැතිවරණයක් වෙන්නත් පුළුවන් මහා මැතිවරණයක් වෙන්නත් පුළුවන්. උසාවි තීන්දුවත් එක්ක අපි ඒක බලමු.කොහොම හරි ඔබතුමියට තව මාස හතරක් පහක් මේ සභාව ගෙනියන්න පුළුවන් වෙයි කියලා මම විශ්වස කරනවා.ඒ කාලය තුළත් ඔබතුමියට යහපත් දේ කරන්න පුළුවන්.ඔබ හැමෝටම බොහොම ස්තූතියි.

**(එ) 22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය ලාහුගල සුමනසාර හිමි:-**

ගරු සභාපතිතුමිය, සභාව තිබුණ අවුරුදු 5ක කාලසීමාව තුළ සභාව තුළ කිසිම කෙනෙක් පරුෂ වචනයක්වත් කිව්වේ නෑ.මේ සභාව ඉතාමත් සතුටු මට්ටමක තියෙනවා.කවදාවත් අපි ගැටුමක් ඇති කර ගත්තේ නෑ.බහින්බස් වීමක් වුණේ නෑ. අපි ප්‍රකාශ කරන්නේ සත්‍ය හෝ අසත්‍ය හෝ වේවා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ඕන කෙනෙක්ට තියෙනවා.මේක උත්තරීතර සභාවක්.මේ සභාවෙන් මහර ජනතාව තමයි නියෝජනය කරන්නේ.අපිට යම් යම් ගැටලු තියෙනවා නම් තමන්ගේ කතා වාරයේදී ඒ ගැටලු ඉදිරිපත් කරලා ඒ සඳහා විසඳුම් ලබා ගන්න ඕන.අතුල මන්ත්‍රීතුමා කතා කරලා කිව්වා අපි දේශපාලනය කරපු හැටි.අපි දෙන්නාටම එකම වර්ගයේ කාර් දෙකක් තිබුණේ.හිරිපිටිය හංදියේ අපි දෙන්නා වාහන දෙක නවත්තලා අපි කතා කරනවා.අපි දෙන්නා පක්ෂ දෙකක.මගේ ප්‍රතිවාදියා විදියට හිටියේ ජයතිස්ස මහානාම මහත්තයා.අදටත් ඒ සර් මාත් එක්ක හොඳයි.අපි කිසිම කෙනෙක් කිසිම වෙලාවක විවේචනය කර ගත්තේ නෑ.මහත්මා දේශපාලනය කියන්නේ ඒකටයි.අදටත් මම මගේ ප්‍රතිවාදීන් සමඟ මේ වෙනකන් ගැටුම් ඇති කරගෙන නෑ.අපි සියලු දෙනාම ඇවිල්ලා ඉන්නේ මහජනතාවට සේවය කරන්න නම් අපි ගැටුම් ඇති කරගන්න අවශ්‍ය වෙන්නේ නෑ.මෙතනින් කී දෙනෙක් මහර ප්‍රාදේශීය සභාවට එයිද නොඑයිද කියලා දන්නේ නෑ.සමහර අය අධි තක්සේරුවෙන් ඉන්නේ.මම කියන්නේ මුලින්ම ජ්‍යෝෂ්ඨත්වයට ගරු කරන්න කියලා.අපි වුණත් නීල් මන්ත්‍රීතුමාලා, වාල්ස් මන්ත්‍රීතුමාලා කතා කරන කොට අහගෙන ඉන්නවා.අපි නොදන්න කරුණු මෙතන කියනවා.ඒවා අපි අහගෙන ඉන්නවා.මොකද මේ ජ්‍යෝෂ්ඨයෝ නිසා.කොයි වෙලාවකවත් අපි ඒවට බාධා කරන්නේ නෑ.අපි ඒවට බාධා කරන්නත් හොඳ නෑ. මොකද ඒ ගොල්ලෝ විසි ගානක් තිස් ගානක් මේ සභාව නියෝජනය කළා නම් මේ පිළිබඳව දන්න මිනිස්සු.මිනිස්සුන්ගේ අතේ තමයි ඡන්දේ තියෙන්නේ. ඒ ගොල්ලෝ අන්තිම මොහොතේ තීරණය කරයි කාටද දෙන්නේ කියලා.ලබන සභා වාර තියෙයිද නැද්ද අපි දන්නේ නෑ.සමහර විට නම වෙනිදා ඡන්දයක් එනවා.අපි සියලු දෙනා මේ රටේ ජීවත් වෙන්න ඕන.අපි එකිනෙකා හමු වෙන්න ඕන.කතා බහ කරන්න ඕන.හොරකමට අපි එදත් විරුද්ධයි අදත් විරුද්ධයි.අපිට සතුටු වෙන්න පුළුවන් මට්ටමකට අපි අපේ කොට්ඨාශයේ වැඩ කරලා තියෙනවා.ඉහළ නායකයෝ ගත්ත තීන්දු තීරණවල ගැටලු තියෙනවා.මම ගැන කතා කළොත් ඒ දුන්න පඩිය මම ගත්තා.මුල්ම පඩියෙන් මම කිණිගම රජගහවත්ත බුදු මැදුරට ලයිට් අරන් දුන්නා.ඒ වගේ ගෙවල් දෙකකට ලයිට් අරන් දීලා තියෙනවා.ගිනිගත්ත ගෙවල් දෙකකට ආධාර කරලා තියෙනවා.දන්සල්වලට දුන්නා.ළමයින්ගේ එක එක තරුණ සංවිධාන තියෙනවා

ඒවට දුන්නා.කොරෝනා වසංගතයේදී අපි එක එක ද්‍රව්‍ය ආධාර බෙදුවා.මට අදින්න සිවුර ලැබෙනවා. දානේ ටික දායකයන්ගෙන් ලැබෙනවා.හැමදේම හම්බෙනවා.හැබැයි ඔය රු.16000 කියන එකෙන් නම් ජීවත් වෙන්න අමාරුයි.මම හිතුවෙත් ප්‍රාදේශීය සභාවේ මිනිස්සු හොරකම් කරනවා කියලා. නමුත් මෙතනට ආපුවහම තමයි තේරුනේ එහෙම දෙයක් කරන්න බෑ කියලා.අපේ අය සමහර වෙලාවට කියනවා මේ ලයිට් එක දාන්න එපා මේ තැන ඉන්නේ U.N.P.එකේ අය කියලා.හැබැයි මම කියන්නේ ඒ පහත් දේශපාලනය කරන්න එපා කියලා ඒ තැන්වලටත් දාන්න කියලා.පාරවල් එහෙම හදන කොට කියනවා මේ පාරේ තනිකර ඉන්නේ U.N.P. අය හදන්න එපා කියලා.මම ප්‍රාදේශීය සභාවට තරහ කරන්නේ නෑ. මොකද අලුත් කෙනෙකුට මම අවස්ථාවක් දෙනවා.මම මේ කියන්නේ මගේ පුද්ගලික මතය.පිළිකුත්තුව ප්‍රදේශයේ මට තිබුණ අභියෝග මේ කාටවත් තිබුණේ නෑ.මම අලුතෙන්ම තමයි කොට්ඨාශයට ගියේ.පළවෙනි රැස්වීමේදී මට ආවේ ගල්මුල් ප්‍රහාර.එදා තමයි මම තීරණය කළේ අනිවාර්යෙන්ම ඡන්දේ ඉල්ලනවා කියලා.අභියෝග කියන ඒවා ජීවිතේට හරි රසවත්.කවදා හරි ඒවා අනාගතයේදී අපිට ලොකු පන්නරයක් වෙනවා.අභියෝගයක් ආපු හැම තැනකම හොඳ පන්නරයක් තියෙනවා.මට ලොකු අභියෝග ආවා. මම ඒ සියල්ල ජයග්‍රහණය කළා.කොට්ඨාශයේ ඉපදුන, උපන් දා ඉඳන් සමිති සමාගම්වල හිටපු හැමෝම පරාජය කරලා පිටින් ආපු හාමුදුරුවෝ දිනෙව්වා. ඒ දිනන්න හේතුව තමයි සත්‍ය ජය ගන්නවා කියන එක.අපි හරි දෙයක් කළොත් හරි දේ ජයග්‍රහණය කරනවා.පිළිකුත්තුව කොට්ඨාශයේ පළවෙනි මන්ත්‍රීවරයා හැටියට මම අද ආඩම්බර වෙනවා.මම මහර ප්‍රාදේශීය සභාවෙන් විශාල වැඩ කොටසක් කළා. මම කිසි දෙයක් නැවත නැවත කියන්නේ නෑ.ගෙවල් විශාල ප්‍රමාණයක් හැදුවා.විශාල කැප කිරීම් කළා.නමුත් යම් කිසි තැනක හිර වුණා. ඒකට අපි කාවටත් සමාව දෙන්න බෑ.මේ ගැන ජනතාව තීරණය කරයි.බලන්නකෝ මේ පාර ඡන්දෙදි මොකද වෙන්නේ කියලා.ඒ නිසා අපි මෙච්චර කල් පවත්වා ගෙන ආපු සභාව ගැටුමකින් නිමා කර ගන්න යන්න එපා. අපි සුහදශීලීව මේක අවසන් කරමු.ජ්‍යෙෂ්ඨත්වයට ගරු කරන්න කතා කරන කොට අවස්ථාව දෙන්න.මගේ කතාව මම මීට වැඩිය දීර්ඝ කරන්න යන්නේ නෑ.මම හිතන්නේ මේක අපේ අවසාන සභාව වෙයිද දන්නෙත් නෑ.සියලුම දෙනාම ඉතාමත් සහයෝගයෙන් මේ සභාව තුළ කටයුතු කළා.ඒ නිසා ඡන්දේ දෙන කොට පොදුජන පෙරමුණේ කියලා බැලුවේ නෑ. හැමෝම සභාපතිතුමියගේ ජයග්‍රහණයට ඡන්දේ දුන්නා.බෞද්ධයෙක් නොවුනත් කවුරු හරි කතා කරන කොට අපි විවාද කරන්න හොඳ නෑ.අපේ සයිෆුල් මන්ත්‍රීතුමා කතෝලික ආගමේ. කොයි වෙලාවකවත් නැගිටලා කෑ ගැහුවේ නෑ.බාධා කළේ නෑ.අපි ඡන්දේ ඉල්ලුවේ නැතත් අපි මොකක් හරි මතයක ඉන්නවා නම් ඒ මතය ජයග්‍රහණය කරවනවා.මේ ගැටලුව නිරාකරණය කිරීමට ජනතාවට භාර දීලා තියෙන්නේ.කවුරුත් මෙතන බැනගන්න යන්න ඕන නෑ.මම අවවාදයක් පමණයි දෙන්නේ නියෝගයක් දෙන්න මට බෑ.මේ 2023 වර්ෂයේ ඔබගේ ප්‍රාර්ථනා බලාපොරොත්තු ඇති ඒ සියල්ලක්ම සුබිත මුදිත තත්ත්වයට පත් කර ගැනීමට ඒ වගේ අපි විශ්වාස කරන තුණුරුවන්ගේ දෙවියන්ගේ ආශිර්වාදය ලැබෙන්න කියන ප්‍රාර්ථනාව කරමින් නැවතත් සියලු දෙනාම සහයෝගයෙන් කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා සියලු දෙනාටම තුණුරුවන් සරණයි.

**(එ) 23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චම්ලි ලියන වඩුගේ මහතා:-**

ගරු සභාපතිතුමියනි, 2006 වසරේ අපි මුලින්ම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු හැටියට තමයි මේ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් වුණේ.අද අපේ අවසන් සභා වාරය වෙන්න පුළුවන්.අපි එක්සත් ජාතික පක්ෂයෙන් හැම සැරේම අපේක්ෂකයෝ විදියට ඉදිරිපත් වෙලා තමයි මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කළේ.ඒ හැම අවස්ථාවකදිම හොඳ තරුණ අපේක්ෂකයෝ ඉදිරිපත් වෙලා මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු විදියට පත් වෙලා ආවා.නමුත් අපට දීර්ඝ කාලයක් විපක්ෂයේ දේශපාලන කටයුතු සිදු කිරීම හේතුවෙන් සභා වාර එකකට දෙකකට වගේ සීමා වුණා.අපේ වාල්ස් මන්ත්‍රීතුමා තමයි විපක්ෂයේ ජ්‍යෙෂ්ඨම කෙනා විදියට අන්තිමට ඉතුරු වුණේ.නමුත් අපි එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු විදියට පත් වුණත් අපි පක්ෂ නායකයින්ට අදටත් විවේචන ඉදිරිපත් කරන්නේ නෑ.අපේ ව්‍යාපාරවලින් අපි දුක් මහන්සියෙන් උපයපු මුදල් ලක්ෂ ගණන් දේශපාලනයට වියදම් කළා.මම කවදාවත් එක්සත් ජාතික පක්ෂයෙන් මැතිවරණයටවත් මුදල් ප්‍රතිපාදන අරගත්තේ නෑ.නමුත් අපි ඒ දේවල් උපරිමයෙන් කළා.සභාපතිතුමියත් දන්නවා ඇති අපි දේශපාලනයට මුලින්ම එන කොට වාහන හතළිහක් පනහක් අපේ මිත්‍රයොත් එක්ක ඇවිත් අපේ මුදල් වියදම් කරගෙන රෑ නිදි මරාගෙන පයින් ඇවිදලා අපි ඒ හැම දෙයක්ම කළා.සමහර වෙලාවට මම විවාහ වුණාට පස්සේ මගේ බිරිඳ කියනවා ඔයා පෙර ආත්මෙක ලොකු පවක් කරලා තියෙනවා කියලා.එතුමිය කවදාවත් දේශපාලනයට සම්බන්ධ වුණේ නෑ.එතුමිය කොළඹ පාසලක ඉගෙන ගත්තු කෙනෙක්.එහෙම කියන්න හේතුව තමයි සමහර වෙලාවට හැන්දෑවේ ගියහම අපි එන කොට පාන්දර හතර පහ වෙනවා.මම දාඩිය පෙරාගෙන ඇවිදිනවා දකිනවා.අපි එහෙම පක්ෂයට උදවු කළා.අපේ දුක් මහන්සියෙන් හම්බ කරපු මුදල් අපි ඒ පක්ෂයට වියදම් කළා.මට මතකයි 2004 මම මහර ආසනයේ සාමාජික ප්‍රවර්ධන කළමනාකරු විදියට හිටියා.ලංකාවෙන් වැඩිම ප්‍රමාණයක් සාමාජිකත්වය ගත්තේ මහර ආසනයේ.ඒවටත් අපි කැප කළේ අපි දුක් මහන්සියෙන් උපයපු මුදල්.අපි පක්ෂයට ඒ විදියට අපි උදවු කළා.අපිට ඒ පක්ෂයෙන් ඡන්දයට ඉදිරිපත් වෙලා කටයුතු කරන්න අවස්ථාව ලබා දුන්නා.අපි ඒ නායකයින්ට මුකුත් කියන්නේ නෑ.ගම්වල ඉන්න අපේක්ෂකයින්ගේ කර මතින් ගියපු නායකයෝ විශාල

වශයෙන් මහජන දේපළ කොල්ලකාපු අය හිටියා.නමුත් ඒවට දඬුවම් ලැබුණේ නෑ.ඒක මේ රටේ හැම දේශපාලන පක්ෂයකම ඉන්නවා.ඒකනිසා තමයි අද මේ දේශපාලනය මහා ව්‍යාකූල තත්ත්වයට පත් වෙලා තියෙන්නේ.ඒ වගේම මේ ප්‍රාදේශීය සභා කාල සීමාව තුළ විපක්ෂයේ දේශපාලනය කරපු නිසා අපි ගේ ඉස්සරහින් ගිහින් බැන බැන ඉඳලා කවදාවත් කුස්සිය පැත්තෙන් රිංගපු මන්ත්‍රීවරු නෙමෙයි.අපි ඒවා කළෙත් බාධා කරන්න නෙමෙයි.ඒවායේ හොඳ දේවල් අපි ප්‍රශංසා කළා.අවුරුදු විස්සකට අධික කාලයක් පළාත් පාලන අපි මන්ත්‍රීවරු විදියට ඉන්න කාලසීමාව තුළ මම අද බොහොම විවෘත ඉල්ලීමක් කරනවා කාගෙන්හරි රු.50ක් හරි 100ක් හරි 200ක් හරි කොන්ත්‍රාත්කාරයෙක්ගෙන් හරි නැත්තම් මොනවා හරි වැඩක් කරලා දීලා කාගෙන්හරි මුදලක් ඉල්ලුවා කියලා හරි එහෙම කවුරු හරි මේ සියලුම පක්ෂ රජයෙන් ගත්ත මුදල් නැවත රජයට භාර දීලා සියලුම දේශපාලන ක්‍රියාකාරකම්වලින් ඉවත් වෙලා ගෙදරට වෙලා ඉන්නවා.අපි මෙතන විවිධ මත ඉදිරිපත් කළත් අපි ගම්වලට ගිහින් අපේ ඥාතීන් අසල්වාසීන් එක්ක සුහදව ඉන්න ඕන.අපිට කලින් මේ ප්‍රාදේශීය සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරු අද මේ සභාවේ නැති මන්ත්‍රීවරු අද ගම්වල බොහොම අසරණ විදියට තමයි ජීවත් වෙන්නේ.අපි මෙතන මොන වාද විවාද කර ගත්තත් ඇත්තටම අපිට ලැබෙන ප්‍රතිලාභයක් නෑ.නමුත් අපි යම් යම් දේශපාලන පක්ෂවල මතය වෙනුවෙන් ඉදිරිපත් වෙලා ඇවිත් මෙතන අදහස් ප්‍රකාශ කරලා ඒ පක්ෂවලට ලැදිව අපි කටයුතු කරනවා.ඒක වෙනම දෙයක්.ඒ වගේම මේ රට විවිධ ආගමිකයන් ඉන්න රටක්.හැම ආගමකම උගන්නන්නේ ඉතාමත් හොඳ දහමක්. සියලු දෙනාට උදවු කරන්න සාමයෙන් මෛත්‍රියෙන් ඉන්න කියන එක.කලාපයේ අනිකුත් රටවල් එක්ක ගත්තහම අවස්ථා ගණනාවකදි මේ රටේ ජීවිත විශාල වශයෙන් විනාශ වුණ රටක්. නමුත් අපි පන්සලට යනවා.පල්ලියට යනවා.කෝවිලට යනවා.නමුත් අපේ සමාජය මේ දේවල පිළිපැද්දේ නෑ.විශාල වශයෙන් තරුණ ජීවිත මේ රටේ දැන උගත් බුද්ධිමතුන්ගේ ජීවිත විශාල වශයෙන් විනාශ වුණ රටක් වශයෙන් තමයි අපි ලෝකය හමුවේ ඉන්නේ.අදත් ප්‍රාදේශීය සභාවේ විවිධ ගැටලුකාරී මත ගැටුම් ආවා.විශේෂයෙන්ම මම ධර්මාලෝක විද්‍යාලයේ හයේ පන්තියේ ඉගෙන ගන්න කොට අපි ගෙදර යන කොට කිරිබත්ගොඩ ගාල හංදිය ප්‍රදේශයේදී අපි ගියපු බස් රථයට ගිනි තිබ්බා.ඒවා මේ රටේ සිදු නොවිය යුතු දේවල්.නමුත් අපිට වඩා වයසින් වැඩි අය ඊට කලින් වකවානුවල සිදු වුණ සිදුවීම් කියයි.මේ රටේ යම් දේපළක් කොල්ල කෑවා නම් හරි භීෂණකාරී විදියට විනාශ කළානම් හරි ඒ හැම දේකටම අපි වග කියන්න ඕන.විශේෂයෙන්ම ඒ භීෂණ කාලය තුළ මම දැක්කා අපේ ඇඹරලුව පාසලේ විදුහල්පතිතුමා, ඒ වගේම අපේ පියරතන ස්වාමීන් වහන්සේගේ පන්සල ඉදිරිපිට නන්දන කියන තරුණයා, ඒ වගේම එතන බේකරි හිමි සේකර කියන කෙනා දණ ගස්සලා වෙඩි තියලා ඝාතනය කළා.මම උදේ හත හමාරට අටට යන කොටත් බලාගෙන යනවා.ඒ පවුල් එතනින්ම විනාශ වුණා.මොකද ඒ පවුල්වල දරුවන්ට අම්මාවරුන්ට එතනින් එහාට ජීවත් වෙන්න ආර්ථිකයක් නෑ.ධර්මාලෝක විද්‍යාලයේ අපි ඉගෙනගන්න කොට ප්‍රධාන ශිෂ්‍ය නායකයා ළිඳ ළඟ නනා ඉන්න කොට පිහියෙන් ඇණලා මරලා දැම්මා.මගෙත් එක්ක අල්ලපු පුටුවේ හිටපු ශිෂ්‍යයා අද පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්වරයා.ඔහුත් මේ වගේ කීර්තිමත් පුරවැසියෙක් වෙන්න හිටපු කෙනෙක් වෙන්න පුළුවන්.ඒ වගේ අය අපිට අහිමි වුණා.මොන දේශපාලන පක්ෂවල වුණත් අපි භීෂණයට විරුද්ධ වෙන්න ඕන.අපි මොන විදියට තර්ක විතර්ක කළත් අපි ප්‍රාදේශීය සභා කාල සීමාව තුළ ගත්තහම මීට පෙර කාල සීමාවට වඩා පොඩි පොඩි මත ගැටුම් ඇති වුණා.ඒ සභිකයන් වැඩි නිසා වෙන්න පුළුවන්. අලුතින් පත් වෙලා එන මන්ත්‍රීවරුන්ට මම කියන්නේ මේ සභාවේ ගරුත්වය, මහර ප්‍රාදේශීය සභාව කියන අභිමානය තියාගෙන ඉදිරියටත් වැඩ කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.ඇත්තතෙන්ම මම මේ ප්‍රාදේශීය සභාවේ අඩුම ඉල්ලීම් කරපු මන්ත්‍රීවරයා වෙන්න ඇති.රු.16000ක දීමනාව අපි ගත්තට ඒ දීමනාව වගේ තුන් හතර ගුණයක් අපි අපේ ප්‍රදේශ වෙනුවෙන් වියදම් කරලා තියෙනවා.අපේ ප්‍රදේශවල වීථි ලාම්පු සිය ගණන් දාලා තියෙනවා. නමුත් ප්‍රාදේශීය සභාවෙන් එකකවත් ඉල්ලලා නෑ.ඒවට අපි දුක් මහන්සියෙන් හම්බ කරන මුදල් තමයි අපි යොදා ගත්තේ.කොරෝනා වසංගතය කාලේ මම මගේ කොට්ඨාශයට සහල් කිලෝ දහ දහක් බෙදුවා.නමුත් මම කිසිම කෙනෙක්ගෙන් ආධාර උපකාර ගත්තේ නෑ.නමුත් අද එහෙම කරන්න ගියා නම් අපේ ගෙවල් දොරවලුත් විකුණන්න වෙනවා.ඒ වගේ අපි දුක් මහන්සියෙන් පොඩි කාලේ උපයා ගත්ත දේවල් තමයි මේ දේශපාලනය වෙනුවෙන් යෙදෙව්වේ.කවුරු හරි දුකක් කරදරයක් කියාගෙන ආපුවහම අපි කවදාවත් හිස් අතින් යැව්වේ නෑ.මෙතන තියෙන දේශපාලන පක්ෂවල විවිධ මත තියෙනවා.ඉදිරියටත් හොඳ සභිකයින් විදියට වැඩ කටයුතු කරන්න කියල ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා ස්තුතියි.

**(එ) 24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ.ර්වා ශ්‍රීයානි මහත්මිය:-**

ගරු සභාපතිතුමියනි, අපි සභාවේ හමුවෙන අන්තිම දවස වෙන්නත් පුළුවන් නොවෙන්නත් පුළුවන්.තව ටික කාලයක් අපි ඉන්නත් පුළුවන්.අද මම කතාවක් කරන්නේ නෑ කියලා තමයි හිටියේ.ඒ වුණාට සභාවේ සිද්ද වුණ දේවලුත් එක්ක මටත් කතා කරන්න ඕනේ කියලා හිතුනා.මම මෙච්චර කාලයක් නොකියා හිටපු දේවල් ලැජ්ජාවක් නැතුව කියන්න ඕනේ කියලා මට හිතුනා.මගේ මහත්තයත් මේ සභාව නියෝජනය කරපු කෙනෙක්.නමුත් මේ සභාවේ රණ්ඩු සරුවල් වුණා කියලා ඒ කාලේ අහලත් නෑ.මම ආපු කාලේ අහලත් නෑ.සභාවේ අසභ්‍ය විදියට කතා කරනවා කියලා ඒ කාලේ අහලත් නෑ.නමුත් දැන්නම් අපිට ඒවා අහන්න වෙලා තියෙනවා.අනූ එකේ

ඉඳලා මේ සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්ට හෙන්වයියා කියපු කතාවට මම නම් විරුද්ධයි.අපි දෙගොල්ලොත් ඉන්න පක්ෂ දෙකක නමුත් අපි කවදාවත් එතුමාට ඒ විදියට අගෞරව කරලා නෑ.මමඋසස් පෙළ කරන කාලේ ට්‍රාන්ස්ෆෝමර් කඩලා ලයිට් නැතුව හරි අමාරුවෙන් තමයි පාඩම් කළේ.1989 අගෝස්තු 22 කියන්නේ මේ මුළු ලංකාවෙම රෝහල් වහපු දවසක්.ලයිට් තිබුණෙ නැති දවසක්. මමත් ඒ අත්දැකීමට මුහුණ දුන්න නිසා ඒක මට අද වගේ මතකයි.21 ර මට අමාරු වුණා.නමුත් මම ඉවසගෙන ඉඳලා 22 වෙනිදා උදේ තමයි අමාරුයි කියලා කිව්වේ. මොකද ර ගිහින් මගේ මහත්තයාට කරදරයක් වෙයි කියලා හිතපු නිසා.මම ක්ලිනික් ගියේ ජයවර්ධනපුර රෝහලට. අපි ඒකට ගියහම ඉස්පිරිතාලෙට අද කවුරුත් භාර ගන්නේ නෑ කියලා කිව්වා.වෛද්‍යවරු නෑ කිව්වා.රෝහල වහලා කිව්වා.ඊට පස්සේ රෝහල් ගණනාවකට ගියා.එක රෝහලකටවත් අපිව ඇතුළත් කර ගත්තේ නෑ.අන්තිමට පානදුර කේතුමතී එකට ගියා.ඒකටත් ඇතුළත් කරගන්න බෑ කිව්වා.ඊට පස්සේ අපිට ආරංචියක් ආවා කොළඹ සොයිසා ළමා රෝහලේ හතේ වාට්ටුව විතරක් ඇරලා තියෙනවා ගිහින් බලන්න කියලා.මට එතකොට හොඳටම අමාරුයි.අපි හතේ වාට්ටුවට යන කොට එකම එක ඩොක්ටර් කෙනෙක් හිටියා.නර්ස්ලා දෙන්නයි ඇටෙන්ඩන්ට්ලා දෙන්නයි වාට්ටුවේ හිටියා.ලේබර් රූම් එක වහලා කිව්වා.මහත්තයාට කිව්වා ඔන්න ඔහෙන් තියලා යන්න කියලා.කාටහරි දුක හිතිලා මාව ගිහින් ඇඳකට දැම්මා.මට එහා පැත්තේ තව ගෑනු කෙනෙක් හිටියා.එයාට බබා හම්බෙන්න ඇවිල්ලා එයාගේ බබා ගන්න කෙනෙක් නැතුව එයාගේ බබා නැති වුණා.ඊළඟට ඒ ඇඳටම අම්මා කෙනෙක් දැම්මා. ඒ ළමයත් නැති වුණා.මටත් බයක් ආවා එතකොට.තව අම්මෙකුයි දරුවෙකුයි බේර ගන්න බැරි වුණා.දැන් මටත් බබා හම්බෙන්න එනවා.නර්ස් බය වෙලා කෑ ගැහුවා මේ අම්මටත් අමාරුයි කියලා.එතකොට ඩොක්ටර් මගේ ළඟට ආවා.ඇවිත් බබා ගත්තා. බබා කකුල් දෙකෙන් හෙල්ලුවහම බබා කෑ ගැහුවේ නෑ.මම දන්නේ මම ඇඳේ ඉන්නවා කියලා විතරයි.පාන්දර පහට කිව්වා ඔයාට බබත් අරන් ගෙදර යන්න පුළුවන් කියලා.මගේ මහත්තයා බහ වෙනකොට මගේ ළඟට ආවා.මම බබත් අරනේ එනකොට තමයි දැන්නේ වැඩි හරියක් බබාලා හම්බෙලා තියෙන්නේ බිම කියලා. ඒ වාට්ටුව හරියට මස් කඩයක් වගේ.පැය ගානයි බබා හම්බෙලා අම්මා කෙනෙකුට හැබැලා යන්න පුළුවන් අවස්ථාවක් නෙමෙයි ඒ.මට කලන්තේ හැදුනා.අම්මා මාවත් හිරකරගෙන බබාවත් හිරකරගෙන මාව මළකඳක් වගේ තමයි ගෙදරට අරන් ආවේ.එහෙම දුක් විඳලා ඒ දරුවව අරගෙන ගෙදර ඇවිල්ලා මට ගෙදර ඉන්න හම්බුණේ නෑ.මගේ මහත්තයා ව්‍යාපාරයක් කළා. ඒ වගේම එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් විදියට වැඩ කළා.හවසට කඩේ වහලා උදේට කඩේ අරින්න යන කොට ලියුමක් දාලා තිබුණා කඩේ වහන්න කියලා.එයත් තරුණ වයසේ කියන දේ ඇහුවේ නෑ කඩේ ඇරියා.රෑට එනවා මරන්න.එහෙම යුගයක තමයි අපි J.V.P.එකත් එක්ක ජීවත් වුණේ.දරුවත් එක්ක අපි රෑට ගෙදර ඉන්නේ නෑ.එක්කෝ අපි කොහේ හරි ගෙදරක. එහෙම නැත්තම් කැලේක.අපි ඒ වගේ අවාසනාවන්ත යුගයකට මුහුණ දුන්නා.මම මේවා කවදාවත් කියලා නෑ.

සෝෂා

මේවා අහන්න බැරි කෙනෙක් ඉන්නවා නම් එළියට බැහැලා ගියත් මට කමක් නෑ.කාන්තාවකගේ අදෝනාවක් මේ කියන්නේ.බොරු කතා ඕන නෑ.තරුණයෝ ඔය යුගයට ගිහිල්ලා නෑ.මේ ගැන නොදන්න තරුණයෝ මිනිස්සු මුලා කරගෙන හිටියට මේ ගැන දන්න මිනිස්සු මුලා කරන්න වෙන්නේ නෑ.ඇත්තටම මේ රාජ්‍ය ආයතනවල සේවකයින්ට මුදල් ගෙවන්න නැති වෙලාවේ රාජ්‍ය ආයතන මෙච්චර ආමාරුවෙන් දුවන කාලේ මම කැමති නෑ ප්‍රාදේශීය සභා මැතිවරණයකට යන්න.එහෙමනම් මේ ගොල්ලෝ ජනාධිපතිවරණයක් මහ මැතිවරණයක් ඉල්ලන්න ඕන.මේ ආණ්ඩුව භාර ගන්න කියලා ගෝඨාභය මහත්තයා ඔක්කොටම ආරාධනා කළා.මම එතුමාට ගරු කරනවා. එතුමාට බැරි දේ එතුමා භාර දීලා ගියා.ඒක බදාගෙන හිටියේ නෑ.තවත් ජනතාව අපහසුවට පත් කළේ නෑ.ඒ වෙලාවේ කවුරුත් රට භාර ගත්තේ නෑ. ඔක්කොම බය වෙලා දිව්වා.වර්තමාන ජනාධිපතිතුමා නොබියව රට භාර ගත්තා.එතුමා කිව්වා අපි එකතු වෙලා අවුරුද්දක් යමු කියලා.ඊට පස්සේ අපි ඡන්දයක් ගැන බලමු කියලා.ඒකට කවුරුත් කැමති වුණේ නෑ.දැන් කියනවා අලියෙක්ගේ නැට්ටේ පොහොට්ටුවක් එල්ලලා අලියයි පොහොට්ටුවයි යනවා කියලා.ඔය කියන අය කවුරුත් ඒ කාලේ හිටියේ නෑ.මිනිස්සු තෙල් පෝලිම්වල හිටියා. උයන්න ගෑස් නැතුව හිටියා.දවසක් මම වත්තල හේමාස් එකට ගිහින් එන කොට මුඩුක්කු ගෙවල්වල ඉන්න දුප්පත් මිනිස්සු කාක් කෝට් කැලි දාලා එළියේ බත් උයනවා.අපිට දර කෑල්ලක් හරි තියෙනවා.මට ඒ වෙලාවේ දුක හිතුනා මේ මිනිස්සු කොච්චර අසරණද කියලා.දැන් ඒ මිනිස්සුන්ට කීය හරි දීලා ගන්න ගෑස් ටික තියෙනවා.කීය හරි දීලා ගන්න ඩීසල් ටික, පෙට්‍රල් ටික තියෙනවා.ඒ ගැන අපේ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා.ඒවා ඉවසන්න බැරි අය තමයි මේ පුංචි ඡන්දයක් ඉල්ලලා කෑ ගහන්නේ.මේ ඡන්දයෙන් ආණ්ඩුව පෙරළන්නත් බෑ. රටක් වෙනස් කරන්නත් බෑ.මේක මුදල් නාස්ති කිරීමක් පමණයි.මේකෙන් කරන්නේ තම තමන්ගේ පක්ෂවල ප්‍රවණතා පෙන්නන එක.ඊට ඉස්සෙල්ලා අපි රටක් වශයෙන් ගොඩ ගිහින් ඉන්න ඕන. මේ රටට ආදරෙයි නම් රටේ නායකයෝ එකතු වෙලා අපි මේක අවුරුද්දක් අරන් යමු.අපි ඔබතුමාට මේකට සහයෝගය දෙන්නම්.අපි අවුරුද්දක් බලමු.අවුරුද්දකින් බස්සේ අපි අයින් වෙනවා.මේ රටේ මුදල් නාස්ති කරගෙන ඡන්දයක් ඉල්ලන එක නෙමෙයි කරන්න ඕන.ස්තුති .

**(එ) 25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.ඒ.හේමාල් සුජීවා මහත්මිය:-**

ගරු සභාපතිතුමිය, මමත් මේ ගැන කතා කරන්නමයි හිටියේ.පෞද්ගලික අත්දැකීම් නම් හැමෝටම තියෙනවා.ඕන තරම් කියන්න පුළුවන්.අපිත් මරණයේ දොරකඩටම ගිහින් ආපු මිනිස්සු තමයි.අද ඔය හැම දේකටම හිතට දුකක් දැනෙන මිනිස්සුන්ට 88, 89 නැති වුණ තරුණ ජීවිත 60000 ගැනත් දුකක් දැනෙන්න ඕන කියලා කියනවා.ඒ එක්කම රට ගැන හිතලා වැඩ කරනවා නම් දරුවන්ගේ සුරක්ෂා රක්ෂණය ලක්ෂ දෙක හැත්තෑ පන්දහට අඩු කරලා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීලාගේ සෞඛ්‍ය රක්ෂණය ලක්ෂ දහය දක්වා වැඩි කර ගත්තා.ඒ ඇරෙන්න හිටපු ජනාධිපතිවරු නඩත්තු කරන්න ලක්ෂ දාහකට ආසන්න මුදලක් වැය කරනවා.අපිට හැමදාම ගැටලුවක් තිබුණේ මේ දේශපාලන ආර්ථික වැඩපිළිවෙල ගැන මිසක් තනි තනි පුද්ගලයා එක්ක නෙමෙයි.පවුල් විසිදහකින් ඇති කරපු ජනසවිය දැන් පවුල් ලක්ෂ විස්සකට හාල් කිලෝ දහය ගානේ මාස දෙකකට දෙන තත්ත්වයට ඇති කළේ දූප්පත්කම සිය ගුණයකින් වැඩි කළේ 88, 89 හින්දා වෙන්න ඇති.ඒ ඒක්කම 88, 89 තාක්ෂණය තිබුණා නම් හැන් ෆෝන් එක තිබුණා නම් ඉතිහාසය ඔය විදියට නෙමෙයි ලියවෙන්නේ.ඒක පහුගිය අරගලයේදී දකින්න තිබුණ දෙයක්.මම වැඩි දෙයක් කියන්නේ නෑ වචන දෙකයි කියන්නේ.හැමදාම ඉතිහාසය ලිව්වේ ජයග්‍රාහකයා මිස පරාජිතයා නොවෙයි.ස්තූතියි.

**(එ) 26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ඩී.රත්නසිරි මහතා:-**

ගරු සභාපතිතුමියනි, දීර්ඝ වශයෙන් කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ.කෙටි ස්තූතියක් කරන්න තියෙන්නේ.මොකද මගේ උඩුපිල ගමේ පහුගිය දවසක එක දවසේ මළගෙවල් පහක් සිද්ද වුණා.මම සභාවට කතා කළහම සියලු මළගෙවල්වලට හට් පුටු ටික ලැබුණා.ඒ වගේම ඒ අවට විදුලි ආලෝකය සකස් කරලා දුන්නා.ඒ සඳහා විශේෂයෙන්ම මම ගරු සභාපතිතුමියට ඒ වගේම මහර ප්‍රාදේශීය සභාවට ස්තූතිවන්ත වෙනවා.ඒ වගේම උඩුපිල සියඹලාගහවත්ත පාරේ වෙල කොටස වසර එක හමාරක පමණ සිට වෙල් යාය මැදින් මේ පාරේ දිවෙන්නේ.ඒ පාර වර්ෂා ජලයෙන් හේදිලා ගිහිල්ලා සැහැල්ලු වාහන පමණයි ගමන් කරන්න පුළුවන්කම තිබුණේ. වසර එක හමාරක පමණ සිට මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාවගේ දුක් ගැනවිල්ලක් තිබුණා.ගිය සතියේ සභාවේ පොදු අරමුදල්වලින් ඒකට මුල් ගල තියලා වැඩ පටන්ගන්න පුළුවන්කම ලැබුණා.අද මේ වන විටත් ඒ ඉදි කිරීම කරමින් පවතිනවා.මේකේ අවශ්‍යතාවය තේරුම් අරගෙන ගරු සභාපතිතුමිය මුදල් ප්‍රතිපාදන ලබා දීලා සහන් ප්‍රදීප් විතාන මැතිතුමාගෙත් සහයෝගය ඇතිව අද මේක ඉදි වෙමින් පවතිනවා.මේක ගමේ මූලික අවශ්‍යතාවයක්. ඒක ගමේ ලොකු සංවර්ධන කටයුත්තක්.ඒ පිළිබඳව මම මේ මොහොතේ ගරු සභාපතිතුමියට ඒ වගේම සහන් ප්‍රදීප් විතාන මැතිතුමාට සහ මහර ප්‍රාදේශීය සභාවට ස්තූතිවන්ත වෙනවා.එසේ ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමිය අපේ උප කාර්යාලය පිළිබඳව පෙරට වඩා මේ දවස්වල අපි යම් සතුටකින් ඉන්නේ.මීට කලින් නිලධාරියා හොඳ නෑ කියනවා නෙමෙයි.අද අපිට මේ වැඩ කරගන්නට පහසු වෙලා තිබෙන්නේ නාරංවල උප කාර්යාලයට හොඳ කාර්යභාර නිලධාරීවරයෙක් පත් වෙලා තිබෙන නිසා.දුරකථනයෙන් යම් දෙයක් කිව්වත් බොහොම වුවමනාවෙන් ඒක සටහන් කරගෙන ඒ කටයුතු මනාව ඉෂ්ට සිද්ද කරලා දෙනවා.ඒ වගේම තමයි දැනට ඉන්න කාර්මික නිලධාරීතුමා ගත්තත් අපේ ගමේ කෙනෙකුගේ ගොඩනැගිල්ලක අවශ්‍යතාවයක් පිළිබඳව දැනුම් දුන්නත් කඩිනමින් ගිහිල්ලා ඒක පරීක්ෂා කරලා බලලා ඒ කාර්මික නිලධාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ඒ කටයුත්ත සිද්ද කරලා දෙනවා.නමුත් පහුගිය කාලේ එක ගොඩනැගිල්ලක් අනුමත කරගන්න අයදුම්පතකට නාරංවල කාර්යාලයේ ටී.ඕ.මහත්තුරුන්ට හත් අට පාරක් කතා කරන්න සිද්ද වුණා.සති දෙකකට තුනකට පස්සේ තමයි ඒකේ ක්ෂේත්‍ර පරීක්ෂණය සිද්ද කරගන්නේ.නමුත් අද මම නිතරම ඒ කාර්යාලයට යනවා.ඒ ගොඩනැගිලි ඉල්ලුම් පත්‍ර බිම් කට්ටි ඉල්ලුම් පත්‍ර මේස උඩ ෆයිල් ගොඩගැහිලා මහජනතාව අසීරුතාවයට පත් වෙලා දුක්ගැනවිලි අද නෑ.නාරංවල උප කාර්යාලයේ එදිනෙදා කටයුතු ඉතා හොඳින් කෙරෙන බවක් අපි දකිනවා.ඒ නිසා මම කලින් කිව්ව විදියට මට අවමංගල අවස්ථාවලට විදුලිය ලබා දීලා හට් පුටු ලබා දීම පිළිබඳවත්, උඩුපිල සියඹලාගහවත්ත මාර්ගයේ අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා ප්‍රතිපාදන ලබා දීලා ඒ සංවර්ධන කටයුත්ත කිරීම පිළිබඳවත් මම නැවත නැවතත් සහන් ප්‍රදීප් විතා මැතිතුමන්ටත්, ගරු සභාපතිතුමියටත් කාර්ය භාර නිලධාරීතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙනවා. හැමෝම කියනවා වගේ මෙහෙම කතා කරන්න වෙන අවසාන දවස අදද දන්නේ නෑ.කොහොම වුණත් අපිට ලබන සභාවටත් එන්න වාසනාව ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අපි පක්ෂ හැටියට විවිධ මතිමතාන්තර තිබුණත්, මේ ගතවුණ වසර පහ තුළ කිසිම පක්ෂයක් එක්ක කිසිම මන්ත්‍රීවරයෙක් එක්ක අමනාප වෙලා ගැටුම් ඇතිකරගෙන සභාව තුළ හෝ පිටත අපි කටයුතු කරලා නෑ.මහර ප්‍රාදේශීය සභාව ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක්. අපේ වර්තමාන කාලය තුළත් බොහොම හොඳින් ආදර්ශමත් ප්‍රාදේශීය සභාවක් හැටියට ඉදිරියට ගියා.ඒක අපිට සතුටට කාරණයක්.අපිත් පක්ෂ නියෝජනය කරන අය.පහුගිය කාලය තුළ යම් යම් දේශපාලන පක්ෂ හැසිරුණු ආකාරය පැහැදිලි කළා. කොහොමු වුණත් අපි ඉදිරියේදී මැතිවරණය කල් නොදා මැතිවරණය තිබ්බත් අපි පොදුජන එක්සත් පෙරමුණ හැටියට මේ මැතිවරණය මුහුණ දෙන්න සූදානම් කියන එකත්, මැතිවරණයේ ජයග්‍රහණය උදෙසා කළහැකි සියලු දේ කරන බවත් ප්‍රකාශ කරමින් සියලුම මන්ත්‍රීවරුන්ට හොඳ අනාගතයක් කියලා ප්‍රාර්ථනා කරමින් අපි හිටියත් නොහිටියත් මේ මහර ප්‍රාදේශීය

සභාව ඉදිරි කාලයේ මහර ජනතාවගේ සංවර්ධනය වෙනුවෙන් වැඩ කරන්න පුළුවන් සභාවක් බවට පත් වේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා බොහොම ස්තුතියි.

<u>**(එ) 27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.එම්.එස්.ධර්මසිරි පියරත්න ෆොන්සේකා මහතා:-**</u>

ගරු සභාපතිතුමිය, ඔබතුමියට විශේෂ ස්තුතියක් කරන්න තියෙනවා. කැන්දලියද්දපාළුව ප්‍රදේශයේ කරගන්නම බැරිව තිබුණ පාරවල් දෙක තුනක් ඊයේ පෙරේදා කොන්ක්‍රීට් කරලා ඉවර කර ගත්තා.වැල්ලකනත්ත ප්‍රධාන පාර මඩවගුරක් බවට පත් වෙලා තිබුණා.කඨින පිංකම් දවස්වල කඨින පිංකම ගෙනිය ගන්න බැරි තත්ත්වයක් තිබුණේ.ඒ ටිකත් කරලා දුන්නා.ඒ කාර්ය මණ්ඩලයටත් ඔබතුමියටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම නාගහ පාරේ රෝහිත මහත්මයාගේ දානමය කටයුත්ත නිසා ඒ පාර හදලා දුන්නා.රෝහිත මහත්මයා ඔබතුමියට ස්තුති කරන්න කිව්වා.මට යන්න බැරි වුණා. නමුත් අපේ ජෝෂ්ඨයා ඒ දෙක තුනටම සහභාගි වුණා.මං වෙනුවෙන් අපේ කැන්දලියද්ද පාළුවේ මළගෙදරකටත් ඔහු සහභාගි වෙලා ඒ වැඩකටයුතු ටික මට කරලා දුන්නා.එතුමා ඉන්න එක මට ලොකු හයියක්.අපේ කැන්දලියද්දපාළුව ක්‍රීඩා පිටිය ගැන හැම සභාවකම කතා කරනවා.සමහර අය කියනවා ඒකට ලක්ෂ දහයක් පාස් වෙලා තිබිලා මම මුදල් වංචාවක් කළා කියලා.තොරතුරු කේන්ද්‍රයෙන් හරි ඒවා ලබා ගන්න කියලා මම කියනවා.ඒ වගේම අපේ නිලධාරී මණ්ඩලයට ඔබතුමිය අවස්ථාව දෙන්න එහෙම අපි මොනවා හරි දෙයක් කරලා තියෙනවා නම් අපේ සම්පූර්ණ තොරතුරු ටික ඒ ගොල්ලන්ට දෙන්න.ඒ පස් ටික ගෙනාපු හැටි වියදම් කරපු රුපියලක් තියෙනවා ඒ රුපියල වියදම් කළේ කවුද කියන එක මේ සියලුම දෙනා දන්නවා.පහුගිය කාලේ සභාවේ මහ ලොකුවට කිව්වා පිට්ටනියේ ඇවිදින්න බෑ තණකොළ වැවිලා, ගල් තියෙනවා, මඩ වගුරක් කියලා.හැබැයි දැන් පිට්ටනිය සුද්ද කරලා තියෙනවා.කිසිම කෙනෙක් මේ වෙනකන් ඒ පිට්ටනියට සෙල්ලම් කරන්න ගිහින් නෑ.දැන් කියනවා මුල් තියෙනවා ඇවිදින්න බෑලු.එහෙනම් ඉතින් ස්පොන්ච් එකක දාන්න ඕන.එහෙම ක්‍රීඩා පිටි මේ ලංකාවේ නෑ.මිනිස්සු දූෂකයෝ හොරු කියලා පෙන්නන්න තමයි එක එක කණ්ඩායම් හදන්නේ.බොරු කාරයොත් එක්ක අපි බොරුවට තර්ක කරලා වැඩක් නෑ.ඒ වගේම සභාපතිතුමිය මම මේ සභාවට ආපු දවසේ ඉඳන් කියනවා මේ පිළිබඳව.මිනිස්සු තාප්ප ගහලා තාප්පෙට ඉස්සරහින් මල්ගස් වවලා තියෙනවා.පාරවල්වල ඉඩ නෑ.ඒත් නාගහ පාරෙමයි ඒ මිනිස්සු තාප්පේ ආරක්ෂා කරන්න තාප්පෙ ඉස්සරහින් ගල් වැටක් ගහලා.මම කිව්වා ඔහොම කරන්න එපා මේ ප්‍රාදේශීය සභාවට අයිති පාරවල් කියලා.ඒක තියෙන්නෙත් වංගුවක.මිනිස්සුන්ට එතනින් වාහනයක් ගන්න විදියකුත් නෑ.ඔය කියන ගෙදරම සභාපතිතුමිය ටොයිලට් වලෙන් වතුර කාන්දු වෙනවා.සභාපතිතුමියටත් පැමිණිල්ලක් දීලා තියෙනවා.ඒක බලන්න ගිය නිලධාරීන් කවුද කියලා මම දන්නවා.අපි තමයි අපහසුතාවයට පත් වෙන්නේ.ඊට පස්සේ සභාපතිතුමිය අපහසුතාවයට පත් වෙනවා.ඒ වගේම දෙයක්වත් කරගන්න බැරි නම් අපි මේ සභාවේ ඇවිල්ලා කෑ ගහලා වැඩක් නෑ.අපිට පාක්ෂිකයා කවුද කියන එක වැඩක් නෑ.යූ.න්.පී.කාරයත් එකයි ජේ.වී.පී.කාරයත් එකයි.හැමකෙනාම මනුස්සයෙක්.ලයිට් දාන්න ගියත් මම අරයා මෙයා තෝරලා ලයිට් දාන්නේ නෑ.මෙතනින් පටන් ගත්තහම එහා කෙළවර වෙනකන්ම ලියිට් දානවා.ඒ වගේම තමයි අපි වැඩ කරන්නේ.ඒ වගේම තව වැසිකිළි වළකින් ළිං දෙකකට වතුර කාන්දු වෙනවා.M.O.H. එකටත් කිව්වා ප්‍රාදේශීය සභාවටත් කිව්වා තවම ඒකට විසඳුමක් ලැබිලා නෑ.මෙකට වහාම පියවරක් ගන්න කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා ස්තුතියි.

<u>**(එ) 28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.නුවන් ශීරන්ත දිසානායක මහතා:-**</u>

ගරු සභාපතිතුමිය, ඇටිකෙහෙල්ගල්ල ප්‍රදේශයේ දෙල්ගහවත්ත ප්‍රදේශයට යන පාරත්, අපේ ඇටිකෙහෙල්ගල්ල පොදු සුසාන භූමියට යන පාරත් ප්‍රිමික්ස් කර ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිය පුද කරනවා.ඒ වගේම ගරු සභාපතිතුමිය, මේ වැඩසටහන යන අතරෙදි එක් පුද්ගලයෙක් ඇවිත් ප්‍රකාශයක් කරලා තිබුණා අවුරුදු හතර හමාරක් වෙනකන් මේක දැක්කේ නැද්ද කියලා. එතන හිටපු කට්ටිය එතුමාට ඒ සම්බන්ධව උත්තර දුන්නා.අපේ මහර ප්‍රාදේශීය සභාවේ පිළිගැනීමේ බෝඩ් එකක හලා තිබුණා.ඒ බොඩ් එක කඩලා දාලා තියෙනවා.එතන මිනිස්සු කිව්වා මෙන්න මේ වගේ කුහක මිනිස්සු තමයි මේවා කළේ කියලා.ඒ පිළිබඳව පැමිණිල්ලක් දාන්න කියලා ඉල්ලීමක් කරනවා.මොකද ඒක පොදු දේපළක්.ඒක අපේ සභාවෙන් ගහපු බෝඩ් එකක්.ඒ වගේම වත්තේ කඩේ ඉස්සරහා අපේ තව බෝඩ් එකක් තිබුණා.ඒ පිළිබඳවත් පැමිණිල්ලක් දාලා පරීක්ෂණයක් පවත්වන්න කිලා මම ඉල්ලීමක් කරනවා.සභාපතිතුමිය, අපේ පන්සල ගාව තියෙන ළිඳ සම්බන්ධව මම හැමදාම කියනවා.සතියකට කලින් අපේ ටී.ඕ.මහත්තයා යවලා ඒ ගෙදරත් එක්ක කතා කළා.පාරේ ඉඳන් රිසවේෂන් එක තියෙනවා අඩි පනහක් විතර.ඒක අතරේ තමයි මේ ළිඳ තියෙන්නේ.මේ සම්බන්ධව ගොවිජන සේවා එක දැනුවත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.බොහොම ස්තුතියි.

<u>**(එ) 29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්.සිරිමල් ශාන්ත කුමාර මහතා:-**</u>

ගරු සභාපතිතුමිය, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න තියෙනවා.මහින්ද මන්ත්‍රීතුමා ඇවිදින මන්තීරුව ගැන ප්‍රකාශ කළා.ඒ ඇවිදින මංතීරු සංකල්පය ගෙනාවේ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා.බස්නාහිර පළාතේ පළමුවෙන්ම කොළඹ ඊට පස්සේ ගම්පහට ගෙනාවා.මහ නගර හා බස්නාහිර පළාත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මැතිතුමාගේ මැදිහත් වීමෙන් තමයි

ඇල්දෙණිය ප්‍රදේශයට ගෙනාවේ.ගෙනල්ලා ඒක නඩත්තු කරගෙන යන්න ලසන්ත ඇමතිතුමා ඉන්න කාලේ ලක්ෂ දහයක් ලබා දුන්නා. ප්‍රාදේශීය සභාවෙන් නඩත්තු මුදලක් ඒකට ගෙවන්නේ නෑ.නඩත්තු කරන සේවකයෝ ඉන්නවා.දැන් මාස හය හතක ඉඳලා රජයේ මූල්‍යමය අර්බුදයත් එක්ක අපිට ඒ ප්‍රතිපාදන ලබා දෙන්නේ නෑ.නමුත් අපි සේවකයෝ දාලා නඩත්තු කටයුතු කරගෙන යනවා.වටේ පිටේ ජිම් වලින් ලොකු මුදලක් අය කරනවා.සංස්ථාව රුපියල් දෙදහක මුදලක් තමයි අය කරන්නේ.එක ගෙදරින් දෙන්නෙක් එනවා නම් තුන්දහක් ලෙස අපි ඉල්ලීමක් කරලා තියෙන්නේ.අද වෙනකන් ඇප්ලිකේෂන් අරන් ගිහිල්ලා කිසිම කෙනෙක් මුදල් බැඳලා නෑ.අපි ඉල්ලීමක් කරලා තියෙනවා නඩත්තු කරන්න මුදලක් වශයෙන් දෙන්න කියලා.කිසිම කෙනෙක් මේකට මුදලක් බැඳලා නෑ.කොළඹ තියෙන මංතිරුවල ඇවිදිනවාට නෙමෙයි ජිම් එකට රුපියල් පන්දාහකට වැඩිය අය කරනවා.ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් තමයි පාලනය කරන්නේ. කිඹුලාගල අයිති වෙන්නේ කඩුවෙල මහ නගර සභාවට.නමුත් පහත් බිම් සංස්ථාවෙන් තමයි කටයුතු කරන්නේ.ලසන්ත අලගියවන්න මැතිතුමා වෙන් කරලා දුන්න ලක්ෂ 10න් තමයි මේ වෙනකන් ඒකේ නඩත්තු කටයුතු කළේ.මේ වෙනකොට මුදල් අවශ්‍ය වෙලා තියෙන නිසා තමයි ජනතාවගෙන් අයකිරීමක් කරලා මේ කටයුත්ත කරන්න වුණේ.නොමඟ යන නිසා මම මේ කතාව කිව්වේ සභාපතිතුමිය.

**(එ) 30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.ශානිකා මධුරංගි මහත්මිය:-**

ගරු සභාපතිතුමිය, ඇල්දෙණිය කනත්ත පාරේ හේමාලි මන්ත්‍රීතුමියගේ නිවසට යන පාර කඩා ඉවත් කරන්න මේ වනවිට අපි තීන්දුවක් ගත්තා. අපි සභාවල කතා කරනවා. මේවා සිද්ද වෙන්න නැති වෙන්න හේතුව මොකද්ද කියලා අහන්න කැමතියි සභාපතිතුමිය.කැන්දලියද්දපාළුව උතුර සිසිර මාවත මම කිහිප වතාවක්ම ඉදිරිපත් කළා. උප සභාපතිතුමා සභාපති පුටුවේ ඉඳගෙන ඉන්න අවස්ථාවක එතුමා මේ සඳහා විසඳුම් ඉදිරිපත් කළා.නමුත් තවමත් කැන්දලියද්දපාළුව උතුර සිසිර මාවතේ වැහි ජලයෙන් යටවෙන නිවසට තවම පිළිතුරක් ලැබිලා නෑ.ඒ වගේම කැන්දලියද්දපාළුව බටහිර 852, එල්.චන්ද්‍රාවතී මහත්මිය උප කාර්යාලයට ලිපියක් ලබා දුන්නා.මේ වර්ෂාවත් එක්ක නිවස යට වෙනවා.ඒ නිවසේ මිනිසුන් හරිම අපහුසාතවයට පත් වෙලා ඉන්නේ. ඒ වගේම කැන්දලියද්දපාළුව බටහිර ගල්වලවත්ත ක්‍රීඩාංගනය කාලයක් අපි මැදිහත් වුණ ප්‍රශ්නයක්.ඔබතුමියට මම දිගින් දිගටම මේ ප්‍රශ්නය ගැන කතා කළා.මොකද මේක ජාතික ජන බලවේගය කැන්දලියද්දපාළුව බටහිර කොට්ඨාශ සභාව මැදිහත් වෙලා හේමාලි වීරසේකර මන්ත්‍රීතුමිය ප්‍රදේශයේ ජනතාවගෙන් පෙත්සම් ලිපියක් ලබා දුන්නා.ඒ මැදිහත් වන නිසා මේ වනවිට පිට්ටනිය අස්පස් කරලා පිරිසිදු කරලා දීලා තියෙනවා.සභාපතිතුමිය, මේක තවමත් සම්පූර්ණ විදියට සංවර්ධනය වෙලා නෑ.මේ අවස්ථාවේ ඩෙංගු සීඝ්‍ර වශයෙන් ව්‍යාප්ත වෙනවා.කැන්දලියද්දපාළුව බටහිර ගල්වලවත්ත ගල්වලත් එක්කම ඩෙංගු රෝගය නැවතත් පැතිරෙනවා.ජපන් ජබරවලට නැවතත් පොලිතින් කැලි කසළ වැටිලා නැවතත් ඩෙංගු රෝගය ව්‍යාප්ත වෙනවා.ඒ වගේම මට අපි ඔබතුමියට ඉල්ලීමක් කළා.දැන් 88, 89 ඉස්සරහාට දාලා අපිව අන්දන්න බෑ.මේ වෙලාවේ මැතිවරණයක් ප්‍රකාශයට පත් කරලා තියෙනවා.මේ ආණ්ඩුව මැතිවරණය පස්සට දාන්න අර අදිනවා.2022 මාර්තු 20ට කලින් මේ පළාත් පාලන මැතිවරණය තියලා ඉවර කරන්න ඕන. මේ රටේ යම්තාක් දුරට හරි ප්‍රජාතන්ත්‍රවාදය තියෙනවා නම් මේ වෙලාවේ අපි ඡන්ද අපේක්ෂක අපේක්ෂිකාවෝ හැටියට දිනුම පැරදුම කෙසේ වෙතත්, අපේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අපි සටන් කරන්න ඕන.88, 89 අපේ මැරුණ කොල්ලෝ කෙල්ලෝ වෙනුවෙන් කවුරුත් කතා කරන්නේ නෑ.ස්තූතියි.

**(එ) 25. ගරු උප සභාපති ඩබ්.ඒ.අජන්ත වික්‍රමාරච්චි මහතා:-**

ගරු සභාපතිතුමියනි, විශේෂයෙන්ම පසුගිය කාලයේදී මැතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබෙන අවස්ථාවේදී අපේ සභා වාර එකකින් හෝ කිහිපයකින් අපේ ධූර කාලය අවසන් වීමට තිබෙන අවස්ථාවේදී මේ සභාවේ කතා කරන්න ලැබීම පිළිබඳව මම විශේෂයෙන්ම සන්තෝස වෙනවා.මම 2006 වර්ෂයේදී මහර ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වෙලා වසර ගණනාවක් මේ මහර ප්‍රාදේශීය සභාව නියෝජනය කරමින් මහර ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම්වලට සහභාගි වුණ මන්ත්‍රීවරයෙක් හැටියට මම සතුටු වෙනවා.මගේ ආසනයේ තිබෙන ප්‍රශ්න, ජනතාවගේ ප්‍රශ්න කතා කරන්න වේදිකාවක් කර ගන්න තිබෙන්නේ මේ ප්‍රාදේශීය සභා සභා ගර්භය. මෙම සභා ගර්භයේදී මගේ ආසනයේ ජනතාවගේ ප්‍රශ්න ගැටලු කතා කරමින් ඒවා යම්තාක් දුරට විසඳමින් අනෙකුත් මන්ත්‍රීවරුන්ට සාපේක්ෂව මෙම සභා ගර්භයේ රැඳී සිටිමින් මම මට හැකි සියලුම අවස්ථා වලදිත් මේ මහර ජනතාවට සේවය කරන්නට මට අවස්ථාව ලැබුණා.මේ සභාවේ සභාපතිවරු ගණනාවක් යටතේ මම කටයුතු කරලා තිබෙනවා.ඒ අවස්ථාවේදී කරන්නට පුළුවන් උපරිම සේවය මේ මහර ජනතාවට කිරීම පිළිබඳව මම ඉතාමත් සන්තෝස වෙනවා.ඒ වගේම ගරු සභාපතිතුමියනි, මම සන්තෝස වීමත් සමඟම දුක් වෙන අවස්ථාත් තියෙනවා.අද මේ මහර ප්‍රාදේශීය සභාව පාලනය කරගෙන යන අවස්ථාවේදී සමහර නිලධාරීන්ට තමන්ගේ නිල රාජකාරිය කරන අවස්ථාවේදී පහත් තැන්වල නිලධාරීන් ඒ නිලධාරීන්ට ඒ කාර්ය කරන්නට අවස්ථාව දෙන්නේ නෑ.විශේෂයෙන්ම ඌරුවල්පේරුව කාර්යාලයේ.එහි අද මේ වනවිට පහත් නිලධාරීන් විසින් වෙලාගෙන තිබෙනවා. ඔවුන් ඉහළ නිලධාරීන්ට සේවය කරන්නට දෙන්නේ නෑ. ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්නට කියලා මම ලේකම්තුමියට විශේෂයේම මතක් කරනවා.අද පාරක් කඩන්න හැදුවත් පහත්

නිලධාරියෙක් තමයි ඒ පාර හදන්න සේවකයෝ යවන්නේ.මේ පිළිබඳව කොහොම කතා කළත් විසඳුමක් වෙන්නේ නෑ.මම හිතන්නේ මගේ අවසාන සභාව වෙන්න පුළුවන්.මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්නට අවශ්‍යයි.විශේෂයෙන්ම යම් නිලධාරියෙක්ට ඒ නිලධාරියාගේ රාජකාරිය නිසියාකාරව ඉෂ්ට කරන්න බැරි වෙනවා නම් ඒ නිලධාරියා පසුබට වෙනකොට ඒ අවස්ථාවේදී මහජන නියෝජිතයෝ හැටියට ගමට ගියහම අපි තමයි පසුබෑමටත් ඒ සියලුම දේටත් ලක් වන්නේ.ඒ නිසා ගරු සභාපතිතුමියනි, මේ පිළිබඳව අවධානය යොමු කරන්න.රජයේ නිලධාරීන්ට වගකියන නිලධාරියා හැටියට ලේකම්තුමියටත් මේ පිළිබඳව අවධානය යොමු කරන්නට කියන ඉල්ලීම මම කරනවා.අපේ නීල් මන්ත්‍රීතුමා දිගින් දිගටම කතා කළා. සභාපතිතුමිය නැති අවස්ථාවේදී මම වැඩ බලන සභාපතිවරයා හැටියට ඉන්න කොට අපේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මේ ජෙනරේටර් ප්‍රශ්නය පිළිබඳ ඉදිරිපත් කළා.මම ඒ අවස්ථාවේදී ඒ ආදාහනාගාර අලුත්වැඩියා කරන පුද්ගලයාට කතා කළා.අපි නිලධාරීන්ට කිව්වා මේ පිළිබඳව අධ්‍යයනයක් කරන්න කියලා.කිසිම අධ්‍යයනයක් කරන්නේ නැතුව අද මළගෙදර ගියහම ලයිට් කපපුවහම පක්ෂ භේදයකින් තොරව අපේ මන්ත්‍රීවරයෙක් එතනට ගිහිල්ලා ඉන්නවා නම්, ඒ මන්ත්‍රීවරයා තමයි අපහසුතාවයට පත් වෙන්නේ.එම නිසා සභාපතිතුමියනි, නිලධාරීන්ට කියලා මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන්න ඕන.අපේ ආදාහාගාර හතරක් තියෙනවා.ඒ ආදාහනාගාර හතරේ ත්‍රී ෆේස් මෝටරයක් තියෙනවා නම්, ඒක සින්ගල් ෆේස් කළා නම් වොට් ප්‍රමාණය අඩු ජෙනරේටරයක් යොදලා ක්‍රියාත්මක කරන්න හැකියාවක් තියෙනවා.සභාපතිතුමිය නොමැති අවස්ථාවේදී අපේ නීල් මන්ත්‍රීතුමා, මදුප්පෙරුම මන්ත්‍රීතුමා, ප්‍රකාශ කරපු අවස්ථාවේදී මම කිව්වා ඒ පිළිබඳව අවධානය යොමු කරන්නට කියලා.ඒ පිළිබඳව කිසිම අවධානයක් යොමු කළේ නෑ. අපි විසි තුන් දෙනා මන්ත්‍රීවරු වශයෙන් ඉන්න කොට මන්ත්‍රීවරයෙක් මේ සභාවෙදි යම් දෙයක් පිළිබඳව කතා කළා නම් ඊළඟ සභාවේදී ඒකට පිළිතුරක් ලබා දෙනවා.ඒ වගේම මේක කළා කියලා කියනවා.අපි සභාවෙදි කතා කරනවා මෙන්න මේක කැඩිලා තියෙනවා මේක කරන්න ඕන කියලා.අපි ඊළඟ සභාවෙදි උත්තරයක් ලබා දෙනවා.මම හිතන්නේ නිලධාරීන් මන්ත්‍රීවරු ගණන් ගන්නේ නැති තත්ත්වයක් උදා වෙලා තියෙනවා.අවසාන භාගයේදී වුණත් මේ පිළිබඳව අවධානය යොමු කරන්නට ඕන.විශේෂයෙන්ම මේකෙන් බැට කන්නේ අපේ ආසනයේ ජනතාව.අද අපේ නීල් මන්ත්‍රීතුමා කතා කළා.ඒ ආදාහනාගාරයට 4ට මිනිය ගෙනිච්චහම ජෙනරේටරය නැතුව පුච්චගන්න බැරි අවස්ථා තියෙනවා. මම හිතන්නේ ඒ පිළිබඳව මහජන නියෝජිතයෝ හැටියට නිලධාරීනුත් මේ පිළිබඳව අවධානය යොමු කරන්නට කියන එක මේ අවස්ථවේදී කියනවා. ඒ වගේම මේ තියෙන මැතිවරණ ක්‍රමය නිසා නිලධාරීන්ට මෙහි සේවය කිරීම එපා වෙලා තියෙන්නේ.මේ මැතිවරණ ක්‍රමය ගෙනාපු අයට ශාප වෙන්නට ඕන.ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරලා මහජන නියෝජිතයෝ අඩු කළ යුතුයි. මම හිතන්නේ කාටද ඡන්දේ දිය යුත්තේ කියලා ජනතා අධිකරණය තීන්දු කරයි. අපේ ආසනයේ ඉන්න එක් ලක්ෂ හැට හත් දහක ජනතාවට පක්ෂ භේදයකින් තොරව සේවය කරන්න තමයි අපි මේ ඇවිල්ලා ඉන්නේ. අපි ප්ලෑන් එකක් අරන් සභාපතිතුමිය ළඟට එන්නේ අපේ ජනතාවට සේවය කරන්න.අපි පාරක් කඩන්න එන්නේ අපේ ජනතාවට සේවය කරන්න.ඒ වගේම වීථි ලාම්පුවක් හදන්න එන්නේ අපේ ජනතාවට සේවය කරන්න.අපේ ඌරුවල්පපේරුව උප කාර්යාලයේ ලයිට් හදන කෙනාගෙන් අහන්න පුළුවන් මම කියන්නේ ලයිට් හදන නම් මුල ඉඳන් අගට හදාගෙන යන්න නැත්තම් හදන්න එපා කියලා.ඒ නිසා අපි හැම අවස්ථාවේම මන්ත්‍රීවරු වශයෙන් මහර ජනතාවට වගකියන්න ඕන.අපේ ධූර කාලය තුළ අපි සහෝදරයෝ වගේ හැම අවස්ථාවේදීම හිටියා.ජනතා විමුක්ති පෙරමුණෙද කියලා වැඩක් නෑ.ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙද කියලා වැඩක් නෑ,එක්සත් ජාතික පක්ෂයේද කියලා වැඩක් නෑ.අපි සියලු දෙනාම සහෝදරයෝ වගේ හිටියා.අපි සියලු දෙනාම ආවේ අපේ ජනතාවට සේවය කරන්න.ඒ නිසා අපි සියලුම දෙනා මේ පුංචි කාලය තුළදී රංඩු සරුවල් වෙන්න අවශ්‍ය නෑ.මේ අවසාන මොහොතේදී අපි රණ්ඩු සරුවල් වෙලා ගියාට වැඩක් නෑ. අපිට අන්තිමට හිතෙනවා මොකටද අපි රණ්ඩු වුණේ කියලා.ඒ නිසා මේ සභාවේ නීති රීති පිළිබඳවත් විශේෂයෙන් අවධානය යොමු කරලා හැසිරීම යහපත් කර ගනිමින් අපි මේ සභා කටයුතු අවසන් කිරීමට කටයුතු කරමු.මේ මැතිවරණ ක්‍රමය අහෝසි කරමින් මනාප ක්‍රමයට ඡන්දය පවත්වලා දක්ෂයාට ඉදිරියට යන්නට අවස්ථාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් අපේ නව ලේකම්තුමිය කැළණියේ ඉඳලා අපේ සභාවට ඇවිල්ලා ඉන්නවා.එතුමියට මේ කටයුත්ත කරගෙන යන්නට ශක්තිය ධෛර්ය වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. සභාපතිතුමිය ඇතුළු සියලු දෙනාටම මේ කටයුතු කරන්න ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා බොහොම ස්තූතියි.

**<u>(එ) 26. ගරු සභාපතිනි ඒ.ඒ.සුදීමා චාන්දනි මහත්මිය :-</u>**

අද මන්ත්‍රීතුමන්ලා ටිකක් වෙලාව ගත්තා. ලේකම්තුමිය මට කිව්වා කැළණිය ප්‍රාදේශීය සභාවෙනම් විනාඩි දෙකක කතා කරන කොට ඉන්දනවා කියලා.කැළණියේ පැය දෙකෙන් තුනෙන් සභාව ඉවර කරනවා. එහෙත් මන්ත්‍රීවරු හතළිහක් ඉන්නවා.තමුන්නාන්සේලාගේ අදහස් දක්වන්න ඉන්නේ මාසෙකට එක දවසයි.අපි සමහර අවස්ථාවල අපේ ගරු මන්ත්‍රීතුමන්ලාව නිහඬ කෙරෙව්වා.සමහර මන්ත්‍රීවරු කතා කරලා යනවා.මම උත්තර දෙන්න බලනකොටත් ඒ මන්ත්‍රීවරු ගිහිල්ලා.නීති රීති කොහොම තිබුණත් මමත් මැදින් පැන පැන උත්තර දෙනවා.මහජනතාව ඔබට ලබා දීපු වරමේ ගෞරවය රැකපු විශාල පිරිසක් මෙතන ඉන්නවා.උප සභාපතිතුමා කිව්වා වගේ පහුගිය

අවුරුදු පහම මේ සභාව නියෝජනය කරන්න උප සභාපතිතුමා ආවා මම ආවා.ජනතාව ලබා දීපු වරමට අපි සාධාරණයක් කරලා තියෙනවා.විශේෂයෙන්ම කියන්න ඕන මහර ප්‍රාදේශීය සභාවේ අපේ මන්ත්‍රීතුමන්ලා හැමෝම අඩමානෙන් තමයි කතා කළේ.ලබන සභාවට අපි ඉදියිද නැද්ද කියන එක.කිරිල්ලවල කොට්ඨාශය ජයග්‍රහණය කරලා මන්ත්‍රීවරියක් විදියට මම මහර ප්‍රාදේශීය සභාවට එනවා.කිරිල්ලවල ජනතාව මට හතර වතාවක් ඡන්දේ දුන්නා.කවුරු කොහොම කිව්වත් කිරිල්ලවල කොට්ඨාශයේ ජනතාව සුදීමා චාන්දනී නමට තමයි සලකන්නේ.ඒකට හොඳම උදාහරණය තමයි පක්ෂ තුනකින් ඉතිහාසයේ පළමු වතාවට කාන්තාවක් විදියට පත් වුණේ මම.ඉතිහාසයේ පළමු වතාවට මහර ප්‍රාදේශීය සභාවට සභාපතිවරියක් වශයෙන් පත් වුණේ මම. ඒ වගේම ඉතිහාසයේ පළවෙනි වතාවට තමයි සමස්ථ ලංකා සභාපතිවරුන්ගේ සම්මේලනයේ සභාපතිනිය විදියට කාන්තාවක් විදියට පත් වුණෙත් මම.ලෝක පළාත් පාලන සම්මේලනයේ සභාපතිනිය විදියට රටවල් 42ක සභාපතිනිය විදියට කටයුතු කරන කෙනෙක් මම.අපේ මන්ත්‍රීතුමන්ලා සතුටු වෙන්න ඕන මේ පිළිබඳව.මම බොහොම දුක් කම්කටොලු, ගල් බොරලු මැද දුෂ්කර ගමනක් ආපු කෙනෙක්.ඒ නිසා මහර ජනතාව වගේම කිරිල්ලවල ජනතාව මා කෙරෙහි තබපු විශ්වාසය පිළිබඳව මම සතුටු වෙනවා. අදටත් කිරිල්ලවල කොට්ඨාශයේ ජනතාව අපේ කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන් වගේම මගේ අවට ආසනයේ තිබෙන පන්සල්වල විශේෂයෙන් මහර ආසනයේ පන්සල්, මගේ ගෙවල් ගිනි තියා විනාශ කරලා අනුෂා මන්ත්‍රීතුමියගෙත් එහෙමයි. මගේ දරුවා අද උසස් පෙළ විභාගය ලියනවා. ඒ දරුවට පාඩම් කරන්න පොතක් පතක් ඉතුරු කළේ නෑ.ජනතා බදු මුදල් කියලා ගිනි තියලා තිබුණේ.මගේ දරුවා අඬ අඬා තමයි විභාගය ලියන්න ගියේ.මේ මොන ගැටලු ප්‍රශ්න තිබුණත්, මම කෑම්ප් එකක් ඇතුළේ දවස් ගානත් ඉඳගෙනත් මහර ආසනයේ ජනතාවට මගෙන් වෙන්න ඕන යුතුකම් ටික මම ඉෂ්ට සිද්ද කළා.ඒ නිසා මට මගේ ගමේ ජනතාව ගැන විශ්වාසයක් තියෙනවා.විශ්වාසය ගමේ මිනිස්සු මට තහවුරු කරලත් තියෙනවා.අපි තමුන්නාන්සේලා හැමෝටම ගෞරවයක් තියෙනවා.හැමෝම මන්ත්‍රීතුමන්ලාගේ ගෞරවය රැකෙන විදියට කටයුතු කරන්න.මොකද සභාපතිවරු තුන් දෙනෙක් යටතේ හතර වතාවක් මේ සභාවට ආපු කෙනෙක් මම.අපේ වාල්ස් මන්ත්‍රීතුමා සභාපති කාලේ හිටියා 2002.ඊට පස්සේ සහන් මන්ත්‍රීතුමා දෙවතාවක් සභාපති වෙලා ඉන්න කොට හිටියා.සුසන්ත සභාපතිතුමා හිටපු කාලේ හිටියා.අද මම සභාපති වෙලා කටයුතු කරනවා. ලොකු අත්දැකීම් සම්භාරයක් ගත්තා.අයවැය ලේඛනය ඉදිරිපත් කරන කොට මම කියන්නේ මට මේ තැනට එන්න අත දීපු නායකයෝ ගොඩක් ඉන්නවා කියන එක.මම ඒ හැමෝම මතක් කරනවා.අභියෝග එක්ක ආපු කෙනෙක් මම.මුලින්ම මම ප්‍රාදේශීය සභා ඡන්දයට ඉදිරිපත් වෙන කොට මට අවුරුදු තිහක්වත් නෑ.එක්සත් ජාතික පක්ෂයේ තරුණ සංවිධානයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ හිටපු නිලධාරියෙක් හැටියට තමයි මට රනිල් වික්‍රමසිංහ මහත්තයා ටිකට් දුන්නේ.එවෙලෙත් හිටපු ආසන සංවිධායකතුමා මට දෙන්න බෑ කිව්වා මොකද මම හිටපු ආසන සංවිධායකතුමාට වැඩ කරපු නිසා.එතකොට අලුතින් ආවේ රවීන්ද්‍ර රන්දෙණිය මැතිතුමා. එතුමාට මම වැඩ කළේ නෑ.ඒ අභියෝග. මෙතන එතුමා නැති වුණත් මම සිහිපත් කරනවා.එතුමා මට එදා ඒ අවස්ථාව නොදෙන්න කටයුතු කළත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා මට ඒ අවස්ථා ලබා දුන්නා.අවුරුදු තිස් ගානකට පස්සේ සිරිකොත වැඩ කරපු නිලධාරියෙක් මාත් එක්ක ගිහිල්ලා ප්‍රසන්න රණතුංග මැතිතුමාගෙන් රාජකාරි වැඩ කටයුත්තක් කළා.කරු ජයසූරිය මහත්තයා, මහේෂ් කටුලන්ද මහත්තයා, බැසිල් රාජපක්ෂ මහත්තයා, ප්‍රසන්න රණතුංග මහත්තයා, ලසන්ත අලගියවන්න මැතිතුමා මේ සියලු නායකයෝ යටතේ අපි දේශපාලනය කළා.අත්දැකීම් ගත්තා.අද අපේ වත්මන් නායකයා සහන් ප්‍රදීප් විතාන මැතිතුමා එතුමා තමයි මාව මහර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කළේ.තවමත් අපි සියලු දෙනා ලෙන්ගතුව කටයුතු කරනවා.මේ සභාවේ එක එක අනුවර්ත නාම වලින් කතා කරන්න එපා.අපි තමුන්නාන්සේලා පනස් හය දෙනාම ගරු මන්ත්‍රීවරු.අපි තමුන්නාන්සේලා හැමෝම මහර ආසනයට විශාල සේවාවක් කරපු පුද්ගලයෝ.තමුන්නාන්සේලා මන්ත්‍රීවරු බවට පත් වෙලා මෙතනට එන්න කලිනුත් ලොකු වැඩ කටයුතු කොටසක් කරපු සමාජ සේවකයෝ.ඒ නිසා තමයි මහර ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය පාවිච්චි කරලා තියෙන්නේ.පිනට ආපු මන්ත්‍රීවරු කියලා මම කවදාවත් සලකලත් නෑ කියලත් නෑ.මම හා සමානවම තමුන්නාන්සේලාට මම ගෞරවය දීලා තියෙනවා.කොරෝනා වෛරසය තිබුණ කාල දීමාවේදී මහර ප්‍රාදේශීය සභාව මහර ආසනයට දැවැන්ත කාර්භාරයක් කළා. ඒක උප සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගේ කැප කිරීම තුළින් සහ මගේ හිටපු ලේකම්තුමිය වැඩ අධිකාරීතුමා ඇතුළු අපේ නිලධාරීන්ගේ කැපවීම තුළින්.මහර ප්‍රාදේශීය සභව මැනින් මාකට් එකක් වගේ.ලේකම්තුමිය පෙන්ෂන් යන දවසේ පොඩි උත්සව සභාවක් සූදානම් කරලා තිබුණා. එතනදි වැඩ අධිකාරීතුමා කිව්වේ අපි වසර ගණනාවක් ආයතන ගණනාවක වැඩ කරපු අය.හැබැයි මහර ප්‍රාදේශීය සභාවෙන් තරම් අපි කොහෙන්වත් අත්දැකීම ලබා ගත්තේ නෑ කියලා.ඒක ඇත්ත.අපේ හිටපු ලේකම්තුමිය මෙතන වට්ටක්කා කපනවා, පතෝල කිරනවා, පරිප්පු, හාල් කිරනවා.අපිට මන්ත්‍රීවරුන්ගේ ජීවිතවලට වගකියන්න බෑ ඒ වෙලාවේ.පළමු කොරෝනා රැල්ලෙන් මට කොරෝනා හැදුනා. මගේ දරුවෝ දෙන්නට හැදුනා.මුළු පාළාතම අපිව පිළිකුල් කළා.සමහර දවසට උදේ මම නැගිටලා බලනවා දරුවෝ දෙන්න හුස්ම ගන්නවද කියලා.මොකද ඒ අවස්ථාවේ කොරෝනා හැදුන හැමෝම මැරුණා. ඒත් අපි ජනතාවට කරන සේවය අතඇරියේ නෑ.කිහිප දෙනෙක් එකතු වෙලා අපේ ගෙවල් විනාශ කරලා අපිව නැත්තටම නැති කළා.ජීවිත කාලයේම අපි හම්බ කරපු දේවල්, අපේ

දෙමව්පියෝ අපිට දීපු දේවල් නැති වුණා. මන්ත්‍රී ධූරය අවුරුදු විසි ගානක් කළාට තාමත් ඒ තත්ත්වයේමයි තවම ඉන්නේ.ශක්තමත් හදවතක් මට තියෙනවා. අපේ අම්මලා තාත්තලා ගම්වල හිටපු සාමාන්‍ය මිනිස්සු.මගේ පවුල කිරිල්ලවල ගමේ තියෙන විශාල පවුලක්.මට ශක්තිය දෙන්න විශාල සහෝදර පිරිසක් ඉන්නවා.ගමේ ඉන්න සියලු දෙනාම ඇවිල්ලා මට කිව්වේ මේ මැතිවරණයේදී ඔබතුමිය අනිවාර්යෙන්ම ඉදිරිපත් වෙන්න කියලා.මගේ ලොකු කළකිරීමක් තිබුණා මේ වගේ සේවාවක් කරලා සියලු දේ විනාශ කළාට පස්සේ දරුවෝ දෙන්නාගේ ජීවිතත් නැති කරන්න දරුවෝ දෙන්නවත් හොයලා මරන්න ගිය මිනිස්සු ටිකක් හිටියා.මම දන්නේ නෑ මහර ජනතාව ඒ මිනිස්සුන්ට කොහොම සලකයිද කියන එක.මම කැමතියි මේ ඉන්න මන්ත්‍රීවරු සියලු දෙනා නැවත පත් වෙලා එනවට.මොකද තමුන්නාන්සේලා මහර ආසනයේ ජනතාව වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් කළා.ඒ නිසා ඔබ ලොකු වගකීමක් ගත්තා ලොකු යුතුකමක් ඉෂ්ට කරන්න.මම හිටියත් නැතත්, මම ප්‍රාර්ථනා කරන්නේ ඔබ සියලු දෙනාටම මහර ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීවරු වශයෙන් එන්න ලැබේවා කියලා.කිහිප දෙනෙක් ඡන්දේ ඉල්ලන්නේ නෑ කිව්වා.සමහර මන්ත්‍රීවරු අපේ පක්ෂයෙන් අත්සන් කරලා තියෙනවා.අපේ මන්ත්‍රීවරු නම් වෙන පක්ෂවලින් අත්සන් කරලා නෑ.එක්සත් ජාතික පක්ෂය ගත්තත් තමුන්නාන්සේලා දෙකට බෙදිලා කටයුතු කරන්නේ.අද අපි බැන්නට ගහගත්තට හෙට අපි එකතු වෙනවා. දේශපාලනය කියන්නේ වෙනම දෙයක්.මේක මට කියලා දුන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා.කවදාවත් දේශපාලනයෙන් තවත් කෙනෙකුට මඩ ගහන්න එපා. අපි මඩ අතට ගත්තහම අනිත් අයට ගහන්න කලින් අපේ අතේ ගෑවෙන්නේ.අපි තමුන්නාන්සේලා හැමෝටම පුළුවන් අපි කරපු වැඩ ටික ගමට ගිහින් කියන්න.එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කෝටි ගානක වැඩ කළා.අපි කාටවත් ගම්වලට යන්න බැරි කමක් නෑ.ඒ නිසා මම තමුන්නාන්සේලා සියලු දෙනාටම ආශිර්වාද කරනවා ඔබ කළා වූ වැඩ කොටසත් එක්ක ඉදිරියේදී ඉදිරි පළාත් සභා මැතිවරණය ජයග්‍රහණය කරලා නැවතත් මහර ප්‍රාදේශීය සභාවට එන්න ලැබෙන්න ඕන.අලුතින් එන මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාකාලාප අපි දන්නේ නෑ,නමුත් අපි තමුන්නාන්සේලා හැමෝම අවුරුදු පහක් මේ ප්‍රාදේශීය සභාවේ එකට කටයුතු කරපු අය.ඒ අවුරුදු පහ තුළ උප සභාපතිතුමා, අපේ මන්ත්‍රීවරු සියලු දෙනාම මට සහයෝගය ලබා දුන්න හැමෝම වගේම අපේ අඩුපාඩු පෙන්වා දෙමින් අපිට ශක්තියක් වුණ අනිත් සියලුම මන්ත්‍රීතුමන්ලාටත් මම මගේ ගෞරවය ස්තූතිය මේ අවස්ථාවේදී පුද කර සිටිනවා. ඊළඟ පාර අපි මේකේ ඉන්නත් පුළුවන් නොයින්නත් පුළුවන්.ජෙනරේටරේ ගැන ගොඩක් කතා ආවා.ජෙනරේටර් තුනක් ගන්න අපි මුදල් කමිටුවට දැම්මා.ඒ වෙලාවේ මුදල් කමිටුවේ යම් කිසි මතභේද ආවා.හැබැයි ඊට පස්සේ කවුරුහරි පළාත් පාලන කොමසාරිස්ට පෙත්සමක් ගැහුවා.අපේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් තමයි ඒක කළේ.පළාත් පාලන කොමසාරිස්ගෙන් අපිට ලියුමක් ආවා.හිටපු ලේකම්තුමිය දන්නවා.එතනින් එහාට අපි ජෙනරේටර් ගන්න එකට කටයුතු කරන්න උත්සාහ කළේ නෑ.අපි දන්නවා මේ ගැටලුවත් එක්ක දැන් පහුගිය දවස්වල පැය එක හමාරයි ලයිට් කැපුවේ.ඒ දවස්වල පැය දහය දොළහ ලයිට් කැපුවා.අමල් මහත්තයාට පුද්ගලිකව ජෙනරේටර් හොයලා ඉවරයක් නෑ.මිනිස්සු මිනී තියාගෙන උද්ඝෝෂණය කරන්න ගියා.ෆේස්බුක් දැම්මා.මේකේ වටිනාකම දන්න නිසා තමයි මම ඒ වෙලාවේ ජෙනරේටර් තුනක් ගන්න හැදුවේ.දැන් ඒ මුදලට ජෙනරේටර් ගන්න බෑ.තුන් ගුණයක් මුදල් වැඩි වුණා.මොකද මේක මගේ වරදක් නෙමෙයි. ඒ වෙලාවේ මුදල් කමිටු නියෝජනය කරපු කෙනෙක් තමයි මේක කළේ.ඒ නිසා අද වෙනකන් මේකේ වගකීම ගන්න ඕන මේක කරපු කෙනා.ආදාහනාගාරවලට ජෙනරේටර් තුනක් ආදාහනාගාරවලට ගන්න ගියා.පෙත්සම පවා අපි ළඟ තියෙනවා.ජෙනරේටර් ගැනිල්ල අපි එතනින් නැවැත්තුවා.අද මහර ජනතාව අපහසුතාවයට පත් වෙනවා නම් ඒකට වගකියන්න ඕන පෙත්සම ගහපු මන්ත්‍රීතුමා.ඒකත් මම මේ වෙලාවේ කියනවා.ඒ වෙලාවේ මුදල් කමිටුවත් නොසන්සුන් වුණා.අනිත් එක තමයි, මට කම්පලේන් තුන හතරක් ඇවිල්ලා තියෙනවා. පුද්ගලිකව ලයිට් හයි කරනවා.එක එක මන්ත්‍රීවරුන් හෝ අපේක්ෂකයෝ පුද්ගලිකව ලයිට් හයි කරනවා.පෙරේදා පළමුදා ගෝණහේනේ ලයිට් 12ක් හදලා තියෙනවා.මේක කරන්න නගගන්නේ සාමාන්‍ය ඉලෙක්ට්‍රිෂියන් කෙනෙක්.අපේ සේවකයෝ ඉන්ෂුවරන්ස් කරලා ඉන්නේ.මේක භයානක වැඩක්.තමන් ඡන්දේ ගන්න බලාගෙන එක්තරා දේශපාලන පක්ෂයක් පුද්ගලිකව මේක කරනවා.මේක ඡන්දේ බලාගෙන කරන දෙයක් වුණත් මේවා මනුස්ස ජීවිත.කවුද වග කියන්නේ.මෙතන තරඟ කරන අපේක්ෂකයෝ ඉන්නවා නම් තමුන්නාන්සේලාගේ පක්ෂවල නායකයන්ට ලයිට් ගෙවල්වලට දෙනවා නම් හයි කරන්න එපා කියලා.මේක කරන්නේ එක්තරා දේශපාලන පක්ෂයක්. මම නම කියන්නේ නෑ.මට නීතිය ක්‍රියාත්මක කරන්න සිද්ද වෙනවා.එහෙම දෙයක් වෙනවා නම් කාර්යභාර නිලධාරීන් දැනුවත් කරන්න.අනතුරක් වුණාට පස්සේ අපිට කතා කරන්න විදියක් නෑ.ඊට පස්සේ ප්‍රාදේශීය සභාවටත් ගැටලු ප්‍රශ්න එනවා.තව ගැටලුවක් තියෙනවා සභාපතිතුමිය.අපේ සභාව අඳුර ගන්න තියෙන බෝඩ්වල දේශපාලන අපේක්ෂකයෝ පොස්ටර් ගහනවා.සුභද මාවත බෝඩ් එකේ සුභද මාවත කියන එක හලා පොස්ටර් ගහලා.අපේ සභාවෙන් අඳුරගන්න ගහලා තියෙන බෝඩ්වල පොස්ටර් ගහන්න එපා.ගෝඨාභය මහත්තයා ඉන්න කාලේ මෙහෙම හැම තැනම අලව අලව ගියේ නෑ.පහුගිය කාලයක් තිස්සේ මේක තිබුණේ නෑ.ආසන සංවිධායකවරු අරගෙන ටික දවසක් තුළදී ඒවා ඉවත් කරන්න ඕන.හරිම අශෝභනයි.අවුරුදු පහම අපිටත් ගහන්න දුන්නේ නෑ.හදිස්සියේ මනුස්සයෙක් මළ ගෙදරක යන්න ආවත්, බෝඩ්වල පොස්ටර් ගහලා නිසා පාරක් හොයාගන්නවත් විදියක් නෑ.මම අපේ නිලධාරීන්ට කියලා තියෙන්නේ සභාවේ නම් කරලා බෝඩ් ගහලා

තියෙන ඒවා ගලවන්න කියලා. අපේ හේමාලි මන්ත්‍රීතුමියගේ පාරේ ප්‍රශ්නය කිව්වා.මේක දීර්ඝ කාලයක් තිබුණ ප්‍රශ්නයක්.දැන් මාස ගානකට කලින් නඩු දාන්නේ නැතුව පාර අරින්න කියලා අපේ වැඩ අධිකාරීතුමා තීන්දුවක් ගත්තා.කාර්මික කමිටුවේ මන්ත්‍රීවරුත් කියලා මහ සභාවේ තීන්දුවක් අරන් නඩු දැම්මෙත් නැතුව පාර අරින්න කියලා ඇරියා.නමුත් මේ ගොල්ලෝ වැඬේ කළේ නෑ.එතනින් එහාට එක්කෝ නඩුවක් දාන්න නැත්තම් මොකක් හරි නීතිමය කටයුත්තක් කරන්න කියලා මම වැඩ අධිකාරීතුමාට භාර දුන්නා.තාම මට ඒකට පිළිතුරක් ආවේ නෑ. ඒ මන්ත්‍රීමිය කිව්ව නිසා මම මේ පිළිබඳව දැනුවත් කළේ.අනිත් එක තමයි ගල්වල. මන්ත්‍රීතුමිය දන්නවා අපි විශාල මුදලක් යොදවලා ගල්වල සුද්ද කළා.එදා ඉඳන් මිනිස්සු ආපහු ඒකට කුණු දැම්මා.ග්‍රාම නිලධාරීට කිව්වා, P.H.I.ට කිව්වා නමුත් එකට කිසිම විසඳුමක් ලැබුණේ නෑ.මේ මාහර අසානයේ ජනතාවගේ බදු මුදල් වියදම් කරලා හදලා දුන්නට අපේ මිනිස්සුන්ට ඒකේ වටිනාකමක් නෑ.ඒක පරිස්සම් කරගන්න වුවමනාවක් නෑ.මේ දවස්වල අපි අපේ වැඩ කරන ළමයි ඔක්කොම ඩෙංගු මර්දන කටයුතුවලට M.O.H. එකට දීලා තියෙන්නේ.අපේ වාහනයකුත් දීලා තියෙන්නේ M.O.H. එකට.කොරෝනා කාලෙත් ඇම්බියුලන්ස් සේවාව පටන් අරගෙන මහර ආසනයේ ජනතාවගේ ජීවිත දහස් ගානක් බේරගන්න අපි කටයුතු කළා.තාමත් මට මිනිස්සු කතා කර කර පිං දෙනවා ඔබතුමිය නැත්තම් අපි මැරිලා කියලා.අපේ ප්‍රසාද් මන්ත්‍රීතුමත් එතුමාගේ වාහනයේ තනියම සෙනහ දාගෙන ලෙඩ්ඩු ගෙනිච්චා.එතුමාටත් ලෙඩේ හැදුනා.අපේ මන්ත්‍රීවරු 80%කට 85% කටම වගේ කොරෝනා හැදුනා.හැබැයි අපි තමුන්නාන්සේලා ඒ අවස්ථාවේදී ගමේ ආසනයේ ජනතාව වෙනුවෙන් ලොකු කාර්යභාරයක් කළා.තමුන්නාන්සේලා කරපු වැඩ ටික ගමට ගිහින් කියන්න.එතකොට ඔබ කාටවත් කිසිම ගැටලුවක් ප්‍රශ්නයක් වෙන්නේ නෑ.88, 89 භීෂණ ගැන මම කතා කරන්නේ නෑ.මම එක දවසක් හොඳට කතා කළා.ඒ ගැන කතා කරනවා නම් අපි වෙනම එළියේ මණ්ඩපයක් හදාගෙන කතා කරන්න ඕන.ඒකටත් අපි ලෑස්තියි. නමුත් මේ වෙලාව ඒකට සුදුසු නෑ.සභාවේදී ඕවා කතා කරන්න බෑ.තරුණයෝ 8000ක් මරපු වෙලාවේ මේ කවුරුත් ඒ වෙනුවෙන් පෙනී හිටියේ නෑ කියලා තමුන්නාන්සේලා කිව්වා.හැබැයි මහින්ද රාජපක්ෂ මහත්තයා පෙනී හිටියා.මම ඇස් දෙකට දැක්කා.88, 89 දි මම තංගල්ලේ හිටියේ.තංගල්ල බාලිකාවේ ඉඳලා සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින වෙලාවේ අම්මලා තාත්තලා අතුරුදහන් වුණ දරුවන්ගේ ගෙවල් ඉස්සරහා හැමදාම මහින්ද මහත්තයා ඉන්නවා.එතකොට මම හිටියේ එක්සත් ජාතික පක්ෂයේ.එතුමා අතුරුදහන් වුණ දරුවෝ හොයාගෙන වදකාගාරවලට ගියා.පොලිසි වලට ගියා.කෝට් එක දාගෙන උසාවි නැග්ගා.මේක මම අවසාන වශයෙන් කියන්නේ.අද ජාතික ජන බලවේගයත් සමඟි බල්වේගයත් මේ දෙකම මහින්ද රාජපක්ෂ මහත්තයාට ගැහුවට ඔහු අතුරුදහන් වුණ දරුවෝ වෙනුවෙන් පෙනී හිටපු කෙනෙක්.විජයදාස ලියනාරච්චි මහත්තයා මරපු වෙලාවෙත් ඒ වෙනුවෙන් දැවැන්ත හඬක් නගපු කෙනෙක් මහින්ද රාජපක්ෂ මහත්තයා.එතුමාට පෙනී හිටින්න අවස්ථා දෙකක් තිබුණා.හම්බන්තොට දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරපු මන්ත්‍රීවරයා විදියට සහ නීතීඥවරයෙක් විදියට.එතුමා හැම තැනම ගියේ නීතිඥවරයෙක් විදියට.හැම උසාවියකටම එතුමාට යන්න පුළුවන්කමක් ලැබුණා.මම අද වෙනකොට පක්ෂ දෙකක්ම නියෝජනය කරලා තියෙනවා.තමුන්නාන්සේලා මොනවා කිව්වත් යුද්ධය විකුණගෙන කන්න එපා කිව්වත්, 88, 89 ගැන කතා කරන්න එපා කිව්වත් අපිට කතා කරන්න ඉතිහාසයක් තියෙනවා.අපි මහින්ද රාජපක්ෂ මහත්තයාගෙන් ඉල්ලුවේ යුද්ධය ඉවර කරන්න කියලා.ඒ කාලේ මම එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ හිටපු කෙනෙක්.හැබැයි මම මොකද මෙතන නතර වුණේ.එතුමාට ගරු කිරීමක් දෙන්න ඕන නිසා.අපි තමුන්නාන්සේලා අද නිදහසේ හුස්ම ගන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය ඉවර කරපු නිසා.යුද්ධය ඉවර කරලා නොතිබුණා නම් අරගල කරන්නවත් අපේ ගෙවල් ගිනි තියන්න කඩන්න බිඳින්නවත් කට්ටිය එකතු වෙන්නේ නෑ.සංවිධානවලට එකතු වෙන්න බෑ.එකතු වෙන තැන්වල බෝම්බ පුපුරනවා.මම 99 වේදිකාවේ කතා කරන කොට චන්ද්‍රිකා මැඩම් ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනකොට අපේ වේදිකවල බෝම්බ පිපිරුවා.එතකොට මමත් එක්සත් ජාතික පක්ෂයේ තරුණ සංවිධානයේ ප්‍රධාන ක්‍රියාකාරී නිලධාරිනියක් විදියට රටේම කතා කරන කෙනෙක්.ඒ වොවේ බොම්බේ පිපිරුවා.චන්ද්‍රිකා මැඩම්ගේ ඇහැක් නැති වුණා.ඒ සියල්ලක්ම ඉවර කළේ මහින්ද රාජපක්ෂ මැතිතුමා.එතුමාට ජනාධිපති වෙන්න ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණේ සහයෝගය ලැබුණා.අපි හැමෝගෙම හොඳත් තියෙනවා නරකත් තියෙනවා.අපි තමුන්නාන්සේලා කොයි නායකයා ගැන කතා කරන්න ගත්තත් ඉස්සෙල්ලාම ටිකක් බලන්න.හැමෝම මේ රට වෙනුවෙන් මොනවාම හරි කරපු අය.කොරෝනා වෛරසය වෙලාවෙ මිනිස්සු දාස් ගණන් මැරුණා.ඉන්දියාවේ ගඟවල්වලට මිනිස්සු දැම්මා.චීනේ ලක්ෂ ගානක් මිනිස්සු මැරුණා.හැබැයි ඒ වෙලාවේ ගෝඨාභය මහත්තයා අපි තමුන්නාන්සේලාගේ ජීවිත ආරක්ෂා කරන්න පෙරමුණ ගත්තා.ගෙවල්වල නිරෝධායන මධ්‍යස්ථාන ඇති කළා.අපිට කන්න බොන්න දුන්නා ගෙවල්වල මිනිස්සුන්ට රු.10,000ක් දුන්නා.ගමේ පාසලට, පන්සලට එන්නත ගෙනල්ලා ගමේ මිනිස්සුන්ට ලබා දුන්නා.කෙලින්ම මේකා හොරා මංකොල්ල කාරයා මිනී මරුවා කියලා කියන්න කලින් අපි තමුන්නාන්සේලා වුට්ටක් අතීතය ගැන ස්වයං විවේචනයක් කරගන්න.අපි මේ පක්ෂයේ මැරෙනකන් ඉන්නවා, ප්‍රතිපත්ති රකිනවා කියන ඒවා මගේ ළඟ නෑ.අපි කාලය අනුව වෙනස් වෙන්න ඕන.මම වෙනස් වුණා කියලා කිරිල්ලවල ජනතාව හතර වතාවක්ම එන්න එන්න වැඩි ඡන්ද ගෙනල්ලා මාව පත් කරලා එව්වා මිසක් මාව අයින් කළේ නෑ.ඒ නිසා මම කියනවා තමුන්නාන්සේලා සියලු දෙනාටම මේ මැතිවරණය දිනලා එන්න

පුළුවන්.ඒ සඳහා වාසනාව, ශක්තිය ධෛර්ය ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා.මට දැවැන්ත ශක්තියක් ලබා දුන් උප සභාපතිතුමා, මේ සියලු මන්ත්‍රීවරු වගේම වර්තමාන මගේ නායකතුමා මහර ආසනයේ ප්‍රධාන සංවිධායකතුමා අපේ පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් විතාන මැතිතුමා මේ මහර ප්‍රාදේශීය සභාවේ කටයුතු කරගෙන යන්න මට දැවැන්ත ශක්තියක් ලබා දෙනවා.අපේ දිස්ත්‍රික් නායකතුමා සහන් ප්‍රදීප් විතාන මැතිතුමා අපේ පක්ෂයේ නායකතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ සියලු දේටම උදවු උපකාර කරනවා වගේම රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැවැන්ත කාර්යභාරයක් මේ වෙලාවේ ඉෂ්ට සිද්ද කරනවා.බෑ බෑ කියලා මේක ප්‍රතික්ෂේප කරපු වෙලාවේ පුටුව භාර අරගෙන ඒ තනතුර අරගෙන අද වෙනකොට යම් තරමකට තෙල් පෝලිම්, ගෑස් පෝලිම් සමනයකට පත් කරලා අද වෙනකොට රටට ඩොලර් ලබා ගැනීමේ වැඩසටහන් පුළුවල් කරමින් කටයුතු කරන වෙලාවක එතුමාගේ සේවාව අගයන්න ඕන.පහුගිය දවස්වල තිබුණ ගැටලු ප්‍රශ්නත් එක්ක එතුමා මේ රට වෙනුවෙන් ගත්ත ලොකු තීන්දුවක්.එතුමා භය නැතුව තීන්දුවක් ගත්ත නිසා තමයි අද අපි තමුන්නාන්සේලා මැතිවරණයකට යන්නත් මේ වගේ රැස්වෙලා කතා කරන්නත් පුළුවන්කම ලැබුණේ.යම් කිසි සුළු පිරිසක් නීතිය අතට අරගෙන කරපු දේවල් තමුන්නාන්සේලා දකින්න ඇති.ඕවා ගැන අපි කරලා ජනතාවට වෛර කරලාවත් බැනලාවත් වැඩක් නෑ.අපි තමුන්නාන්සේලා එකතු වෙලා කරපු වැඩ ටික අපි කියමු.අද අපි මෙතන සහෝදරයෝ වගේ කතා වෙන් වෙලා යනවා වගේම එළියේදිත් අපි එකතු වෙලා කතා කරනවා.අපි මැතිවරණය වෙලාවේදී අපි බෙදිලා කටයුතු කරමු.ඊට පස්සේ අපි හිත්වල තියෙන කහට අයින් කරලා අපි එකට එකතු වෙලා රාජකාරී කටයුතු කරමු.ඒ ඉල්ලීමත් කරමින් අද දවසේ සභාවේ කටයුතු කරගෙන යාමට මට සහයෝගය ලබා දුන් උප සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්, හරි දේ හරියට ලියමින් මට අවුරුදු විසි එකක් තිස්සේ මට දැවැන්ත ශක්තියක් ලබා දුන් අපේ මාධ්‍යවේදී මහත්තුරු ඇතුළු සියලු දෙනාටම මගේ ගෞරවය ස්තුතිය පුද කරනවා. ඒ වගේම කියන්න ඕන අපේ ගයාන් මන්ත්‍රීතුමා අවුරුදු ගානක් ප්‍රාදේශීය සභාවේ අපිත් සමඟ කටයුතු කළා.දැන් එතුමා විදේශගත වෙලා ඉන්නවා.මම හිතනවා එතුමා මෙතනින් එහාට මහර ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්නේ නැති වෙයි කියලා.අපි එතුමාගේ සේවයත් මේ අවස්ථාවේදී පැසසුමට ලක් කරනවා.මහර ප්‍රාදේශීය සභාව දෙවරක් හෝ තුන් වරක් නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක්.නිවාඩු ඉල්ලන ලෙසත් ඉල්ලීමක් කරමින් මහා සභාවේ කටයුතු අවසන් කරනවා.

- ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු ඉල්ලීම් වෙතොත් ගරු සභාවට ඉදිරිපත් කිරීම

එන්.අමිත් ශ්‍රියන්ත පෙරේරා මහතා හට පෞද්ගලික හේතුවක් මත සභා රැස්වීමට පැමිණිය නොහැකි බැවින්, එතුමන් හට නිවාඩු අනුමත කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.සී.සමන්කුල මහතා කළ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.පී.බී.මදුරප්පෙරුම මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ගයාන් සෙව්වන්ද සමරතුංග මහතා හට හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩී.නුවන් රංගන සෙනරත් මහතා හට පෞද්ගලික හේතුවක් මත සභා රැස්වීමට පැමිණිය නොහැකි බැවින්, එතුමන්ලා හට නිවාඩු අනුමත කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.හේමසිරි ඥානරතන මහතා කළ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කේ.ගාමිණී කරස්නාගොඩ මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.ඩබ්.ජේ.චාමිකා ධර්මප්‍රිය පෙරේරා මෙනවිය හට පෞද්ගලික හේතුවක් මත සභා රැස්වීමට පැමිණිය නොහැකි බැවින්, එතුමිය හට නිවාඩු අනුමත කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ.ඊවා ශ්‍රියානි මහත්මිය කළ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි අනුලා නිර්මලානි විලේගොඩ මහත්මියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සමන්ත ජයශාන්ත මහතා හට පෞද්ගලික හේතුවක් මත සභා රැස්වීමට පැමිණිය නොහැකි බැවින්, එතුමන් හට නිවාඩු අනුමත කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.රොහිණී ලලිතාංගනී මහත්මිය කළ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.ඒ.එල්.අංජලී වික්‍රමතුංග මහත්මියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ඩී.ප්‍රියන්ත උපුල් කුමාරසිරි මහතා හට පෞද්ගලික හේතුවක් මත සභා රැස්වීමට පැමිණිය නොහැකි බැවින්, එතුමිය හට නිවාඩු අනුමත කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.ඒ.හේමාලි සුජීවා මහත්මීය කළ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.මහින්ද මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

(ඒ) මෙදින ප.ව 02.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.



ඒ.ඒ. සුදීමා චාන්දනී,
සභාපති,
මහර ප්‍රාදේශීය සභාව.